# දෙසතිය

පුවත් සඟරාව

2024 මාර්තු



## ඇයට ශක්තිය දැයට ප්‍රගතිය

# සූර්යබලයට බලයක්

පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය කිරීමේ රජයේ වැඩසටහන යටතේ මෙගාවොට් 100ක (100MW) සූර්යබල ව්‍යාපෘතියක් මොනරාගල සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ඇරඹීමට සැලසුම් කර තිබේ. ඒ, ගොඩබිම සවි කරන සූර්යබල ව්‍යාපෘතියක් ලෙස ඇමරිකානු ඩොලර් මිලියන 132ක ආයෝජනයකිනි.

2024 පෙබරවාරි 08 දින මීට අදාළ අවබෝධතා ගිවිසුමට ලංකා විදුලිබල මණ්ඩලය හා රිවිධනවි (Rividhanavi) පුද්ගලික සමාගම අත්සන් තැබී ය. 2026 අප්‍රේල් මාසය වන විට මේ ව්‍යාපෘතිය අවසන් වීමට නියමිත අතර කිලෝමීටර් 27.5ක සම්ප්‍රේෂණ මාර්ගය ද ඉදිකර ලංකා විදුලිබලයට පැවැරීමට නියමිත ය.

දැනට මෙගාවොට් 20ක (20MW) ධාරිතාවක් ඇති තනි විශාලතම සූර්ය බලාගාරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මෙරට ප්‍රථම වාණිජ බලාගාරය වන එය 'බුරුතකන්ද සූර්ය උද්‍යානය' ලෙස ද හැඳින්වේ. ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතාවෙන් සූර්ය හා සුළං යන දෙඅංශයෙන් ම දැනට දායකත්වය ලැබෙන්නේ 5%කටත් වඩා අඩු ප්‍රතිශතයකිනි.

**ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය**



# දෙසතිය

පුවත් සඟරාව

**වෙළුම 46, කලාපය 03,**
**2024 මාර්තු**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදුහැරීමේ අංශය
දු. අ. 011 - 2514150



උපදේශක සංස්කාරක
**දිනිත් චින්තක කරුණාරත්න**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - සංස්කරණ අංශය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛකයන්
**රංගිකා අබේසේකර**

ප්‍රවෘත්ති නිලධාරි
**නිල්මිණී ප්‍රනාන්දු**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදුහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**


මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





21



15 තායි-ලංකා මිතුදම



03 රජරටට රන් දියවර



31 GFU රූපමය පෙළහර




12 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අභියෝගය



40 යොවුන් ක්‍රිකට් කිරුළ කැන්ගරුවන්ට

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

**දෙසතිය**

**දෙසතිය සඟරා දායකත්වය**

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය........................................ හා .................................... දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් "ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..............................................................................................

Address ..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

..............................................................................................

ID Number ..........................................Tel / Mobile ..........................................

Signature .......................................... Date..........................................

## ඇයට ශක්තිය දැයට ප්‍රගතිය

මේ වසරේ (2024) මාර්තු මස 08 දින ජාත්‍යන්තර කාන්තා දිනය සමරන්නේ "Invest in Women: Accelerate Progress" යන තේමාව අනුව වන අතර ශ්‍රී ලංකාව එය සමරන්නේ 'ඇයට ශක්තිය දැයට ප්‍රගතිය' යන තේමාවෙනි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2023 වසරේ ඇස්තමේන්තුගත දත්ත අනුව මෙරට කාන්තා ජනගහනය 52%ක් පමණ වේ. වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ගත් කල ජාතියේ දියුණුව ඇති වන්නේ කාන්තාව ශක්තිමත් වුවහොත් පමණි. එහිදී අපේක්ෂා කරන්නේ ආර්ථික හා සමාජීය වශයෙන් ඇය සුරක්ෂිත වීමයි. ආර්ථික, සමාජ, දේශපාලන යන සෑම ක්ෂේත්‍රයක ම පිරිමි පාර්ශ්වය හා උරෙනුර ගැටෙමින් ඇය රටේ ඉදිරි ගමනට ලබාදෙන මැදිහත්වීම කැපී පෙනේ. එහෙත් සමාජයේ බොහෝ විට කතාබහට ලක් වන්නේ දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය අවම වීම පිළිබඳ ව ය. මේ නිසා ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය නිර්දේශ කර තිබෙන 'දේශපාලන පමණක් නොව පෞද්ගලික අංශය, කොමිෂන් සභා, අධිකාරී වැනි සියලු ම තීන්දු ගන්නා ආයතනවලින් 1/3ක් කාන්තාවන් පත් කළ යුතුයි' යන්න සාධනීය තත්ත්වයක් ලෙස අගය කළ හැකි ය. ඒ, කාන්තාවන් ඉටු කරන කාර්යභාරයට නිල වටිනාකමන් එයින් ලැබෙන බැවිනි.

ජීව විද්‍යාත්මක වශයෙන් කාන්තාව දුෂ්කරතා සහ අභියෝග රැසක් මධ්‍යයේ වුව ද තම යුතුකම හා වගකීම සමාජය වෙනුවෙන් ඉටු කරන බව නොරහසකි. එහෙත් ආගමික හා සංස්කෘතික වශයෙන් ගත් විට 'කාන්තාව' පිළිබඳ පවතින සාම්ප්‍රදායික චින්තනය සමාජයෙන් බැහැර කිරීමට නොහැකි වී ඇත. මේ නිසා ඇයට සමාජයේ ඉදිරිගාමී පියවරක් තැබීමට පවා එය බාධාකාරී සාධකයක් වී ඇත. විශේෂයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති තනතුරට පත් වීම කාන්තා නිලධාරිනියකට අහිමි වී ඇත්තේ ඇය උගත්කමින්, දැනුමෙන්, බුද්ධියෙන් පොහොසත් නොවූ නිසා නොව සමාජයේ කාන්තාව පිළිබඳ පවතින මතිමතාන්තර හා වැඩවසම් චින්තනය නිසා ය.

මෙයින් පෙනෙන්නේ තාක්ෂණය, විද්‍යාව අතින් ලෝකය දියුණු වී, කාන්තා, පිරිමි භේදයකින් තොර ව ඔවුන් සඳතරණය දක්වා ගමන් කළත් අතීතයේ සිට පැවත එන සංස්කෘතිය, සම්ප්‍රදාය, චින්තනය කිසි විටෙකත් යටපත් කිරීම හෝ බැහැර කිරීම හෝ අපහසු කාර්යයක් වන බව ය. පරම්පරාවෙන් පරම්පරාවට සමාජගත වී ඇති කාන්තාව පිළිබඳ එම දෘෂ්ටිවාදය සමාජයේ තවදුරටත් පවතිනතාක් කල් ඇයගේ ඉදිරි ගමනට එය බාධකයක් වනු ඇත.

මේ නිසා විය යුත්තේ රටක් ලෙස සංවර්ධනය කරා යන ගමනේදී ඇයට සමාජයේ හිමි තැන විචක්ෂණශීලී ව විමසා බලා හිමි කර දීම ය. ඇය සතු හැකියාවෙන් නිසි ඵල නෙළා ගැනීම ය. ඇයට ශක්තිය දුන් ප්‍රමාණයට ඇයගෙන් දැයට ප්‍රගතිය අත්වනු ඇත.

\- සංස්කාරක -

# රජරටට රන් දියවර

**චන්දන මාරසිංහ**

'අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ' පළමු අදියර නොබෝදා (2024 පෙබරවාරි 15) ජනතා අයිතියට පත්විය. ඒ, ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙනි. එම අවස්ථාවට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) සභාපති ටනකා අකිහිකෝ මහතා ඇතුළු ජපාන නියෝජිතයන්, ශ්‍රී ලංකාවේ ජපාන තානාපති මිසුකොෂි හිදෙයකි මහතා, උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා, මැති ඇමතිවරු, ආයතන ප්‍රධානීන් ඇතුළු නිලධාරීහු සහභාගි වූහ.

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ මූල්‍ය සහයෝගිතාව මත ජල සම්පාදන හා වතු යටතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් රුපියල් මිලියන 11,515ක වියදමින් ව්‍යාපෘතිය ක්‍රියාවට දන්වා තිබේ. මේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන්නේ 2013 වසරේදී ය. මෙහි පළමු අදියර ක්‍රියාත්මක වන්නේ අනුරාධපුර මහකනදරාව වැව ප්‍රධාන කරගනිමිනි. ඒ යටතේ රබෑව සහ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම සේවා වසම් 75ක පවුල් 25,000ක පමණ පානීය ජල අවශ්‍යතා සපුරාලීමට හැකි වනු ඇත. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ දෙවැනි අදියර යටතේ කැබිතිගොල්ලෑව, හොහොරොව්පතාන, පදවිය හා කහටගස්දිගිලිය පවුල් 55,000කට පමණ පානීය ජලය ලබාදීමේ හැකියාව පවතී.

දීර්ඝකාලීන ව වකුගඩු රෝගයෙන් පීඩා විඳින මැදවච්චිය, පදවිය, කැබිතිගොල්ලෑව, හොරොව්පතාන සහ කහටගස්දිගලිය යන ප්‍රදේශවල ජනතාවගේ පිරිසිදු පානීය ජල අයිතිය සුරක්ෂිත කිරීම මේ ව්‍යාපෘතියේ අරමුණ වී ඇත. වකුගඩු රෝගය ව්‍යාප්ත වීමට බලපාන සාධක අතර ජලය පවතින බවට ද අනුමාන කළ හැකි සාධක ඇති බව දකුණු ආසියාතික තිරසර ජල සම්පත් කළමනාකරණය පිළිබඳ යුනෙස්කෝ ආයතනයේ සභාපති, මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මහාචාර්ය ලලිත් රාජපක්ෂ සඳහන් කරයි. වියළි කලාපයට මාස 3-4ක් පමණ වර්ෂාව ලැබෙන අතර පොළොව මතුපිට හෝ වගා බිම්වලට එකතු කරන කෘමි නාශක හා රසායනික පොහොර ආදිය එම වර්ෂාව සමග ගංගා හෝ භූගත ජලයට හෝ එක්විය හැකි ය. මුලදී පැවති උපකල්පනය වූයේ වකුගඩු රෝගයට ජල දූෂණයත් හේතුවක් වන බවකි.

බොහෝ විට මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එහි අවශ්‍යතාව පිළිබඳ ව ද නොසලකමින් ඇතැම්හු බිය පළ කරති. එහෙත් ජනාධිපතිවරයා සඳහන්



ව්‍යාපෘතිය ජනාධිපතිගේ නිරීක්ෂණයට






ඵලකය නිරාවරණය කරමින්

කළේ පානීය ජල අවශ්‍යතාවට මෙන් ම කෘෂිකර්මාන්තයට ද මේ ඔස්සේ විසඳුම් ලැබෙන නිසා ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රදේශයේ කෘෂිකර්ම කටයුතු සඳහා කිසිදු හානියක් නොවන බව ය. ඔහු සඳහන් කරන පරිදි මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය ද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට රජයේ අවධානය යොමු ව තිබීම ජල අවශ්‍යතාව සපුරා ගැනීමේදී එම ප්‍රදේශයේ ජනතාවට ඉමහත් අස්වැසිල්ලක් වනු ඇත.

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මහතා පවසන්නේ 2023 වසරේ පමණක් ජල සබඳතා 103,000ක් ලබාදීමට රජයට හැකි වී තිබෙන බව සහ 2024 වසර අවසානය වන විට එය ලක්ෂ 02ක් දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වන බව ය. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ දායකත්වය ද එහිදී වැදගත් වේ.

හේතු කිහිපයක් මත ජල සම්පාදන ව්‍යාපෘති රටකට අවශ්‍ය වන බව මහාචාර්ය ලලිත් රාජපක්ෂ ප්‍රකාශ කරයි. මුල්කාලීන ව ජලය පිළිබඳ ව පැවැති මතය වූයේ එය අවශ්‍ය තරම් පවතින බව ය. එහෙත් ජනගහනය වැඩිවීම හා දේශගුණ විපර්යාස හේතුවෙන් ජල ප්‍රමාණය අඩුවී තිබේ. පරිභෝජනය, කර්මාන්ත හා කෘෂිකර්මාන්තය සඳහා යොදා ගැනීම වැනි පුද්ගල අවශ්‍යතා වැඩි වීම ඊට හේතු වී ඇත.

පොළොව මතුපිට පවතින ජලය මෙන් ම අභ්‍යන්තර භූගත ජලය ද මේ සඳහා උපයෝගි කර ගැනේ. ජලය දූෂණය වීම අවධානයට ගත යුතු කාරණයකි. දැනුවත් ව හෝ නොදැනුවත් ව භාවිත කළ හැකි විවිධ කාරණා හේතුවෙන් සීමිත ජලයෙන් කොටසක් අපද්‍රව්‍ය නිසා භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වෙයි. උදාහරණ ලෙස අපද්‍රව්‍ය ජලයට මුසුකරන ස්ථාන දහස් ගණනක් පවතින බව කැලණි ගංගා ද්‍රෝණිය පිළිබඳ කළ අධ්‍යයනයකින් හෙළි වී ඇත. මෙවැනි කාරණා හේතුවෙන් පරිභෝජනයට සුදුසු පරිදි ජලය සැපයීමට ජල සම්පාදන ව්‍යාපෘතිවල අවශ්‍යතාව පවතී.

අතීතයේදී ජල සම්පාදනයේ ප්‍රධාන අවශ්‍යතා වූයේ කෘෂිකර්මාන්තයයි. පැරණි ජලාශවලින් සිදුවූයේ පහළින් පිහිටි ස්ථානවලට ජලය සැපයීම වුවත් ජලාශවලට ඉහළින් ජනාවාස බිහි වී ඇති නිසා එම ජනාවාසවලට ජලය සැපයීම අපහසු ය. කෘෂිකාර්මික ජීවන රටාවට අමතර ව කාර්මික අවශ්‍යතා වෙනුවෙන් ද ජලය ලබා දිය යුතු වේ. මෙවැනි කාරණා සඳහා ජල සම්පාදන ව්‍යාපෘති අවශ්‍ය බව මහාචාර්යවරයා සඳහන් කරයි.

ජල සම්පාදනයේදී ඒවා අපිරිසිදු නොවන ආකාරයෙන් සිදු කිරීමේ අවශ්‍යතාව ඔහු අවධාරණය කරන්නේ විශේෂයෙන් පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනීමේදී ය. එහිදී අනුගමනය කළ යුතු විවිධ ක්‍රියාමාර්ග පවතී. ජල ව්‍යාපෘතියක් සැලසුම් කරන්නේ යම් වර්ෂාපතනයක් අපේක්ෂාවෙනි. කාලගුණ විපර්යාස සමග ඇතැම් විට වර්ෂාපතනය අඩුවිය හැකි ය. එහෙත් ජල අවශ්‍යතාව අඛණ්ඩ ව පවතී. වර්ෂාව අඩුවුවහොත් වන්නේ හොඳින් ජලය කළමනාකරණය කළ යුතු වීමයි. භූගත ජලය සම්බන්ධයෙන් මෑතකාලය වන තුරු ම ප්‍රතිපත්තියක් නොතිබූ බව සඳහන් කරන මහාචාර්යවරයා පවසන්නේ ජල සම්පත් මණ්ඩලය (Water Resources Board) ඊට අදාළ පියවර ගෙන ඇති බව සහ ජලය පිළිබඳ පනතක් ද සම්මත කර ඇති බව ය.

අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ භූගත ජලය භාවිත වන්නේ අඩුවෙනි. වර්තමානයේ වියළි කලාපයේ පවා කර්මාන්ත පිහිටුවා ඇත. ඒ අනුව ජලය භාවිතය ගැන දත්ත එකතුකර ඒවා විශ්ලේෂණය කළ යුතු බව මහාචාර්යවරයා සඳහන් කරයි. මේ වන විට කර්මාන්ත සඳහා මහා පරිමාණයෙන් ජලය යොදා ගැනීමේදී ඒ පිළිබඳ දත්ත එකතු කිරීම ආරම්භ කර ඇත.

ජල සම්පාදන ව්‍යාපෘතිවලදී අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ ජල කළමනාකරණයට අමතර ව ගංගා ද්‍රෝණි කළමනාකරණය පිළිබඳ ව ය. ඒ සඳහා පවතින්නේ අඩු අවධානයකි. ගංගා ද්‍රෝණිවල ජල සම්පත ආරක්ෂා වන්නේ පෝෂක ප්‍රදේශවල ය. මතුපිට ජලය එකතු වී ගංගාවල ගලා යාම සහ භූගත ජලය ලෙස අභ්‍යන්තර ස්ථරවලට ජලය කාන්දු වන්නේ එවැනි ස්ථානවලිනි. මෑතකාලීන ව වනාන්තර එළි කර පොළොව මතුපිට ජලය උරා ගැනීමේ හැකියාව අඩු වන ලෙස විවිධ ව්‍යාපෘති මෙන් ම නිවාස ආදිය ඉදි කර ඇත. එය භූගත ව ජලය එකතුවීමට අපහසු තත්ත්වයකි. වර්ෂාව නොමැති කාලයට ගංගාවල ඇත්තේ භූගත ජලයයි. පෝෂක ප්‍රදේශ විනාශ වූ විට භූගත ජලය එකතු නොවන නිසා කඩිනමින් ගංගා සිඳී යාමට එය හේතු විය හැකි ය. ජල සම්පාදන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පරිදි ජලය නොලැබීමට ද එය බලපානු ඇත. මේ නිසා ජල සම්පාදන ව්‍යාපෘති රටට අවශ්‍ය වන අතර ම ඒවා ඉදි කිරීමේදී මෙවැනි කාරණා පිළිබඳ ව ද සැලකිලිමත් විය යුතු ය.

# රේල්ලුවෙන් උතුරට

**රංගිකා අබේසේකර**




මහව සිට ඕමන්ත දක්වා උතුරු දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන මහව සිට අනුරාධපුර දක්වා දුම්රිය මාර්ග යේ පුනරුත්ථාපන කටයුතු ප්‍රවාහන, මහාමාර්ග හා ජනමාධ්‍ය අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ඇතුළු ආරාධිත අමුත්තන්ගේ සහභාගිත්වයෙන් ගල්ගමුව දුම්රිය ස්ථාන පරිශ්‍රයේදී 2024 ජනවාරි 08 දින ඇරඹිණි.

ඉංජිනේරු කාර්ය පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ උපදේශක සේවාව යටතේ ඉන්දියානු ඉර්කොන් ජාත්‍යන්තර සමාගමේ මූලිකත්වයෙන් (Ircon International Limited) සිදු වන මේ ඉදිකිරීම් කාර්යයේදී මහව සිට ඕමන්ත දක්වා කිලෝමීටර 128ක දුම්රිය මාර්ගය පූර්ණ ප්‍රතිසංස්කරණයට ලක්කිරීමට නියමිත ය. ගිවිසුම් වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 91.27ක් වන මේ ව්‍යාපෘතියේ සමස්ත ඉදිකිරීම් 2024 ජූලි මස 06 දින අවසන් කිරීමට නියමිත වුවත් අමාත්‍යවරයාගේ විශේෂ ඉල්ලීම පරිදි පොසොන් පොහොය නිමිති කරගනිමින් ජූනි මස 15 දින වැඩ අවසන් කර දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාර දීමට ඉන්දියානු ඉර්කොන් ජාත්‍යන්තර සමාගම එකඟතාව පළ කර තිබේ.

උතුරු දුම්රිය මාර්ගය ඉදි කිරීම ආරම්භ වන්නේ 1905 වසරේදී වුවත් මෙරටට දුම්රිය සේවාව හඳුන්වා දී ඇත්තේ 1864 වසරේදී කෝපි ප්‍රවාහනය කිරීම සඳහා ය. වර්තමානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය මගීන් ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහනය යන සේවා ද්විත්වය ම ඉටු කරයි. එයින් නඩත්තු වන සමස්ත දුම්රිය මාර්ගයේ දුර කිලෝමීටර 1561කි. දළ වශයෙන් දෛනික ව මගීන් මිලියන 3.72කට සේවය සැපයීමට ඊට හැකියාව ලැබී ඇත. එම අවශ්‍යතාව මත පදනම් වෙමින් වඩාත් කාර්යක්ෂම සේවාවක් සඳහා මෑත කාලයේ වැඩි ම ආයෝජනයක් සිදුකර තිබෙන්නේ උතුරු දුම්රිය මාර්ග ව්‍යාපෘතියටයි.



පුනරුත්ථාපන ව්‍යාපෘතිය ආරම්භය සනිටුහන් කරමින්

මේ ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ දුම්රිය ධාවන වේගය පැයට කිලෝමීටර් සියයකින් සහ පැය පහහමාරක් වැනි කාලයකින් කොළඹ සිට යාපනය දක්වා සුව පහසු දුම්රිය සේවයක් ජනතාවට ළඟා කරවීමයි. මේ පිළිබඳ අදහස් දක්වන දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී එච්. එම්. කේ. ඩබ්ලිව් බණ්ඩාර; "මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් කිරීම මේ ව්‍යාපෘතියෙන් සිදුකෙරෙනවා. එය ක්‍රියාත්මක වන්නේ අදියර දෙකක් යටතේ. ඉන් පළමු ව දෙවැනි අදියර යටතේ අනුරාධපුර සිට ඕමන්ත දක්වා කිලෝමීටර 64ක මාර්ග කොටස මාස 5කින් නිම කර තිබෙනවා. එහි පළමු අදියර ලෙස මහව සිට අනුරාධපුරය දක්වා කිලෝමීටර 64ක මාර්ග කොටස මාස 6කින් ප්‍රතිසංස්කරණය කර අවසන් කිරීමට 2024 වසරේ ජනවාරි 7 දින වැඩ ආරම්භ කළා. පෙර තිබූ කිලෝග්‍රෑම් 45ක රේල්පීල්ල ඉවත්කර කිලෝග්‍රෑම් 60ක රේල්පීලි යොදා සැකසීම මෙහිදී සිදු වනවා. මීට පෙර මහව සිට ඕමන්ත කොටසේ පැයට කිලෝමීටර් 40ත් 60ත් වේගසීමා යටතේ දුම්රිය ධාවනය කළේ දුම්රිය මාර්ගය ඉතා දුර්වල වීම නිසා. මේ ප්‍රතිසංස්කරණය සමග වසර 50ක් ඉදිරියට දුම්රිය මාර්ගය කාර්යක්ෂම ව භාවිත කරන්නට අපට හැකි වේවි." නව දුම්රිය මාර්ගය නිර්මාණය කර ඇත්තේ පැයට කිලෝමීටර 120ක වේගයකිනි.

මහව සිට අනුරාධපුරය දක්වා දුම්රිය මාර්ගයේ යාන්ත්‍රික සංඥා පද්ධතිය, වර්ණ සංඥා පද්ධතියක් බවට පත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

එහිදී වැඩි දුම්රිය සංඛ්‍යාවක් ධාවනයට එක් කිරීමට, දුම්රිය හුවමාරුවීම් ඉතා කාර්යක්ෂම කිරීමට, පරිගණක සංඥා ආරක්ෂක පද්ධතියක් සඳහා යොමු වීමට අපේක්ෂා කරන බවත් දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා ප්‍රකාශ කරයි.

ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ විශාල පිරිවැයක් දරමින් සිදුකරන මේ ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් අනතුරු ව භාණ්ඩ සහ මගී ප්‍රවාහනයටත් සංචාරක ව්‍යාපාරයටත් උචිත ආකාරයෙන් මිල ප්‍රතිපත්තියක් යටතේ ගාස්තු ක්‍රමයක් ඇති කිරීම රජයේ අරමුණකි. එය සාර්ථක කර ගැනීම සඳහා යාපනය වෙළෙඳ සංගමය සමග එකගතාවෙන් කොළඹ හා යාපනය අතර භාණ්ඩ ප්‍රවාහන සේවා ආරම්භ කිරීම, තිරිගුපිටි ප්‍රවාහනය, සංචාරක ව්‍යාපාරයට පහසුකම් සැපයීම වැනි ක්‍රියාවලියකින් විදේශ විනිමය ඉපැයීමට නව මාර්ග වෙත යොමු වීමෙන් පවතින ආර්ථික අර්බුදයට නිර්මාණශීලී විසඳුමක් ලබා දීමට අවකාශය හිමිවනු ඇති බව එච්. එම්. කේ. ඩබ්ලිව් බණ්ඩාර ප්‍රකාශ කළේ ය.

ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු සතියකට දින 2ක් යාපනය හා කොළඹ අතර භාණ්ඩ ප්‍රවාහනය සඳහා විශේෂ දුම්රියක් යෙදවීමටත් නව ආකාරයේ සංචාරක දුම්රිය සේවා කිහිපයක් ආරම්භ කිරීමටත් ආරක්ෂිත වැට නොමැති, සංඥා පුවරු පමණක් සවිකර ඇති හරස් මාර්ග සඳහා වඩාත් ආරක්ෂිත වැටි ලබාදීමේ වැඩපිළිවෙළක් ද ප්‍රවාහන, මහා මාර්ග හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අනතුරු වැළැක්වීමේ ජාතික අධිකාරිය, රාජ්‍ය සංවර්ධන සහ නිර්මාණ නීතිගත සංස්ථාව ඒකාබද්ධ ව ක්‍රියාත්මක කිරීමට නියමිත ය. උතුරු දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී එහි පදිංචි ජනතාව ඉවත් කිරීමේ කාර්යය සහ ඉතා කෙටි කාලයකින් දුම්රිය මාර්ගය වසා දමා වැඩ ආරම්භ කිරීමට සිදුවීම ව්‍යාපෘතියට එල්ල වූ අභියෝගයකි.

උතුරු දුම්රිය මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය හා අනෙකුත් ව්‍යාපෘති සඳහා ලබාගත් ණය සම්බන්ධයෙන් සහ ඒවා පියවීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන පියවර පිළිබඳ ව පැහැදිලි කරන දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා; "ඉන්දීය ණය යෝජනා ක්‍රමයෙන් ලබාගත් ණය පියවීමට වාණිජ සංවර්ධන සැලැස්මක් සකස් කළා. 2023 වසරේ ආදායම බිලියන 14.4ක්. ඊට සාපේක්ෂ ව 2024 වසරේ බිලියන 6කින් ආදායම් ඉහළ නැංවීමයි අපේක්ෂාව. වියදම් උපරිමයෙන් අඩුකිරීමටත් ලබාගන්නා ආදායම මනා කළමනාකාරිත්වයකින් හැසිරවීමටත් දෙපාර්තමේන්තුව උත්සාහ දරනවා. ඒ අනුව 2023 වසරේ බිලියන 39ක් වූ වියදම 2024 වසරේ බිලියන 36ක් දක්වා අඩු කිරීමයි සැලැස්ම. මේ සඳහා උපරිමයෙන් වාණිජ සංවර්ධන ව්‍යාපෘති ගෙන ඒමට අපේක්ෂා කරනවා."

මේ ව්‍යාපෘතියට අමතර ව ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ම ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව දුම්රිය සාමාන්‍යාධිකාරිවරයා ප්‍රකාශ කරයි. එම ව්‍යාපෘති අතර පයාගල දකුණ දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා ඩොලර් මිලියන 39ක්, මහව කුරුණෑගල හා පොල්ගහවෙල කුරුණෑගල අතර ද්විත්ව මාර්ග ඇති කිරීම සඳහා ඩොලර් මිලියන 50ක් යෙදවීමට අපේක්ෂා කරන අතර ත්‍රිකුණාමලය මාර්ගය නැවත පූර්ණ ප්‍රතිසංස්කරණයකට ලක් කිරීමටත් අවධානය යොමු කර තිබේ.

වැඩි ම ජන ඝනත්වයක් සහිත රටවල් අතර ශ්‍රී ලංකාව ඇත්තේ 38 වැනි ස්ථානයේ ය. ජන ඝනත්වය වැඩිවත් ම සාර්ථක ම ප්‍රවාහන ක්‍රමය වන්නේ පොදු ප්‍රවාහනයයි. මෙරට ජනඝනත්වයට සාපේක්ෂ ව අවම වශයෙන් 50%ක් පොදු ප්‍රවාහනය භාවිත කළ යුතු වේ. එහෙත් මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන කළමනාකරණ හා කාර්ය උපාය ඉංජිනේරු අධ්‍යයන අංශයේ සම්මානිත මහාචාර්ය අමල් එස්. කුමාරගේ පවසන්නේ 1980 ගණන්වල පොදු ප්‍රවාහන භාවිතය 80%ක් වුවත් වර්තමානයේ එය 40%ක් බවට පත් ව ඇති බව ය. පෞද්ගලික වාහන භාවිතයත් සමග බොහෝ දෙනා එය පෞද්ගලික සංවර්ධනයේ සලකුණක් ලෙස දුටුවත් එය ප්‍රවාහන ප්‍රතිපත්තිය විකෘති කිරීමක් මිස මෙරට තවමත් තිරසර ප්‍රවාහන විසඳුම් දක්නට නොමැති බව ඔහු පවසයි.

මේ නිසා විශේෂයෙන් තිරසර ප්‍රවාහන ප්‍රතිපත්තියක් ඇති කිරීම වැදගත් වේ. එහිදී පොදු ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවය දියුණු කිරීම සහ නවීකරණය අතිශයින් ඵලදායී වේ. මහාචාර්ය අමල් එස්. කුමාරගේ පවසන ආකාරයට එම කාර්යයේදී පැරණි ව්‍යාපෘති ක්‍රියාවලියෙන් ඉවත් වීම කාලීන අවශ්‍යතාවකි. ඉන්දියාවේ වැඩි ප්‍රතිලාභ සහිත ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කරන්නේ විද්‍යාත්මක, ආර්ථික ක්‍රමවේද අනුගමනය කරමිනි. මහාචාර්යවරයා පවසන්නේ ව්‍යාපෘති වියදම් ගණනය කළත් ව්‍යාපෘතියේ කාලය, ව්‍යාපෘති ප්‍රමුඛතාව සහ ඒවාහි ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රායෝගික ව නොසිතීම කෙරෙහි ශ්‍රී ලංකාව වැඩි අවධානය යොමු කළ යුතු බව ය. එවිට පොදු ප්‍රවාහන සේවය නගා සිටුවීමට ගන්නා මෙවැනි ක්‍රියාමාර්ග තිරසර ප්‍රවාහන ප්‍රතිපත්තියක් ඇති කිරීමට දයක වනු ඇත.





# වගා බිමේ තාක්ෂණික පිම්ම

**වයාපෘතිය හේතුවෙන් ගොවියන්ගේ කාලය ඉතුරු වීම, ගොවියන්ගේ ශරීර සෞඛ්‍යයට සිදුවන හානිය අවම වීම, පරිසර දූෂණය අවම වීම, කෘෂි රසායනික දැමීමේදී සිදුවන නාස්තිය අවම වන නිසා ඒ සඳහා යෙදීමට අවශ්‍යවන පිරිවැය අඩුවීම සහ ශ්‍රමය සඳහා ගෙවීමට අවශ්‍ය මුදල අඩුවීම, නිෂ්පාදන පිරිවැය අඩුවීම වැනි ප්‍රතිලාභ රැසක් අත්වේ.**

**සමේලා රාජපක්ෂ**



ඩ්‍රෝන යාත්‍රා 100ක් ශ්‍රී ලංකාවට ලැබුණු මොහොත

කෘෂිකර්මාන්තය සඳහා නවීන තාක්ෂණ භාවිතය බොහෝ කලක සිට කතිකා වන්නකි. එහි එක් පියවරක් ලෙස මෙවර යල කන්නයේදී වී වගාව සඳහා ඩ්‍රෝන යන්ත්‍ර උපයෝගි කරගැනීමේ වැඩසටහන පළමුවරට ආරම්භ කිරීමට නියමිත ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කෘෂි ආංශික නිපුණතා සභාවේ සභාපති කවින්ද දිසානායක සඳහන් කරන්නේ කෘෂිකර්මාන්ත අංශයෙන් ලෝකය සමග ඉදිරියට යාමට නම් කෘෂිකර්මාන්තයේ තිබෙන තාක්ෂණික පරතරය (Technology Gap) හඳුනාගෙන ඒ අනුව එය ලෝකය සමග ගළපාගත යුතු බව ය. අදහස් දක්වන ඔහු; ''කෘෂිකර්මාන්තය සතු ශ්‍රම බලකාය බොහෝ වයස්ගතයි. අලුතින් කෘෂිකර්මාන්තයට ශ්‍රම බලකාය එක් වන්නේත් අඩුවෙන්. නමුත් නව තාක්ෂණය කෘෂිකර්මාන්තයට ගෙනැවිත් තරුණ තරුණියන්ට තාක්ෂණික නිපුණතාව ලබා දුන්නොත් වඩාත් ඵලදායී ලෙස ඔවුන් කෘෂිකර්මාන්තයට දායක කර ගන්නට පුළුවන්.”

නව තාක්ෂණය කෙසේ ගෙන ආ යුතු ද යන්නත් වර්තමානයේ පවතින ජාතික නිපුණතා ප්‍රමිති (National Competency Standards) යාවත්කාලීන කරන්නේ කෙසේ ද? යන්නත් සලකා බැලීමේදී නව තාක්ෂණය බිම්ගත කරන්නේ කෙසේද? යන ගැටලුව මතු වූ බවත් සභාපතිවරයා සඳහන් කළේ ය. මේ සඳහා කෘෂි ආංශික නිපුණතා සභාව කෘෂි තාක්ෂණික ව්‍යාප්ති මධ්‍යස්ථානයක් (Agro Tech Dissamination Centre) පිහිටුවා එමගින් කෘෂි තාක්ෂණ දැනුම බිම්ගත කිරීමට අවශ්‍ය දැනුම ලබාදීමේ පාඨමාලා ආරම්භ කර තිබේ. මෙහි මූලික කාර්යයක් ලෙස ඩ්‍රෝන නියමු (Drone Pilot) පාඨමාලාව 2023 ජූනි මාසයේ එළිදැක්විණි. එහිදී විශාල කාර්යභාරයක් ඉටු කරන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන (Skill Sector Development Program), ආසියානු සංවර්ධන බැංකුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ය. මේ ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයතනවල සහයෝග ද ලැබී තිබේ.

එහි පළමු පියවර ලෙස වී වගාව සිදුකෙරෙන සෑම දිස්ත්‍රික්කයකට ම ගොවිජන සේවා මධ්‍යස්ථානය පෞද්ගලික අංශය ද සමග එක් ව

ඩ්‍රෝන යාත්‍රා ලබාදීමේ වැඩපිළිවෙළක් අරඹා ඇත. මෙහි පළමු අදියර යටතේ ඩ්‍රෝන යන්ත්‍ර 100ක් ලබා දෙන්නේ හෙක්ටයාර 3000කට වඩා වැඩි ප්‍රමාණයක් ඇති අනුරාධපුරය, පොළොන්නරුව, හම්බන්තොට, කුරුණෑගල, වවුනියාව, අම්පාර යන දිස්ත්‍රික්ක ඇතුළත් ව වී වගාව කෙරෙන සියලු දිස්ත්‍රික්ක සඳහා මිලියන 250ක පමණ පිරිවැයක් දරමිනි. සභාපති කවින්ද දිසානායක පවසන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ රුපියල් මිලියන 40ක පමණ ප්‍රාග්ධනයක් කෘෂි තාක්ෂණික ව්‍යාප්ති මධ්‍යස්ථානය (Agro Tech Dissamination Centre) පිහිටුවීම සඳහා ලබා දුන් බව ය.

නවීන කෘෂිකර්මාන්තය (Modern Agriculture) යන දැක්ම යටතේ මේ ව්‍යාපෘතියේ විකාශනය හා පරිමාව වැඩි කර ගැනීම සඳහා රජය පූර්ණ අනුග්‍රහය ලබා දෙයි. එහි දෙවැනි අදියර යටතේ වී වගා කරන සෑම දිස්ත්‍රික්කයක ම ගොවිජන සේවා මධ්‍යස්ථාන 563ට ඩ්‍රෝන සේවා ලබා දීමට පියවර ගෙන ඇත. යල කන්නයේ එනම්, අප්‍රේල් මස මුල්භාගය වන විට සම්පූර්ණයෙන් ම ගොවිජන සේවා මධ්‍යස්ථාන 100 ම ස්ථාපිත කර මේ සේවාව ලබා දීමට අපේක්ෂිත ය. මේ ව්‍යාපෘතිය හේතුවෙන් ගොවියන්ගේ කාලය ඉතුරු වීම, ගොවියන්ගේ ශරීර සෞඛ්‍යයට සිදුවන හානිය අවම වීම, පරිසර දූෂණය අවම වීම, කෘෂි රසායනික දැමීමේදී සිදුවන නාස්තිය අවම වන නිසා ඒ සඳහා යෙදීමට අවශ්‍යවන පිරිවැය අඩුවීම සහ ශ්‍රමය සඳහා ගෙවීමට අවශ්‍ය මුදල අඩුවීම, නිෂ්පාදන පිරිවැය අඩුවීම වැනි ප්‍රතිලාභ රැසක් අත්වේ.

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඒ. එච්. එම්. එල්. අභයරත්න ප්‍රකාශ කරන පරිදි, සාමාන්‍ය කුඹුරකට තෙල් ගැසීමට හෙක්ටයාරයකට රු. 6000ක් පමණ මුදලක් වැය වන අතර හෙක්ටයාරයකට තෙල් ගැසීමට වරුවක් පමණ ගත වේ. නමුත් ඩ්‍රෝන යාත්‍රා යොදා ගැනීමෙන් විනාඩි 15ක්-20ක් ඇතුළත හෙක්ටයාරයකට රුපියල් 2000-2500කට ආසන්න මුදලකින් තෙල් ගැසීමට හැකියාව ලැබේ. මේ නිසා ගොවියාට රුපියල් 4000ක පමණ ලාභයක් ලැබේ. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා; "සාම්ප්‍රදායික ක්‍රමයට වඩා ඩ්‍රෝනවලින් තෙල් ඉසින විට නිසි ප්‍රමාණයට, නිසි ආකාරයට ගොයමට වදින නිසා අවශ්‍ය ප්‍රමාණයට පමණයි තෙල් වැය වන්නේ. මෙහිදී නාස්තිය අවම වීම හේතුවෙන් යෙදීමට සිදුවන පිරිවැය ද අවම වනවා."

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඩ්‍රෝන ලබාදෙන නියෝජිත ආයතන සමග ගිවිසුමකට එළඹීමෙන් එම නියෝජිත ආයතනවල ඩ්‍රෝන යන්ත්‍ර කුලියට ගැනීම සඳහා එකඟතාව ලබාගෙන තිබේ. ඩ්‍රෝන යාත්‍රා සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව කිසිදු වියදමක් නොදරයි. ඩ්‍රෝන නියමුවන් ලෙස පුහුණු කර ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙත යොමු කරන්නේ අදාළ ග්‍රාමයේ



**කෘෂිකර්මාන්තයෙන් තරුණ ප්‍රජාව ඉවත් වෙමින් සිටින ප්‍රවණතාවක් දක්නට ලැබෙන වර්තමානයේ ඔවුන්ට නැවත කෘෂිකර්මාන්තය දෙස හැරී බලන්නට අවස්ථාවක් ඩ්‍රෝන තාක්ෂණය උදා කරන පසුබිමක් ගොඩ නැගෙමින් සැබවින් ම යහපත් තත්ත්වයකි.**

තෝරා ගන්නා තරුණ තරුණියන් ය. ඩ්‍රෝන නියමුවකු ලෙස සුදුසුකම් ලැබීමට නම්, එම පුද්ගලයා අ.පො.ස සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි භාෂාව සඳහා S සාමාර්ථයක් ලබා තිබිය යුතු අතර ජංගම දුරකතනයක් භාවිත කිරීමට තාක්ෂණික දැනුම තිබීම ප්‍රමාණවත් ය. වයස අවුරුදු 18ත්-30ත් අතර අයකු විය යුතුයි.

කෘමිනාශක, වල්නාශක, යූරියා වැනි පොහොර ඉසීම මෙන් ම වී ඉසීම ද සඳහා ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනීමට සැලසුම් කර තිබේ. ඩ්‍රෝන තාක්ෂණය යොද ගැනීම විද්‍යාත්මක පදනමකින් සිදු විය යුත්තකි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ භෝග විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය බුද්ධි මාරඹේ; "සමාජයේ අනිසි බලපෑම් හේතුවෙන් කෘෂිකර්මාන්තය සඳහා තාක්ෂණය යොදා ගැනීමට හැකි වී තිබෙන්නේ අවම වශයෙන් නැතහොත් බොහෝ සේ ප්‍රමාද වී. නියමාකාරයට රාජ්‍ය අනුග්‍රහය දක්වමින් ගොවියන් කරා යා යුතු තාක්ෂණයක් ඩ්‍රෝන තාක්ෂණය. ඩ්‍රෝන යාත්‍රා භාවිතයෙන් ක්ෂේත්‍රය පුරා ඒකාකාරී ව බීජ ඉසීමට, පොහොර යෙදීමට එනම්, පසේ තිබෙන පෝෂක ප්‍රමාණය නිසි ලෙස හඳුනාගෙන නිර්ණායක යටතේ අවශ්‍ය පොහොර ප්‍රමාණය ශාකයට යෙදීමෙන් අඩු වියදමකින් වැඩි අස්වැන්නට ලබා ගැනීමට හැකි වනවා. මේ නිසා පොහොර අපතේ යෑම අවම වනවා. ක්ෂේත්‍රයේ වල්පැළෑටි නොමැති නම් පලිබෝධ හානි වූ ශාක හඳුනාගෙන චන්ද්‍රිකා තාක්ෂණය ආශ්‍රයෙන් ඒ ස්ථාන ගැන නිර්ණය කර අවශ්‍ය ප්‍රමාණයට වල්නාශයක යෙදීම හෝ අනෙකුත් පලිබෝධ නාශක යේදීම කළ හැකියි. බිම් මට්ටමේ සිට පුද්ගලයකුට ළඟා විය නොහැකි ස්ථානවලට ළඟා වීමට, සතුන්ගේ චලනය නිරීක්ෂණයට, විශාල ක්ෂේත්‍ර නිරීක්ෂණයට, ශාක පත්‍රවල වෙනස්වීම් ග්‍රහණය කර ගැනීමට ඩ්‍රෝන යාත්‍රාවලට හැකියාව තිබෙනවා. මේ නිසා තාක්ෂණය නිසියාකාර ව ක්ෂේත්‍රයට යොදා ගැනීමෙන් එහි ප්‍රතිඵල නෙළා ගැනීමයි කළ යුත්තේ. කාර්මීකරණය වූ දියුණු වූ සෑම රටක් ම ඩ්‍රෝන තාක්ෂණය අඩු, වැඩි වශයෙන් කෘෂිකර්මාන්තය සඳහා යොදා ගන්නවා. උදාහරණයක් ලෙස 2016 වසරේ ඊශ්‍රායලයේ අගමැති ඇමරිකාවේ සෙනෙට් සභාවේ රැස්වීමකදී ප්‍රකාශ කර තිබෙනවා '2050 වන තෙක් මට ඔබට දිය හැකි වන්නේ එක් තාක්ෂණයයි. ඒ තමයි ඩ්‍රෝන තාක්ෂණය' යනුවෙන්."

මේ නිසා කෘෂිකර්මාන්තයෙන් තරුණ ප්‍රජාව ඉවත් වෙමින් සිටින ප්‍රවණතාවක් දක්නට ලැබෙන වර්තමානයේ ඔවුන්ට නැවත කෘෂිකර්මාන්තය දෙස හැරී බලන්නට අවස්ථාවක් ඩ්‍රෝන තාක්ෂණය උදා කරන පසුබිමක් ගොඩ නැගෙමින් සැබවින් ම යහපත් තත්ත්වයකි.



# පාසලට ආ සිවි වැනි ආණ්ඩුව

නුවන් කුමාර කටුගම්පල

පාසල් මාධ්‍ය සමාජ (School Media Clubs) යනු පාසල් පද්ධතියේ බහු ව්‍යාප්තිය සහිත විෂය සමගාමී ක්‍රියාකාරකමකි. මෙය ජාතික අධ්‍යාපන ආයතනයේ ව්‍යාපෘතියක් වශයෙන් අරඹන ලද්දේ වර්ෂ 2000දී ය. ඒ, අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී අංශය සමග ඒකාබද්ධ ව ය. ආරම්භයේදී ජනමාධ්‍ය සමාජය වශයෙන් හැඳින් වූ මේ ශිෂ්‍ය සංගමය පසුව මාධ්‍ය සමාජය ලෙස නම් කරන ලද්දේ 2006 අධ්‍යයන වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය පාසල් විෂයමාලාවට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හඳුන්වා දීමත් සමග ය. ඉන්පසු පාසල් මාධ්‍ය සමාජ ක්‍රියාකාරිත්වය පුළුල් විය. පංති කාමරයේ උගන්වන සන්නිවේදන විෂය ප්‍රායෝගික ව භාවිත කිරීමට ශිෂ්‍ය උත්තේජනකාරකය වන්නේ පාසල් මාධ්‍ය සමාජයයි.

අද්‍යතන ශ්‍රී ලාංකේය පාසල් පද්ධතියට ජනසන්නිවේදන විෂය පමණක් නොව පාසල් ජනමාධ්‍ය සමාජ හඳුන්වා දීමත් එහි ගුණාත්මකභාවය පිළිබඳ අවශ්‍යතාව ගොනු වීමත් සිදු වූයේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සංවර්ධනය, පාසල් පද්ධතික කලාපවල සංවර්ධනය, ඒවායේ පුළුල් වීම සහ ඒවා අතර තිබෙන අන්තර් සම්බන්ධය සමාජ සංවර්ධනයට ප්‍රබල ලෙස බලපාන නිසා යැයි කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයේ මහාචාර්ය ධර්මකීර්ති ශ්‍රී රංජන් පවසයි. එබැවින් මෙරට පාසල් සියල්ලේ ම ජනසන්නිවේදනය ඉගැන්වීම සහ මාධ්‍ය සමාජ පිහිටුවීම අත්‍යවශ්‍ය බව ඔහු අවධාරණය කරයි. ඊට හේතුව දරුවන් පාසල් වියේ පටන් ම මාධ්‍ය ක්ෂේත්‍රයටත් සන්නිවේදන කාර්යයටත් විවෘත වීම වර්තමාන ගෝලීය ප්‍රවණතා අනුව අනිවාර්ය සාධකයක් වන බැවිණි.

මහාචාර්ය ශ්‍රී රංජන්ට අනුව, 'මාධ්‍ය ක්ෂේත්‍රය ප්‍රබල ව වර්ධනය වන අද්‍යතන සමාජයේ නූතන මාධ්‍ය ප්‍රවාහ අතික්‍රමණය කොට නව මාධ්‍ය දිශානති වෙත සමාජය වේගයෙන් ගමන් කරනවා. ඒ අනුව අපට හමුවන්නේ ඊට අනුගත පරම්පරාවක්. ඒ පරම්පරාව සරල සමාජ කාරණාවලට අන්තර්ග්‍රහණය වන කණ්ඩායමක් නොවෙයි. ඔවුන්ගේ චර්යාත්මක ගතික සහ ස්වරූප ඉතිහාසයේ ස්වාභාවික නියමය හා සබැඳුණු ආකාරයට මානව නියමය මත ගොඩ නොනැගී මානුෂිකත්වය සහ චර්යාත්මක ගති ලක්ෂණ කෘත්‍රිම සන්දර්භයන්ට හැඩගැසෙනවා. අනාගතයේ එවැනි සන්දර්භයන්ට ව්‍යුහගත වන මිනිසුන් නිර්මාණය වන නිසා සන්නිවේදන ක්ෂේත්‍ර සහ එහි පණිවිඩකරණයත් තොරතුරුකරණයත් ඉහළ සාක්ෂරතා ප්‍රවේශයකින් ජන සමාජ විඥානගතවීම අත්‍යවශ්‍යයි. ඒ ඔස්සේ ඉතා ප්‍රබල සහ පුළුල් කාර්යභාරයක් පාසල් මාධ්‍ය සමාජ වැඩසටහනට කේන්ද්‍රගත වනවා.'

පාසල් ජනමාධ්‍ය සමාජ ව්‍යාපාරයේ සමාරම්භක අතීතය පිළිබඳ සැඟවුණු සාක්ෂ්‍ය සහිත සැබෑ ඉතිහාස කතාවක් තිබේ. 1988 ජූලි මස 12 දින ඇරඹී මෙරට ප්‍රථම පාසල් ජනමාධ්‍ය සමාජය වන කොළඹ ආනන්ද විද්‍යාලයීය 'ජනමාධ්‍ය කවය' (Mass Media Circle) ඇසුරේ මා ලද අත්දැකීම්වල මතක සටහන් ඊට අදාළ ය. වර්තමාන පාසල් මාධ්‍ය සමාජ ක්‍රියාත්මක වන්නේ සාකල්‍යයෙන් ම ඊට සමාන ආකෘතියකිනි.

මාධ්‍ය සමාජ ක්‍රියාවලිය පාසල් පද්ධතියේ ස්ථාපිත වූවා සේ සඳහන් වන 2000 වර්ෂය වන විට එම සංකල්පය පාසලට හඳුන්වා දී, ප්‍රායෝගික ව ක්‍රියාත්මක කර, සහෝදර පාසල් 40ක පමණ ශාඛා ව්‍යාප්ත කර ජාතික මට්ටමින් තරග සහ ජනමාධ්‍ය උළෙල පවත්වා වසර 12ක තරම් දිගු කාලයක් ගත වී තිබුණි. එබඳු ජාතික වැදගත්කමක් සහිත ඉතිහාස කරුණක් සැඟ ව යාමට ඉඩ හැරීම යුක්තියුක්ත නොවන නිසා ඒ බව වගකිවයුතු තැනක සටහන් කොට ඉදිරි පරපුරට දැන ගැනීමට සැලැස්වීම අදාළ නිලබල දරන්නන්ගේ යුතුකමකැයි යෝජනා කරමු.

මාධ්‍ය සමාජ ක්‍රියාවලිය පාසල් පද්ධතියේ ස්ථාපිත වූවා සේ සඳහන් වන 2000 වර්ෂය වන විට එම සංකල්පය පාසලට හඳුන්වා දී, ප්‍රායෝගික ව ක්‍රියාත්මක කර, සහෝදර පාසල් 40ක පමණ ශාඛා ව්‍යාප්ත කර ජාතික මට්ටමින් තරග සහ ජනමාධ්‍ය උළෙල පවත්වා වසර 12ක තරම් දිගු කාලයක් ගත වී තිබුණි. එබඳු ජාතික වැදගත්කමක් සහිත ඉතිහාස කරුණක් සැඟ ව යාමට ඉඩ හැරීම යුක්තියුක්ත නොවන නිසා ඒ බව වගකිවයුතු තැනක සටහන් කොට ඉදිරි පරපුරට දැන ගැනීමට සැලැස්වීම අදාළ නිලබල දරන්නන්ගේ යුතුකමකැයි යෝජනා කරමු.

පාසල් ජනමාධ්‍ය කව සංකල්පයේ නිර්මාතෘ, ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ ආචාර්ය බන්දුල පී. දයාරත්න පවසන්නේ ජනසන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය පාසල් විෂයමාලාවට ඇතුළත් කළ යුතු බවට ඔහු මුල්සටහන තබා ඇත්තේ 1990 වර්ෂයේ පැවැත්වූ මෙරට ප්‍රථම සමස්ත ලංකා පාසල් ජනමාධ්‍ය උළෙලේ සමරු කලඹෙහි බව ය. ඒ ගැන අදහස් දක්වන ඔහු: 'වාර්ෂික ව පාසල් මාධ්‍ය දිනයක් ප්‍රකාශයට පත්කිරීම සහ සමස්ත ලංකා මට්ටමින් පාසල් ජනමාධ්‍ය උළෙලක් පැවැත්වීම, පාසල් විෂයමාලාවට ජනමාධ්‍ය අධ්‍යාපනය ඇතුළත් කර ජනසන්නිවේදන මූලධර්ම හා ජනමාධ්‍ය පිළිබඳ අධ්‍යාපන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම, ජනමාධ්‍ය විෂය සඳහා ගුරුවරුන් පුහුණු කිරීම, පාසල් ජනමාධ්‍ය කව දීපව්‍යාප්ත කරවීමට ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීම යනාදී යෝජනා මා ඉදිරිපත් කර තිබුණත් 1999 අගභාගය වනතුරු ම ඒවා පිළිගැනීමට වගකිවයුත්තන් උත්සුක වූයේ නැහැ. ආනන්දයෙන් ගුරු වෘත්තියට සමු දී මා ජාතික අධ්‍යාපන ආයතනයට සම්බන්ධ වුණේ ඒ ජාතික කාර්යය කෙසේ හෝ ඉටු කළ යුතු නිසා. එතැන් සිට දැරූ උත්සාහයේ ඵලය ලෙස 'පාසල් ජනමාධ්‍ය කවය' නමින් නොව 'පාසල් මාධ්‍ය සමාජය' යන නමින් 2000 වර්ෂයේ සිට එම වැඩසටහන පාසල්වල ක්‍රියාත්මක කෙරුණා. පළාත්, කලාප, කොට්ඨාස කාර්යාල සහ අදාළ පාසල්වල සහයෝගය ද ඇති ව එම වසරේදී ම පාසල් රැසක මාධ්‍ය උළෙල පවත්වන්නටත් අපට හැකි වුණා. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය සහ Plan Sri Lanka ආයතනය මේ සඳහා දැක්වූ සහයෝගය ඉමහත්.'

පාසල් මාධ්‍ය සමාජ ඔස්සේ ප්‍රායෝගික ව ක්‍රියාත්මක වූ ජනමාධ්‍ය විෂය න්‍යායාත්මක ව හැදෑරීමට අවස්ථාව ලබා දීම උදෙසා ක්‍රියාකාරී වූ අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනය විසින් 1999 වසරේ සිට මාධ්‍ය සමාජවලට සම්බන්ධ ගුරුවරුන්ට පුහුණුව ලබා දෙන ලදී. 2007 වර්ෂයේදී අ.පො.ස. (සා/පෙ) විභාගයට සන්නිවේදනය විෂයෙන් ප්‍රථම වරට දරුවන් ඉදිරිපත් වූයේ එහි ඵලයක් ලෙස ය. ඒ අනුව 2010 වසරේදී උසස් පෙළ සිසුහු ජනසන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය විෂයෙන් ප්‍රථම වරට විභාගයට පෙනී සිටියහ.

ආචාර්ය බන්දුල පී. දයාරත්න පවසන්නේ පාසල් මාධ්‍ය සමාජ, පාසල් සංස්කෘතියේ ඉතා ශක්තිමත් අංගයක් බවට පත් වී ඇති බව ය. එතෙක් මෙතෙක් සිදු වූ බිඳවැටීම් අතරතුර මන්දගාමී ගමනක යෙදුණු පාසල් ජනමාධ්‍ය සමාජ ව්‍යාපෘතියට ජනමාධ්‍ය අමාත්‍යාංශයේත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේත් සෘජු අත හිත ලැබීමත් සමග නව පණක් ලද බවත් ඔහු ප්‍රකාශ කරයි.

දරුවන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යෙදවීම, ඔවුන්ගේ මාධ්‍ය දැනුම යාවත්කාලීන කරවීම, ගුරුවරුන් පුහුණු කිරීම, මාධ්‍ය සමාජවලට අත්‍යවශ්‍ය භෞතික සම්පත් සපයා දීම, නිර්මාණ තරග සංවිධාන කිරීම, මාධ්‍ය සමාජ අතර සම්බන්ධීකරණය ගොඩනැංවීම, ගුරුවරුන්ට මාධ්‍ය ගුරු හැඳුනුම්පත් ලබා දීම, යාපනය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එස්. රඝුරාම්ගේ උපදේශකත්වයෙන් උතුරු නැගෙනහිර දෙමළ මාධ්‍ය ද ඇතුළත් ව දිවයින ම ආවරණය වන පරිදි අ.පො.ස. (සා/පෙළ) සහ අ.පො.ස. (උ/පෙළ) විෂය නිර්දේශ පාදක සම්මන්ත්‍රණ පැවැත්වීම වැනි ක්‍රියාකාරකම් සමග අධ්‍යාපන අමාත්‍යාංශයට විශේෂ ශක්තියක් වූයේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ය. විජය ළමා පුවත්පතේ අනුග්‍රහය ඇති ව ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ අංශයේ පාසල් මාධ්‍ය සමාජ ඒකකයෙන් ප්‍රකාශයට පත්කරන 'පාසල් මාධ්‍ය පුවත්' නම් ඊ-පුවත්පතින් පාසල් මාධ්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධ තොරතුරු ලබා ගත හැකි ය.

පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන වැඩසටහනට සමගාමී ව 'ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියකින් සහ ඉහළ මාධ්‍ය සාක්ෂරතාවකින් යුත් ප්‍රබුද්ධ ජන සමාජයක් බිහි කිරීම උදෙසා වන අවබෝධතා ගිවිසුම' කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයත් ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවත් අතර අත්සන් කර දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ හර්ෂ බී. අබේකෝන් පවසන්නේ පාසල් මාධ්‍ය සමාජයේ හරය, අන්තර්ගතය සහ ක්‍රියාකාරීත්වය පිළිබඳ විෂයයික වගකීම ඇත්තේ අධ්‍යාපන අමාත්‍යාංශයටත් ජාතික අධ්‍යාපන ආයතනයටත් වඩා ජනමාධ්‍ය අමාත්‍යාංශයට සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට බව ය. අදහස් දක්වන ඔහු: 'රාජ්‍ය ප්‍රතිපත්තිවලට අදාළ ව ජනමාධ්‍ය අමාත්‍යාංශයට පැවරී ඇති වගකීම වන්නේ පුරවැසියාගේ මාධ්‍ය සාක්ෂරතාව දියුණු කරමින් ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් රටේ නිර්මාණය කිරීමයි. සබුද්ධිකභාවයෙන් යුත් දියුණු සිවිල් සමාජයක් සඳහා එය ඉවහල් වනවා. ජනමාධ්‍යවේදය, ජාතික සංවර්ධනය, සංස්කෘතිය සහ පාසල් මාධ්‍ය සමාජ යන පාර්ශ්ව අතර සහසම්බන්ධය ගොඩනැංවීමේ වගකීම පැවරී ඇත්තේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට. පාසල් මාධ්‍ය සමාජ සාමාජිකයන් වෘත්තීය ජනමාධ්‍යවේදීන් ලෙස සමාජගත කිරීම සහ ඔවුන්ගේ දායකත්වයෙන් උසස් මාධ්‍ය සාක්ෂරතාවක් සහිත සමාජයක් නිර්මාණය කිරීම යන වගකීම්සහගත ගමනක අප ගමන් කරන්නේ




පාසල් මාධ්‍ය සමාජ වැඩසටහන නියමු ව්‍යාපෘතියකින් එහා ගිය පුළුල් ජාතික වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කරමින්.'

ශ්‍රී ලංකාවේ මාධ්‍ය අධ්‍යාපනයට වැඩි නැඹුරුවක් දැක්වීම අතිශයින් වැදගත් වන්නේ අද ලෝක තත්ත්වයට ගැළපෙන සමස්ත පරිවර්තනයක් මෙරට ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ඇති වී නොමැති නිසාත් ගෝලීය මාධ්‍ය ප්‍රවණතාවල අන්තර්ගතය සහ තාක්ෂණික උත්කර්ෂය අපේ ජනවිඥානය සමග ගැටෙන නිසාත්

ය. එවිට සිදුවන්නේ ජනමාධ්‍ය අයාලේ යන කර්මාන්තයක් බවට පත් වීම ය.


අධ්‍යාපන අමාත්‍යාංශයේත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේත් සම්බන්ධීකරණයෙන් ශ්‍රී ලංකා යුනෙස්කෝ ලේකම් කාර්යාලය ජාත්‍යන්තර සම්මුති පදනම් කරගෙන මෙරට පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ඇරඹීම සඳහා ද අවසන් අදියරේ සාකච්ඡා පැවැත්වෙන බවත් නුදුරේදී ම ඊට අනුමැතිය ලැබෙනු ඇති බවත් සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හර්ෂ බී. අබේකෝන් පවසයි. එවැන්නක අවසන් ප්‍රතිලාභ ලැබෙන්නේ මෙරට පාසල් ශිෂ්‍ය ප්‍රජාවට ය. සෑම දරුවකු ම මාධ්‍ය අවබෝධය ලබා ගැනීම අත්‍යවශ්‍ය වුවත් මාධ්‍ය විෂය උසස් පෙළට හැදෑරීමට හැකියාව ඇත්තේ කලා විෂය ධාරාවෙන් උසස් පෙළ හදාරන දරුවන්ට පමණි.

එම නිසා අනෙකුත් විෂය ධාරා හදාරන දරුවන්ට මාධ්‍ය සාක්ෂරතාව ලබාගැනීමේ අවස්ථාව අහිමි වන බව පෙන්වා දෙන්නේ කොළඹ යශෝධරා බාලිකා විද්‍යාලයේ ජනසන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය භාර සහ මාධ්‍ය සමාජය භාර ආචාරිණී සුගන්ධි හෙට්ටිආරච්චි ය. අදහස් දක්වන ඇය: 'විද්‍යා, ගණිත සහ වානිජ විෂයධාරා හදාරන්නන් අපොස (සා/පෙ) දක්වා මාධ්‍ය සමාජයේ ක්‍රියාකාරී වෙමින් සහ මේ විෂය හදාරමින් දක්ෂතා කුසලතා පෙන්වනවා. නමුත් ඔවුන් ජනසන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය හැදෑරීමට කලා විෂය ධාරාවෙන් අධ්‍යාපනය ලැබීම රිසි වුවත් දෙමව්පියන්ගේ සහ ගුරුභවතුන්ගේ බලපෑමට යටත් ව එම විෂය ධාරා තෝරාගෙන ඔවුන්ගේ අකැමැත්තෙන් මාධ්‍යයෙන් බැහැර වීම අභාග්‍යයක්.'

**පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන වැඩසටහනට සමගාමී ව 'ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියකින් සහ ඉහළ මාධ්‍ය සාක්ෂරතාවකින් යුත් ප්‍රබුද්ධ ජන සමාජයක් බිහි කිරීම උදෙසා වන අවබෝධතා ගිවිසුම' කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයත් ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවත් අතර අත්සන් කර දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.**



ප්‍රථම නිල ලාංඡනය


සමරු කළඹ කවරය



සාමාජික පත්‍රය

ආචාරිණී සුගන්ධි හෙට්ටිආරච්චි: 'සෑම පාසලක ම උත්සව අවස්ථාවල සහ වැඩසටහන්වල සන්නිවේදන, තාක්ෂණික සහ ප්‍රචාරණ ක්‍රියාකාරකම් මෙහෙයවනු ලබන්නේ පාසල් මාධ්‍ය සමාජයේ දරුවන් විසින්. රසවින්දනයට, තොරතුරු ගවේෂණයට, විෂය ප්‍රායෝගික ව ප්‍රගුණ කිරීමට, විභාග මානසිකත්වයෙන් මිදීමට සහ සමාජානුයෝජනයට ඔවුන් හුරු වීම සඳහා මාධ්‍ය ක්‍රියාකාරකම් ප්‍රබල දායකත්වයක් සපයනවා. පත පොත කියවීම, ප්‍රවෘත්ති සහ විශේෂාංග රචනය, නිර්මාණාත්මක සාහිත්‍යය, ඡායාරූපකරණය, වීඩියෝකරණය, චිත්‍රපටකරණය, නිවේදනය, උත්සව සංවිධානය, නිර්මාණ විචාරය වැනි වෘත්තීයමය අංශ වෙත ද අප දරුවන් යොමු කරනවා.' ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය හිඟ වීම, මාධ්‍යකරණයෙහි ලා වැඩිහිටි සමාජයේ පවතින සෘණ ආකල්ප, සිසුන්ට ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට මාධ්‍ය ආයතනවලින් ලැබෙන සහයෝගය අවම වීම, මූල්‍ය දුෂ්කරතා වැනි ගැටලු පෙන්වා දෙන ඇය ඒවා අවමකිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මැදිහත්වීම තමන් ධෛර්යමත් කරවන බවත් සඳහන් කරයි.

මහාචාර්ය ශ්‍රී රංජන් පෙන්වා දෙන්නේ පාසල් පද්ධතියේ පරිපාලන ක්ෂේත්‍ර, ගුරුවරු සහ ශිෂ්‍යයන්, ඔවුන් වටා කේන්ද්‍රගත වන ජන ප්‍රජා කණ්ඩායම්, පාසල් සංවර්ධන අංශ යනාදී ආයතනික ව්‍යුහයන්ගේ වගකීම් සහ කාර්යභාරවල දායකත්වය වඩාත් වැදගත් වන බවයි. ඔහුට අනුව සාම්ප්‍රදායික, නූතන සහ නව මාධ්‍ය සියල්ලේ ම නිවැරදි ක්‍රියාකාරිත්වය ඔස්සේ මාධ්‍ය ක්‍රියාවලියේ සමස්තය ම සාක්ෂරතා ප්‍රමුඛ ව නිවැරදි ව සමාජයේ සක්‍රීය වීමට ඉඩ සැලසීමෙන් පාසල් මාධ්‍ය සමාජ ක්ෂේත්‍රයට ප්‍රබල ගමනක් නිර්මාණය කර ගත හැකි ය.

මාධ්‍ය විෂයයේ තිබෙන ගැඹුරු සංකල්පීය ප්‍රවණතා පහසුවෙන් අධ්‍යයනය කිරීමට සහ ඒ සම්බන්ධයෙන් දේශීය ව සහ ජාත්‍යන්තර ව පවතින රැකියා වෙළෙඳපොළ පිළිබඳ පාසල් අවධියේදී ම අවබෝධයක් ලබා ගැනීමට හැකි වීමෙන් දරුවන්ට අනාගත වෘත්තීය ඉලක්ක හඳුනාගැනීමට ද පාසල් මාධ්‍ය සමාජයෙන් පහසුව සැලසේ. රටේ මානව සංවර්ධනය මෙන් ම භෞතික සංවර්ධනය ගැන යථාවබෝධයෙනුත් නිසි සමාජාවබෝධයෙනුත් යුත් පරපුරක් බිහිවීමට මනා සහයෝග යක් පාසල් මාධ්‍ය සමාජවලින් ලැබේ. එබැවින් ඒවා බලාත්මක කිරීම පාසල් පද්ධතියේත් රජයේත් පෞද්ගලික අංශයේත් ඒකාබද්ධතාවෙන් සිදුවිය යුතු වටිනා අනාගත ආයෝජනයකි.

ජාතික සංවර්ධනය, පුද්ගල සංවර්ධනය සහ සමාජ සංවර්ධනය ගත්විට සෑම සංවර්ධනාත්මක නියමයකට ම කේන්ද්‍රගත වන ප්‍රබල ම ව්‍යුහය වන්නේ සන්නිවේදනයයි. ඒ අනුව සැලකූ විට ද පාසල් මාධ්‍ය සමාජ සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කාරණාවකි. කෘත්‍රිම බුද්ධිය භාවිතයෙන් සන්නිවේදනය (Artificial Intelligence-AI Journalism) දක්වා විහිදුණු, කිසිවකුට ඍජු ව පාලනය කළ නොහැකි මාධ්‍ය අවකාශයක ලෝකය ක්‍රියාකාරී වෙද්දී පුළුල් සහ ප්‍රශස්ත මාධ්‍ය සාක්ෂරතාවක් සහිත ව සවිබල ගැන්වුණු ශ්‍රී ලාංකේය ප්‍රජාවක් බිහි කර ගැනීමට පාසල් මාධ්‍ය සමාජවලින් දැක්විය හැකි දායකත්වය ඉතා ප්‍රබල ය. මෙහි බැරෑරුම්කම තේරුම් ගැනීමට රටක් ලෙස කල් පසු කර ඇතත් ඉදිරියට මීට වඩා සක්‍රීය සහ ශක්තිමත් දායකත්වයක් සහිත ව ඒ සඳහා ක්‍රියාත්මක විය යුතු බව අදාළ පාර්ශ්ව අවධාරණයට ගත යුතු ය.

# රාජ්‍ය මූල්‍ය කළමනාකරණ අභියෝගය

**හිඟ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අඛණ්ඩ ව පවත්වාගෙන යාමට සිදු වීම ශ්‍රී ලංකාව මුහුණ පා ඇති ප්‍රධානතම අභියෝගයකි. රාජ්‍ය ආදායම අභිභවා යන රාජ්‍ය වියදම හේතුවෙන් ශ්‍රී ලංකා රජයට වේදනාකාරී ප්‍රතිපත්ති අනුගමනය කිරීමට සිදු ව තිබේ. 2023 වර්ෂයේ විගණනය නොකළ වාර්තා අනුව සමස්ත රාජ්‍ය ආදයම ට්‍රිලියන 3කි. සමස්ත රාජ්‍ය වියදම ට්‍රිලියන 13කි. නොබෝද කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවට එක්වෙමින් ජනමාධ්‍ය අමාත්‍ය බන්දුල ගුණවර්ධන අනාවරණය කළේ මෙවැනි පසුබිමක රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කර ගැනීමේ අභියෝගය ශ්‍රී ලංකාණ්ඩුවට පවතින බවයි. මේ, එම අභියෝගයට අප මුහුණ දිය යුත්තේ කෙසේ ද? යන්න විද්වත් අදහස් දැක්වීමකි.**



මහාචාර්ය
**ප්‍රියංග දුනුසිංහ**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය

නිදහසින් පසුව ලංකා ආර්ථිකයේ මූලික වැවිලි බෝග පදනම් කරගත් ආර්ථිකයක් ක්‍රියාත්මක වුණා. එහෙත් 1950 ගණන් වන විට රාජ්‍ය මැදිහත්වීමෙන් කාර්මික අපනයන ආර්ථිකයක් කරා යන ගමනට අවශ්‍ය පදනමයි ලංකාවේ සකස් වෙමින් තිබුණේ. 1950 ගණන්වල සිට 1977 දක්වා වූ කාලයේ මෙරට ක්‍රියාත්මක වෙමින් තිබුණේ කිසියම් ආකාරයක ආවෘත පදනමකින් යුක්ත ආර්ථික ප්‍රතිපත්තියක්. 1965-70 කාලයේ ලංකා ආර්ථිකයේ යම් විවෘතභාවයක් ද නිරීක්ෂණය කරන්න පුළුවන්.

1977 වර්ෂයේදී ශ්‍රී ලංකාව විවෘත ආර්ථික ප්‍රතිපත්තියකට පිවිසීමත් සමග ආර්ථිකයේ රාජ්‍ය ක්‍රියාකාරිත්වය අවම වුණා. පෞද්ගලික අංශයේ ක්‍රියාකාරිත්වය පුළුල් වුණා. විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග 5%-6%ක පමණ සාමාන්‍ය ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමෙන් ශ්‍රී ලංකාව 2010 වර්ෂය පමණ වන විට ලෝකයේ පහළ ආදායම්ලාභී රටක සිට පහළ මැදි ආදායම්ලාභී රටක් බවට පත් වනවා. මේ කාලයේ සෞඛ්‍ය, අධ්‍යාපනය, යටිතල පහසුකම් වැනි ක්ෂේත්‍රවල ඇතිවුණේ විශාල දියුණුවක්. මානව සංවර්ධන දර්ශකය අනුවත් ශ්‍රී ලංකාව ලෝකයේ ඉහළ ස්ථානයක පැවතුණා.

ශ්‍රී ලංකාව මධ්‍යම ආදායම් කාණ්ඩයේ රටක් බවට පත්වීමත් සමග එතෙක් පැවති සහනදායි ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව අවම වුණා. ඒ නිසා සෛවරී බැඳුම් කර නිකුත් කරමින් වෙළෙඳපොළ ණය ලබා ගැනීමට ශ්‍රී ලංකාව පෙළඹෙනවා. 2000න් පසු කාලයේදී සංවර්ධන ණය ලබා ගැනීම විශාල ලෙස ඉහළ යනවා. යුද වාතාවරණය අවසන් වීම නිසා සංවර්ධන අවශ්‍යතා පුළුල් වීම, විශාල අයවැය හිගය සහ ගෙවුම් ශේෂ හිඟය වැනි කාරණා නිසා අඩු පොලී මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව සීමා වීම නිසාත් මේ අකාරයට වෙළෙඳපොළ ණය මත පදනම් වීමට ශ්‍රී ලංකාව ක්‍රියා කළා.

ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ හිගයත් අයවැය හිඟයත් අඛණ්ඩ ව පුළුල් වෙමින් පැවතුණා. ඒ සඳහා නිසි ආමන්ත්‍රණයක් සිදු වූයේ ද නැහැ. ආර්ථිකයේ තරගකාරිත්වය සහ ඵලදායිතාව පහළ යමින් තිබුණා. විශේෂයෙන් රාජ්‍ය අංශයේ සිදු වෙමින් පැවති අකාර්යක්ෂමතාව, වංචා දූෂණ, නීතිය ක්‍රියාත්මක නොවීම ආදිය නිසයි 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාව ණය අර්බුදයකට මුහුණ දෙන්නේ.

මෙවැනි අර්බුදයක් ම නොවුණ ද ශ්‍රී ලංකාව මෙයට පෙර ද යම් යම් අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දුන්නා. ගුවන්තොටුපොළ වැනි ආර්ථික මර්මස්ථානවලට ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල වීමත් සමග 2002 වර්ෂයේදී ආර්ථිකය පෙන්නුම් කළේ ඍණ වර්ධන වේගයක්. ඒ හා සමාන ව ම 1971 වර්ෂයේදීත් ආර්ථිකය ඍණ වර්ධන වේගයක්

**2015 යහපාලන රජය යටතේ විශාල උත්සාහයක් දැරුවා රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමට. රාජ්‍ය අයවැය තුළ මූලික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමට එහිදී ක්‍රියා කළා. මේ නිසා 2017 සහ 2018 වර්ෂවලදී එහි අතිරික්කතයක් ඇති කර ගැනීඹට රජයට හැකියාව ලැබුණා. නව ආදායම් බදු පනතක් හඳුන්වා දීම සහ බදු ආදායම ඉහළ දමා ගැනීමට ක්‍රියා කිරීමෙන් මේ තත්ත්වය ළඟා කර ගැනිමට හැකියාව ලැබුණා.**




පෙන්නුම් කළේ තරුණ නැගිටීම් සමග. 2002 වර්ෂයේදී සෘණ වර්ධනයක් පෙන්නුම් කිරීමත් සමග එවකට රජයට අවබෝධ වූ කාරණයක් නම් රාජ්‍ය මූල්‍ය විනයක් රහිත ව අයවැය හිඟය දිගින් දිගට ම පවත්වාගෙන යාම නිසා යම් අර්බුදයකට රට ගමන් කළ හැකි බව. මේ නිසා 2003 වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය වගකීම් පනත (Fiscal Responsibility Act) හඳුන්වා දෙනවා. එහි මූලික අරමුණ වුණේ ණය ගැනීම සීමා කිරීම. ඒ අනුව 2013 වර්ෂය වන විට රාජ්‍ය ණය ගැනීම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසින් 60%ක මට්ටමට ගෙන ඒමටත් අයවැය හිඟය 5%ක මට්ටමේ පවත්වා ගැනීමටත් අරමුණු කළා. එහෙත් පසුකාලීන ව මේ පනත නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වූයේ නැහැ.

මහබැංකුව ස්වාධීන ව ක්‍රියාත්මක නොවීමෙන් මූල්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ අවශ්‍යතා ඉටුකරන්නක් පමණක් (Fiscal Dominance) බවට පත්වීම ද සිදු වුණා. එයින් අදහස් වන්නේ මූල්‍ය ප්‍රතිපත්තිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් හැසිරවීමට බලපෑම් කිරීම. මේ නිසා මහබැංකුව ස්වාධීන ආයතනයක් කිරීමේ අවශ්‍යතාව ද පැවතුණා.

2015 යහපාලන රජය යටතේ විශාල උත්සාහයක් දැරුවා රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමට. රාජ්‍ය අයවැය තුළ මූලික ගිණුමේ අතිරික්තයක් පවත්වා ගැනීමට එහිදී ක්‍රියා කළා. මේ නිසා 2017 සහ 2018 වර්ෂවලදී එහි අතිරික්තයක් ඇති කර ගැනීඹට රජයට හැකියාව ලැබුණා. නව ආදායම් බදු පනතක් හඳුන්වා දීම සහ බදු ආදායම ඉහළ දමා ගැනීමට ක්‍රියා කිරීමෙන් මේ තත්ත්වය ළඟා කර ගැනිමට හැකියාව ලැබුණා. පාඩු ලබන රාජ්‍ය ආයතනවල පාඩුව අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගැනුණා. මේ නිසා ම පැවති ආණ්ඩුවේ ජනප්‍රියතාව ගිලිහීමෙන් නව ආණ්ඩුවක් රාජ්‍ය

රජය මේ වන විට සැලසුම් කරමින් සිටින්නේ රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලිකරණය කිරීමටත් නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙන් රාජ්‍ය ආයතනවල පාඩුව අවම කිරීමටත්. රාජ්‍ය ආයතන අයවැය මත ඇති කරන පීඩනය අවම කර ගැනීමයි එහි බලාපොරොත්තුව. අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරන්නත් ආයෝජන අවස්ථා පුළුල් කරන්නත් පියවර ගනිමින් සිටිනවා. මේ සියල්ල රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගෙන යාමට රජය ගත් සෘජු හා වක්‍ර යහපත් ක්‍රියාමාර්ග.

බලය ලබා ගත්තා. බිහිවුණු නව රජය විශාල බදු සහන ලබා දීමෙන් පැවති ප්‍රතිපත්තියේ සිදු කළේ විශාල වෙනසක්. කොවිඩ් 19 වසංගතයත් සමග ඇති වූ ආර්ථික අර්බුදයත් සමග රාජ්‍ය ආදායම හා වියදම අතර පරතරය තව තවත් වර්ධනය වුණා. අයවැය හිඟය මේ වන විට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 9%ක් පමණ වනවා. එයට හේතු වූයේ රාජ්‍ය වියදම එලෙස ම තිබියදී රාජ්‍ය ආදායම විශාල ලෙස පහළ යාම. ශ්‍රී ලංකාවේ පැවති ආණ්ඩුවල ආර්ථිකයේ පවතින ද්විත්ව හිඟය ඉවත් කර ගැනීම සඳහා නිසි අයුරින් ආමන්ත්‍රණය නොකිරීම නිසා ආර්ථිකයේ පැවති අර්බුදකාරී තත්ත්වයට තවදුරටත් පැවතුණා.

වත්මන් ආණ්ඩුව දැඩි මූල්‍ය විනයක් පවත්වා ගනිමින් සිටිනවා. මහබැංකු පනත හඳුන්වා දීමෙන් මහබැංකුව ස්වාධීන ආයතනයක් බවට පත් කිරීම ඉන් එක් පියවරක්. ඒ අනුව උද්ධමනය ඉලක්කගත මට්ටමක පවත්වා ගනිමින් සිටිනවා. රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීමේ මෙවලමක් ලෙසින් මහබැංකුව පවත්වා ගෙන යාමෙන් වළක්වා ගැනීමත් මහබැංකු පනත හඳුන්වා දීමේ අරමුණක්. එය යහපත් තත්ත්වයක් ලෙසිනුයි මා දකින්නේ.

රජය මූලික වශයෙන් ම අයවැය හිගය අවම කර ගැනීමට රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසින් 9%ක පමණ පවතින රාජ්‍ය බදු ආදායම වසර දෙක තුනක අවෑමෙන් පසුව 12%ක සහ 14%ක මට්ටමට ගෙන ඒමට රජය අපේක්ෂා කරනවා. පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිංස්කරණ ක්‍රියාවලියත් වත්මන් අයවැය පරතරය අවම කර ගැනීමේ සැලසුමට අයත් වන්නක්. විශේෂයෙන් රාජ්‍ය ව්‍යවසාය ලබාදෙන භාණ්ඩවල පිරිවැය නිරූපණය වන ආකාරයෙන් භාණ්ඩ හා සේවා මිල හැඩ ගැසීමට අවශ්‍ය පරිසරය සකස් කරමින් පවතිනවා. රජය මේ වන විට සැලසුම් කරමින් සිටින්නේ රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලිකරණය කිරීමටත් නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙන් රාජ්‍ය ආයතනවල පාඩුව අවම කිරීමටත්. රාජ්‍ය ආයතන අයවැය මත ඇති කරන පීඩනය අවම කර ගැනීමයි එහි බලාපොරොත්තුව. අපනයන ක්ෂේත්‍රයේ වර්ධනයක් ඇති කරන්නත් ආයෝජන අවස්ථා පුළුල් කරන්නත් පියවර ගනිමින් සිටිනවා. මේ සියල්ල රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගෙන යාමට රජය ගත් සෘජු හා වක්‍ර යහපත් ක්‍රියාමාර්ග. මේ නිසා උද්ධමනය පහළ අගයකට ගෙන ඒමටත් වෙළෙඳපොළ පොලී අනුපාතිකය පහළ අගයකට ගෙන ඒමටත් විදේශ සංචිත ප්‍රමාණය යම් ආකාරයකින් ඉහළ දමා ගැනීමටත් ආදි ලෙසින් විශාල ප්‍රගතියක් අත්කර ගැනීමට රජයට හැකියාව ලැබී තිබෙනවා. ඒ සඳහා රටේ මහජනතාවත් සිදු කර තිබෙන්නේ විශාල ලෙස කැපකිරීම්.

ආර්ථිකයේ ඇති කර ගත යුතු ස්ථායිතාවෙන් ඔබ්බට ගිය වර්ධනය ඇති කර ගැනීම සඳහා රජය ගත යුතු ක්‍රියාමාර්ග තිබෙනවා. රාජ්‍ය ආදායම ඉහළ දමා ගැනීම සඳහා බදු අනුපාතය විශාල ලෙසින් ඉහළ දැමුවත් බදු නොගෙවන, ගෙවිය යුතු බද්දට වඩා අඩු බද්දක් ගෙවන සහ බදු වංචා කරන්නන් හඳුනාගෙන එම ආදායම් රැස් කර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. රාජ්‍ය වියදම් කප්පාදුවේදී ඇතැම් කොටස් වරප්‍රසාදලාභීන් ලෙසින් තවදුරටත් පැවතීම සහ තවදුරටත් ඵලදායී නොවන රාජ්‍ය වියදම් එලෙස ම පවත්වාගෙන යාම දක්නට ලැබෙනවා. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තරගකාරී

ඕනෑ ම රටක විදේශ ණය ගෙවීමේ හැකියාව තීරණය වන්නේ රටට විදේශ විනිමය ගලා එන ප්‍රමාණය අනුව. දැනට ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය මාර්ග වන්නේ විදේශ ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය. එහෙත් මෙය අඛණ්ඩ ව පවත්වාගෙන යන්නට බැහැ. මේ නිසා අපනයන ආදායම පුළුල් කර ගැනීමේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දිය යුතුයි. නැවත ණය අර්බුදයකට නොයා සිටීමට නම් විදේශ ආයෝජන සහ ආයෝජන ප්‍රවර්ධනය සඳහා බිම් මට්ටමේ පරිසරය සකසා දිය යුතුයි.

මට්ටමකට ගෙන ආ යුතුයි. ඒ අනුව අයවැයෙහි රාජ්‍ය වියදම් පාර්ශ්වයේ නිසි කළමනාකරණයක් අවශ්‍ය වනවා.

ඕනෑ ම රටක විදේශ ණය ගෙවීමේ හැකියාව තීරණය වන්නේ රටට විදේශ විනිමය ගලා එන ප්‍රමාණය අනුව. දැනට ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය මාර්ග වන්නේ විදේශ ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය. එහෙත් මෙය අඛණ්ඩ ව පවත්වාගෙන යන්නට බැහැ. මේ නිසා අපනයන ආදායම පුළුල් කර ගැනීමේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දිය යුතුයි. නැවත ණය අර්බුදයකට නොයා සිටීමට නම් විදේශ ආයෝජන සහ ආයෝජන ප්‍රවර්ධනය සඳහා බිම් මට්ටමේ පරිසරය සකසා දිය යුතුයි. 1980 ගණන්වල ඇති වූ ලතින් ඇමරිකානු ණය අර්බුදයේදී රටවල් දෙකක් හැර බ්‍රසීලය, පේරු, ආජන්ටිනාව, ඉක්වදෝරය ආදි සෙසු රටවල් සියල්ල නැවත නැවතත් ණය අර්බුදය සඳහා මුහුණ දුන්නා. වෙනිසියුලාව හය වතාවක්, ආජන්ටිනාව පස් වතාවක්, බ්‍රසීලය දෙවතාවක් මේ ආකාරයේ ණය අර්බුදවලට මුහුණ දී තිබෙනවා. මෙක්සිකෝව සහ චිලී නැවත වරක් ණය අර්බුදයකට ගමන් නොකළේ ඇයි? යන්න මෙහිදී අපට වැදගත්. ඔවුන් අපනයන ක්ෂේත්‍රය සහ ආයෝජනය පුළුල් කිරීමට විශාල කැප කිරීමක් සිදු කළා. පසුගිය වසර 30ක කාලයේ ඔවුන් ණය අර්බුදයකට ගමන් නොකළ හේතුව එයයි. අපනයන ආදායම වර්ධනය කර ගතහොත් පමණයි ගත් ණය ගෙවීම සහ ඉදිරියට ගන්නා ණය ගෙවීමේ හැකියාව සහතික කරන්නේ.

රජය පවසන ආකාරයට මේ වන විට දකුණු ආසියාවේ හොඳම දූෂණ විරෝධී පනත සම්මත කරගෙන තිබෙන නිසා එය ක්‍රියාත්මක වීමයි වැදගත්. 2003 වසරේදී ජෝර්ජියාවේ ඇති වන රෝස විප්ලවයෙන් පසුව බලයට පත්වන රජය ක්ෂණික ව අවශ්‍ය ප්‍රතිසංස්කරණවලට යොමු වනවා. වංචාව හා දූෂණය සම්බන්ධයෙන් ඉතා දැඩි පියවර ගන්නවා. එයින් පෙන්වා දීමට උත්සාහ කළේ ජෝර්ජියානු රජය වංචාව, දූෂණය හා අල්ලස ප්‍රතික්ෂේප කරන බව සමාජගත කිරීම. රටෙන් මුදල් බැහැර කිරීම සම්බන්ධයෙන් පවතින චෝදනා සඳහා Stolen Asset Recovery ක්‍රමවේදය ඔස්සේ රජයට ක්‍රියාත්මක වීමේ හැකියාව තිබෙනවා. මෙය ලෝක බැංකුව හා එක්සත් ජාතීන්ගේ සංවිධානය එක් ව ක්‍රියාත්මක කරන, අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ ආයතනය සමග ඒකාබද්ධ ව ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පිළිගත් ක්‍රමවේදයක්. විවිධ ජාත්‍යන්තර ආයතන ශ්‍රී ලංකාවේ මුදල් බැහැර කිරීම් සම්බන්ධයෙන් වාර්තා පසුගිය කාලවකවානුවේ ප්‍රකාශයට පත්කර තිබුණා. මේ සඳහා රජය ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාව තිබෙනවා. එහිදී නැවත මුදල් අය කර ගැනීමේ හැකියාව ගැන නොසලකා වංචාවට හා දූෂණයට එරෙහි ව ක්‍රියාත්මක වීමට රජය සූදානම් බවට මහජනතාව තුළ විශ්වාසය ඇති කළ යුතුයි. නීතිය හා සාමය පවත්වාගෙන යාමේදීත් සුදුසු ව්‍යාපාරික පරිසයක් ඇතිකිරීමේදීත් එය වැදගත්.

රජයේ ප්‍රතිපත්ති හා ක්‍රමසම්පාදනයේදී දත්ත මත පදනම් ව ප්‍රතිපත්ති හා ක්‍රමසම්පාදනය කළ යුත්තක්. ඒ සඳහා පාර්ලිමේන්තුවට වග කියන ස්වාධීන ක්‍රමසම්පාදන ආයතනයක් ඇති කළ යුතු වනවා. මුදල් අමාත්‍යාංශයේ ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සැලසුම් සැකසිය යුතුයි. දකුණු ආසියාවේ සෑම රටක ම පාහේ එවැනි සැලසුම් තිබෙනවා. අසල්වැසි ඉන්දියාවේ NITI (National Institution of Transforming India) සිදු කරන්නේ ඉන්දියාවේ සෑම අංශයක ම ජාතික ප්‍රතිපත්ති හා ක්‍රමසම්පාදනය සැකසීම. ශ්‍රී ලංකාවේ ද එවැනි ස්වාධීන ආයතනයක අවශ්‍යතාව තිබෙනවා. එවිට ආණ්ඩු මාරු වන විට හෝ දේශපාලඥයන් මාරු වන විට ඔවුන්ගේ අවශ්‍යතාව අනුව ක්‍රියා කිරීමේ ඉඩ සීමා වනවා.

මේ සියලු කාරණාවලින් ගම්‍ය වන්නේ ණය අර්බුදයකින් පසුව රජය සෑම ක්ෂේත්‍රයක ම පුළුල් වූ ප්‍රතිසංස්කරණ මාලාවක් ඇති කළ යුතු බව. මේ සඳහා බලාත්මක රාජ්‍ය මූල්‍ය නීති පද්ධතියක් තිබිය යුතුයි. පවතින රජය මේ බොහෝ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටියත් එහි මන්දගාමී ස්වරූපයක් දක්නට ලැබෙන්නේ ජනාධිපතිවරයා ඇතුළු නිලධාරීන් ආර්ථිකය පිළිබඳ ව සිතමින් කටයුතු කරද්දී ඇතැම් පිරිස් තවමත් දේශපාලනය සඳහා යොමු වීම හේතුවෙන්. එම නිසා රටක් ලෙස සියලු ම පිරිස් මූලික ව ක්‍රියා කළ යුත්තේ රටේ ආර්ථිකය ගොඩ ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීමට.

සාකච්ඡා කළේ
**දීප්ත කුමාර බටගොඩ**



# තායි-ලංකා මිතුදම

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**

ශ්‍රී ලංකාවේ 76 වැනි නිදහස ඉතිහාසගත වන්නේ සියවස් ගණනක් ඉපැරැණි තායි-ලංකා සබඳතාව තවත් දැඩි ව තහවුරු කළ අවස්ථාවක් ලෙසට ය. ඒ, මෙවර නිදහස් උළෙලේ විශේෂ ආරාධිතයා ලෙස තායිලන්ත අගමැති ශ්‍රෙත්තා තාවිසින් සහභාගි වීමත් සමගිනි. තායිලන්තය සහ ශ්‍රී ලංකාව අතර නිදහස් වෙළෙඳ ගිවිසුම (SLTFTA) ඇතුළු තවත් සහයෝගිතා ලේඛන කිහිපයකට අත්සන් තැබීම එහිදී කැපී පෙනිණි. ඒ, ලොව ප්‍රධාන බෞද්ධ රටවල් දෙක අතර සිදුවූ ඉතිහාසගත ගනුදෙනුවකට නැවත පණ පෙවුණු අවස්ථාවක් හැටියට ය.

නිදහස් වෙළෙඳ ගිවිසුමේ මූලික අරමුණ වුණේ දෙරට අතර වෙළෙඳ, සංචාරක, ධීවර සහ කෘෂිකාර්මික ඇතුළු ක්ෂේත්‍ර රැසක් ඔස්සේ සබඳතා ශක්තිමත් කර ගැනීම ය. එහි මූලික කාර්යයන් 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණි. ඒ අනුව මෙහි පළමු සාකච්ඡා වටය 2018 ජූලි මාසයේ සහ දෙවැනි සාකච්ඡා වටය 2018 සැප්තැම්බර් මාසයේ තායිලන්තයේ බැංකොක් නුවරදී පැවැත්විණි. එහෙත් මෙය ක්‍රියාත්මක වීම කල්ගත වුණේ කොවිඩ් 19 ගෝලීය වසංගතය හේතුවෙනි. ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ මැදිහත්වීම නිසා මෙහි තෙවැනි සාකච්ඡා වටය 2023 ජනවාරි මස 09 සහ 10 දෙදින කොළඹදී පැවැත්විණි. 2024 නිදහස් සැමරුමට පෙර දින (03) පස්වරුවේ ජනාධිපති කාර්යාලයේදී තායිලන්ත නියෝජ්‍ය අග්‍රාමාත්‍ය සහ එරට වාණිජ අමාත්‍ය ෆුම්තාම් වෙචයචායි සහ ශ්‍රී ලංකාවේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය නලින් ප්‍රනාන්දු මෙම නිදහස් වෙළෙඳ ගිවිසුමට අස්සන් තැබී ය.

අග්නිදිග ආසියාව සමග සබඳතා පුළුල් කර ගැනීම සහ කලාපයේ ශක්තිමත් ආර්ථික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීම ශ්‍රී ලංකාවේ නව විදේශ ප්‍රතිපත්තියට අයත් ප්‍රධාන අරමුණකි. ශ්‍රී ලංකා-



තායිලන්ත අගමැති ශ්‍රෙත්තා ත මහතා විසින් ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා පිළිගත් අවස්ථාව

නිදහස් වෙළෙඳ ගිවිසුමේ මූලික අරමුණ වුණේ දෙරට අතර වෙළෙඳ, සංචාරක, ධීවර සහ කෘෂිකාර්මික ඇතුළු ක්ෂේත්‍ර රැසක් ඔස්සේ සබඳතා ශක්තිමත් කර ගැනීම ය. එහි මූලික කාර්යයන් 2016 වර්ෂයේ ආරම්භ කර තිබුණි.

තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම එහි සුවිශේෂ අවස්ථාවකි. මෙම ගිවිසුම භාණ්ඩ වෙළෙඳාම, ප්‍රභවස්ථාන රීති, සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක පියවර, වෙළෙඳාමට ඇති තාක්ෂණික බාධක, වෙළෙඳ ප්‍රතිකර්ම, සේවා වෙළෙඳාම, ආයෝජනය, රේගු ක්‍රියාපටිපාටිය සහ වෙළෙඳ පහසුකරණය, ආර්ථික සහයෝගිතාව, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, මූලික ප්‍රතිපාදන, ආයතනික හා අවසාන ප්‍රතිපාදන, විනිවිදභාවය සහ ආරවුල් විසඳීම යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පරිච්ඡේද 14කින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර ද්විපාර්ශ්වික ගුවන් සේවා ගිවිසුමකට ද මෙහිදී අස්සන් තැබුණි. 1950 වසරේ එළැඹි ගිවිසුම ශක්තිමත් කරමින් මෙම නව ගිවිසුමට අත්සන් තැබුණු අතර මෙහි අපේක්ෂාව වූයේ දෙරට අතර ගුවන් සේවා සබඳතා සහ නියාමන රාමු වැඩිදියුණු කිරීම ය. ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය (GJRTI) සහ තායිලන්ත මැණික් හා ස්වර්ණාභරණ ආයතනය (GIT) අතර සහයෝගිතාව වැඩිදියුණු කිරීමේ අවබෝධතා ගිවිසුමකට ද මෙහිදී අත්සන් තැබුණි. ලොව හොඳම මැණික් ශ්‍රී ලංකාව සතු අතර ජාත්‍යන්තර වෙළෙඳපොළේ හොඳම මැණික් අලෙවිකරු වන්නේ තායිලන්තයයි. ගිවිසුමෙන් සිදු වුණේ මෙම විශිෂ්ටයන්ගේ එක්වීම ය.

ශ්‍රී ලංකාව කලාපීය විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්වයට (RCEP) සම්බන්ධ වීමට අයදුම් කර අවසන් අතර එම කාර්යයට තායිලන්තයේ සහාය අතිශය වැදගත් වේ. වෙළෙඳ සහ අයෝජන අවස්ථාවලට අදාළ ව මෙතෙක් දෙරට අතර අවධානය යොමු නොවූ නව ක්ෂේත්‍ර පිළිබඳ ව ද මෙහිදී කතාබහ කෙරුණි. කොළඹ වරාය නගරයේ සුඛෝපභෝගී හෝටල් සඳහා තායිලන්ත ආයෝජන වෙනුවෙන් තිබෙන අවස්ථා, රාජ්‍ය ව්‍යවසායකි (SOEs) ද පෞද්ගලික ආයෝජන සිදු කිරීමට තායිලන්තයට පවතින හැකියාව මෙන් ම විශේෂයෙන් ඇසුරුම්කරණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs) සඳහා තායිලන්ත ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයෙන් (TICA) ශ්‍රී ලංකාවට ලැබෙන තාක්ෂණික සහාය පිළිබඳ ව ද එම කතාබහේදී අවධානය යොමු විය.


ආයෝජන, ධීවර සහ කෘෂිකාර්මික

ක්ෂේත්‍රයට අදාළ ව දෙරට අතර සහයෝගිතාව ශක්තිමත් කර ගැනීම, සමුද්‍රීය සහයෝගිතාව ශක්තිමත් කිරීමේ වැදගත්කම මෙහිදී අවධාරණයට ලක්වූ අනෙකුත් කාරණා අතර විය. ජාත්‍යන්තර අපරාධ මැඩපැවැත්වීම සඳහා බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමේදී දෙරට අතර සහයෝගිතා වැඩපිළිවෙළක අවශ්‍යතාව සහ ඒ වෙනුවෙන් තායිලන්තය සහ ශ්‍රී ලංකාව අතර ආරක්ෂක සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීමට ද මෙහිදී යෝජනා විය. බෞද්ධ ආගමික සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම, සමුද්‍රීය සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ දෙරට අතර ගුවන් සම්බන්ධතා වැඩිදියුණු කිරීම, සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍ර හිමියන් සඳහා වීසා රහිත ව දෙරට අතර ගමන් කිරීමට අවස්ථාව සැලසීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම, බිම්ස්ටෙක් (BIMSTEC), ඉන්දියානු සාගර කලාපීය වටද්දර රටවල සංගමය (IORA), ආසියානු සහයෝගිතා කතිකාව (ACD) සහ ආසියාන් කලාපීය සංසදය (ASEAN) වැනි කලාපීය සංසදවල (ARF) සහයෝගිතාව සාකච්ඡාවට ලක් වූ කාරණා අතරට එක් විය.

2005 වසරේ සිට 2022 වසර දක්වා කාලයේ තායිලන්තය ඇමරිකානු ඩොලර් මිලියන 92කට අධික සෘජු විදේශ ආයෝජන ශ්‍රී ලංකාවේ සිදු කර තිබේ. ශ්‍රී ලංකාව 2022 වර්ෂයේදී තායිලන්තයට අපනයනය කර ඇති භාණ්ඩ වටිනාකම පමණක් ඇමරිකානු ඩොලර් මිලියන 58.82ක් විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ ප්‍රවර්ධනය කිරීමට ඇති ශක්‍යතාව තායිලන්තය සමග නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළැඹීමේදී බලපෑ ප්‍රමුඛ කාරණයකි. දෙරට අතර 2018 වසරේදී එවකට පැවති ද්විපාර්ශ්වික වෙළෙඳ ගනුදෙනු වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 550ක් විය. මේ ගිවිසුමෙන් අපේක්ෂා කරන්නේ එය ඇමරිකානු ඩොලර් බිලියන 1.5 දක්වා වැඩි කර ගැනීමට ය.

ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර මෑතකාලීන රාජ්‍ය තාන්ත්‍රික සබඳතා 1955 වසරේදී ආරම්භ වුවත් දෙරට අතර ආගමික සබඳතාව දඹදෙණි යුගයේදී හෝ ඊටත් ප්‍රථම ඇති වූ බව පරසිඳු වූවකි. ඒ, සියම් දේශයේ සුඛෝදය නම් රාජධානියේ මුල් ම රජු ලෙස හැඳින්වෙන රෝච රජුගේ කාලයේදී ය. මේ සමයෙහි එනම් 13 වැනි සියවසේ ප්‍රථම භාගයෙහි අද්භූත බලයක් සහිත බුද්ධ ප්‍රතිමාවක් මෙරට සිට සියමට වැඩම වූ බවට 'ජිනකාලමාලිනිය' නමැති පුරාණ පාලි ග්‍රන්ථයේ සවිස්තරාත්මක ව සඳහන් ව ඇත. තායි බසින් මේ විශිෂ්ට ප්‍රතිමාව හැඳින්වෙන්නේ 'ප්‍රාඃ සිහිං' නමිනි.

ජනාධිපති කාර්යාලයේ අමුත්තන්ගේ පොතේ තායිලන්ත අගමැති සමරු සටහන් තබමින්





ශ්‍රී ලංකා අගමැති දිනේෂ් ගුණවර්ධන මහතා තායිලන්ත අගමැති හමු වූ අවස්ථාව

ක්‍රි.ව. 1355-1385 සමයේ දිඹුලාගල වනවාසී සංඝරාජ මාහිමියන් අනුදැනුමෙන් සුමන නම් තෙර නමක් ලක්දිව සිට බෝධි අංකුර, සර්වඥ ධාතු රැගෙන වැඩමකොට ධර්ම විනය පිළිබඳ සිංහල චාරිත්‍රය තායි රට සංඝයාට හඳුන්වා දුන් බවත් 'ජිනකාලමාලිනියේ' සඳහන් වේ. මේ ඉතිහාසගත සිදුවීම් තායි-ශ්‍රී ලංකා සංස්කෘතික සම්බන්ධතාවේ මූලික පදනම වශයෙන් නම් කළ හැකියි.

ක්‍රි. ව. 1425 වන විට තායි දේශයේ බුදු සමය පැවතුණේ පිරිහෙමින් ය. එහිදී තායි භික්ෂූන් 33 නමක් කැලණියට වැඩම කර එහි නායක ව විසූ වනරතන හිමි පාමුල උපසම්පදාව ලබා ආපසු තායිලන්තයට වැඩම කළ අයුරු ඉතිහාසයේ සඳහන් වේ. එහෙත් මෙලෙස 14 වැනි සියවසේ මෙරටින් තායිලන්තයට ගෙන ගිය පිරිසුදු බුදුදහම නැවත 18 වැනි සියවසේදී ලංකාව වෙත ගෙන ඒමට කටයුතු යෙදී තිබුණේ දෛවෝපගත අයුරිනි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජු දවස වැලිවිට සරණංකර හිමිගේ බලවත් උත්සාහය මත පට්ටිවෙල මොහොට්ටාලලාගේ නායකත්වයෙන් උපසම්පදාව ගෙන ඒමට දූත පිරිසක් තායිලන්තයට යැවූ කතාව සුප්‍රකට ය. එම තායි උපසම්පදාවත් සමග සියම්-ලංකා සබඳතාව ආගමික වශයෙන් යළිත් පෝෂණය වූ අතර අනෙක් පසින් දේශපාලන වශයෙන් ද සමාජය කෙරෙහි බලපෑම් දැඩි කිරීමට හේතු වූ බව ඉතිහාසයේ සඳහන් වේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සිහසුනෙන් පලවාහැර බෞද්ධ රජකු සිහසුනට පත්කර ගැනීමට වර්ෂ 1760දී සිදු වූ කුමන්ත්‍රණය මේ සඳහා නිදසුනකි. එහිදී රජු ඉවත්කර අනුප්‍රාප්තිකයා වශයෙන් තෝරාගන්නට ගියේ ද සියම් කුමාරයෙකි.

ලංකා බෞද්ධ පුනර්ජීවනයේදී සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළ යතිවරයාණ කෙනෙකුන් වූ වස්කඩුවේ සුභූති හිමියන්ගේ ශාස්ත්‍රීය දැනුම තායිලන්තයේ බෞද්ධ ප්‍රභූන්ගේ පවා ගෞරවයට ලක් විය. මේ බව තහවුරු වන්නේ තායි රජ පවුලේ කෙනකු වූ 'ප්‍රින්ස් ජුම්සායි' නමැති බුද්ධිමතා සුභූති හිමියන්ගේ ශිෂ්‍ය නමක් හැටියට ලංකාවේදී පැවිදි වීමෙනි. උන්වහන්සේ හැඳින්වුණේ 'ජිනවරවංශ' හෙවත් 'සියම් කුමාර හිමියන්' ලෙස ය. මේ හිමියන් වැඩ සිටියේ කොටහේනේ පිහිටුවන ලද අමරපුර නිකායට අයිති දීපදුත්තාරාමයේ ය. සියම් ක්‍රමයට එහි විහාරයක් තනා ඇති නිසාත් සියම් කුමාර හිමි එහි පදිංචි ව සිටි නිසාත් මේ පන්සල 'සියම් පන්සල' යනුවෙන් අදත් හඳුන්වන අතර එය තායි-ලංකා ඉපැරැණි සබඳතාවේ මුදුන් මල්කඩකි.



ජෝකෝ විදෝදෝ

# විශාලතම එක්දින සංකීර්ණ මැතිවරණය

**නිහාල් පීරිස්**




ප්‍රබෝවෝ සුබියන්තෝ

ලෝකයේ මැතිවරණ අතර විශේෂත්වයක් ගන්නා මැතිවරණයක් 2024 පෙබරවාරි මාසයේ පැවැත්විණි. ඒ, අග්නිදිග ආසියානු රටක් වන ඉන්දුනීසියාවේ මැතිවරණයයි. ලොව විශාලතම මැතිවරණය ලෙස සැලකෙන්නේ ඉන්දියාවේ මහා මැතිවරණය වුවත් එය එක් දිනක අවසන් වන්නක් නොවේ. දින ගණනක්, අදියර කිහිපයක් යටතේ පැවැත්වෙන්නකි.

මේ නිසා ඉන්දුනීසියාවේ මැතිවරණය ලොව විශාලතම එක් දින මැතිවරණය ලෙස සැලකේ. ඊට එක් හේතුවක් වන්නේ එහිදී ඡන්දය ලබාදෙන සංඛ්‍යාවයි. මෙවර මැතිවරණයේදී මිලියන 205කට ආසන්න සංඛ්‍යාවක් ඡන්දය ලබා දීමට සුදුසුකම් ලබා සිටියහ. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ඡන්දදායකයන් ගණන මිලියන 17ක් පමණ වේ. ඉන්දියාවේ ද අප්‍රේල්- මැයි මාසවල මහා මැතිවරණය පැවැත්වෙන අතර එහිදී මිලියන 900කට වැඩි පිරිසක් ඡන්දය දීම සඳහා ලියාපදිංචි වී සිටිති.

ඉන්දුනීසියාවේ මැතිවරණය ලොව විශාලතම එක් දින මැතිවරණය මෙන් ම සංකීර්ණ ම මැතිවරණය ලෙස ද සැලකේ. එයට හේතුව ආයතන රැසක් වෙනුවෙන් නියෝජිතයන් පත් කර ගැනීමේ ඡන්ද විමසීම් මෙහිදී එක වර පැවැත්වීමයි. ජනාධිපතිවරයා මෙන් ම උප ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීම් ද පාර්ලිමේන්තු මැතිවරණය ද ප්‍රාදේශීය ආයතන සඳහා නියෝජිතයන් තෝරා ගැනීමේ මැතිවරණ ද මේ ආකාරයෙන් එකවර පැවැත් වේ.

පෙබරවාරි 14 දින පැවැති මැතිවරණයේදී මෙම සියලු ආයතන වෙනුවෙන් අපේක්ෂකයන් 10,000කට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් ව සිටි බව සඳහන් වේ. ජනතාවට ඡන්දය භාවිත කිරීම සඳහා ඡන්දපොළ ලක්ෂ 08කට වැඩි සංඛ්‍යාවක් පිහිටුවා තිබිණි. ඉන්දුනීසියාවට අයත් දූපත් විශාල සංඛ්‍යාවක් පවතින අතර ඒ අතරින් 6,000ක පමණ ජනතාව ජීවත් වෙති. මේ දූපත් ඉතා විශාල ප්‍රදේශයක පැතිර පවතින නිසා ඒවා සියල්ලක ම ඡන්දය පැවැත්වීම ඉතා සංකීර්ණ කාර්යයක් බවට පත් වේ.

මෙවැනි දැවැන්ත සහ සංකීර්ණ මැතිවරණයක් පැවැත්වීම ඉතා වෙහෙසකර කටයුත්තක් වන අතර 2019 වසරේ මැතිවරණය අවස්ථාවේ ඡන්ද ගණන් කිරීමේ කටයුතුවල නිරත වී සිටි නිලධාරීහු 270කට ආසන්න සංඛ්‍යාවක් අධික වෙහෙස නිසා ඇති වූ විවිධ සංකූලතා හේතුවෙන් මරණයට පත් වූහ. දින ගණනක් නිදි වරාගෙන එක දිගට වැඩ කිරීමට එරට ඡන්ද ගණන් කිරීමේ නිලධාරීන්ට සිදු ව තිබූ බව සඳහන් විය.

මෙවර මැතිවරණය පැවැත්වූයේ පෙබරවාරි 14 දින වුවත් අවසන් නිල ප්‍රතිඵල නිකුත් වීමට නියමිත ව ඇත්තේ මාර්තු මාසයේ ය. නිල නොවන මූලික ප්‍රතිඵල නිකුත් වී තිබේ. මේ ප්‍රතිඵල නිකුත් කරනු ලබන්නේ ද රජයේ අනුමැතියලත් ආයතන විසිනි. මේ නිසා අවසන් ප්‍රතිඵල පිළිබඳ නිවැරදි අදහසක් ඇති කර ගැනීමට මූලික ප්‍රතිඵලවලින් හැකිවන බව විශ්වාස කෙරේ.

ඉන්දුනීසියාවේ ආයතන රැසක් සඳහා එකවර මැතිවරණ පැවැත්වුණත් ඒ අතරින් වඩාත් ම අවධානයක් දිනාගන්නේ ජනාධිපතිවරණයයි. මෙවර ද එය ඒ ආකාරයෙන් ම විය. ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෝ තිදෙනෙක් තරග කළහ. ඒ, ප්‍රබෝවෝ සුබියන්තෝ, ගන්ජාර් ප්‍රනෝවෝ, අනීස් බස්වේදන් යන තිදෙනායි. ඉන්දුනීසියාවේ බලයේ

සිටින්නේ ජනතාව අතර අතිශයින් ජනප්‍රිය ජනාධිපතිවරයෙකි. 62 වැනි වියෙහි පසුවන ජෝකෝ විදෝදෝ මේ වන විට ධුර කාල 02ක්, වසර 10ක් රට පාලනය කර තිබේ. එහෙත් තවමත් ජනතාව ඔහුට දැඩි ලෙස ආදරය කරන බව සඳහන් වේ. මෙවර ජනාධිපතිවරණයට ඔහු ඉදිරිපත් නොවුණේ ඉන්දුනීසියානු ව්‍යවස්ථාවට අනුව දෙවරකට වඩා ජනාධිපති ධුරයට දැරීමට හැකියාවක් නැති බැවිනි. එහෙත් ඔහුගේ සහය ලැබූ සහ ඔහුගේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන බවට පොරොන්දු වූ අපේක්ෂකයෙක් මෙවර ඉදිරිපත් ව සිටියේ ය. ඒ, ප්‍රබෝවෝ සුබියන්තෝ ය. 72 හැවිරිදි ප්‍රබෝවෝ එරට ආරක්ෂක ඇමැතිවරයා ලෙස ද ක්‍රියා කරයි.

ජනාධිපතිවරණයෙන් පසු නිකුත් ව ඇති මූලික ප්‍රතිඵල අනුව ඉදිරියෙන් සිටින්නේ ද ප්‍රබෝවෝ සුබියන්තෝයි. ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 53%-59%ත් අතර ඡන්ද සංඛ්‍යාවක් ඔහු දිනාගෙන සිටින බව අනාවරණය වේ. ඔහු සමග තරග කළ අනීස් බස්වේදන් 23%-26% අතර ඡන්ද සංඛ්‍යාවක් ද ගන්ජාර් ප්‍රනෝවෝ 16%-17% අතර ඡන්ද සංඛ්‍යාවක් ද හිමි කරගෙන සිටිති. ප්‍රබෝවෝ ජයගනු ඇති බව මැතිවරණයට පෙර සිට ම ජනමත සමීක්ෂණවලින් ප්‍රකාශ වී තිබුණත් මෙතරම් විශාල පරතරයකින් ජය ගනු ඇති බවක් කිසිවකුත් බලාපොරොත්තු වූයේ නැත.

ප්‍රබෝවෝගේ මේ ජයග්‍රහණයත් සමග ඇතැම් පාර්ශ්ව තුළ යම් අවිනිශ්චිතතාවක් සහ බියක් මතු වී ඇති බවක් ද දැකිය හැකි වේ. ඒ, ඔහුගේ පාලනය යටතේ ඉන්දුනීසියාව නැවත ඒකාධිපතිවාදයක් කරා ගමන් කරනු ඇත් ද යන සැකය නිසා ය. මෙවැනි සැකයක් ඇති වීමට හේතු වී ඇත්තේ ප්‍රබෝවෝගේ අතීත ක්‍රියාකාරකම් ය.

ඔහු කලක් හමුදාවේ උසස් නිලයක් දැරූ කෙනෙකි. ප්‍රබෝවෝ හමුදාවේ සේවය කළේ ඒකාධිපතියකු ලෙස සැලකුණු සුහර්තෝගේ කාලයේයි. මේ කාලයේ සුහර්තෝගේ පාලනයට එරෙහි ව පැන නැගුණු ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාර මර්දනය කිරීමේදී ප්‍රබෝවෝ ද විශාල කාර්යභාරයක් ඉටු කළ බව පිළිගැනේ. මේ ව්‍යාපාරවලට සම්බන්ධ ක්‍රියාකාරිකයන් පැහැරගෙන යාම සහ ඔවුන්ට වධ හිංසා කිරීම වැනි ක්‍රියාවලට ඔහු සම්බන්ධ බවට චෝදනා එල්ල වී තිබිණි. නවසිය අනූව දශකයේ මේ ආකාරයෙන් ක්‍රියාකාරිකයන් 23 දෙනකු පැහැරගෙන යාමේ සිද්ධියක් මහත් ආන්දෝලනයක් ඇති කළේ ය. එම 23 දෙනාගෙන් 13 දෙනකු තවමත් ආගිය අතක් නැත.

මෙයට අමතර ව තවත් මානව හිමිකම් උල්ලංඝන ගැන ප්‍රබෝවෝට චෝදනා එල්ල වී තිබූ අතර මේ චෝදනා නිසා මෑතක් වනතුරු ම ඔහුට ඇතැම් රටවලට ඇතුළුවීම පවා තහනම් කර තිබිණි. දරුදඬු පුද්ගලයකු ලෙස තමා පිළිබඳ පැවැති ප්‍රතිරූපය මකා දැමීම සඳහා මෙවර මැතිවරණ ව්‍යාපාරයේදී ප්‍රබෝවෝ දැඩි උත්සාහයක් ගනු දැකිය හැකි විය. තමා ප්‍රිය මනාප, විනෝදශීලී සීයා කෙනකු ලෙස පෙන්වීමට ඔහු වෑයම් කළේ ය. ප්‍රබෝවෝ නර්තනයේ යෙදෙන ආකාරය දක්වෙන විඩියෝ පවා සමාජ මාධ්‍යයට එක් කර තිබූ අතර ඒවා තරුණ පරපුර අතර බෙහෙවින් ජනප්‍රිය විය. අද ඉන්දුනීසියාවේ සිටින තරුණ පරපුර ප්‍රබෝවෝට අතීතයේ එල්ල වූ චෝදනා ගැන වැඩි අවබෝධයක් නැති පිරිසක් වීම මැතිවරණයේදී ඔහුට වාසියක් විය.

ජනාධිපතිවරණයෙන් ප්‍රබොවෝට ජය හිමි වීමට ප්‍රධාන හේතුවක් වූයේ ඔහු වත්මන් ජනාධිපති විදෙදෝගේ ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යන බවට පොරොන්දු වීමයි. විදෝදෝගේ එක් ඉලක්කයක් වූයේ 2045 වන විට ඉන්දුනීසියාව ලෝකයේ ශක්තිමත් ම ආර්ථික පහෙන් එකක් බවට පත් කිරීම ය. තමා මේ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යන බව ප්‍රබෝවෝ පවසා තිබේ.

විදෝදෝගේ යටිතල පහසුකම් ව්‍යාපෘති ද බෙහෙවින් ආකර්ෂණීය විය. එරට අගනුවර වෙනත් තැනකට රැගෙන යාමේ සැලැස්මක් ද විදෝදෝ යෝජනා කර තිබිණි. එයට හේතුව වත්මන් අගනුවර වන ජකර්තාව ගැටලු ගණනාවකට මුහුණ දී තිබීමයි. එම නගරයේ ජනගහනය විශාල වශයෙන් ඉහළ යාම නිසා ඇති ව තිබෙන ගැටලු ද නගරය කෙමෙන් ගිලා බසිමින් තිබීම ද ඒ අතරින් ප්‍රධාන වේ. නාගරික ඉදි කිරීම් නිසා භූමිය මත ඇති වන පීඩනය ද අභ්‍යන්තර භූ තලවල ඇති වන තත්ත්වයන් ද මේ ගිලා බැසීමට හේතු වී තිබේ. ඉන්දුනීසියාව පිහිටා ඇත්තේ භූමිකම්පා බහුල කලාපයක ය.

නගරය ගිලා බසිමින් තිබීම නිසා මුහුදු ජලය ඒ තුළට ගලා ඒමේ ගැටලුවක් ද මතු ව තිබේ. නව අගනුවර ඉදි කෙරෙන්නේ බෝනියෝ නැමැති දූපතේයි. තමා මේ වැඩපිළිවෙළ ද ඉදිරියට ගෙන යන බවට ප්‍රබෝවෝ පොරොන්දු වී තිබේ.



ඡන්දදායකයෝ

# ඉන්දියන් සාගරය උණුසුම් වෙයි

මොහාන් සමරනායක



මනුෂ්‍යයා ගොඩබිම් සත්ත්වයකු වුවත් ඈත අතීතයේ සිට ම සාගරය ඔවුන්ගේ පැවැත්මට, ජීවන මට්ටමේ වර්ධනයට, අන්තර්ජාතික සබඳතා පවත්වා ගැනීමට ඉමහත් ආධාරයක් වුණා. ඒ නිසා ම අතීතයේ සිට ම බලවත් රාජ්‍ය සාගරය, අඩු ම වශයෙන් තමන්ගේ භූමියට ආසන්න සාගර කලාපය ස්වකීය ආධිපත්‍යය යටතේ තබාගැනීමට උත්සුක වූ බවට සාක්ෂි දකින්නට පිළිවන්. පැරණි රෝම අධිරාජ්‍යය ඒ යුගයට සාපේක්ෂ ව විශාල නාවික හමුදාවක් පවත්වාගෙන ගියා. ඉන්පසුව විශේෂයෙන් කාර්මික විප්ලවයෙන් අනතුරු ව අන්තර්ජාතික වෙළෙඳාම ප්‍රසාරණය වන්නට, ලෝකයේ බලවත් රටවල් අතලොස්සක් අධිරාජ්‍ය ගොඩනගන්නට පටන්ගත් විට සාගරයේ වැදගත්කම තවත් ඉහළ ගියා. 16, 17, 18 ආදී සියවස්වල සිට මේ දක්වා ම ලොව ප්‍රබල රාජ්‍ය ස්පාඤ්ඤය, පෘතුගාලය, ඕලන්දය, ජපානය, රුසියාව, බ්‍රිතාන්‍යය විශාල නාවික බලයක් ගොඩනගා ගත්තා. සාගරයේ විශාල කලාපයක් පාලනය කළා. අන්තර්ජාතික වෙළෙඳාමේ ප්‍රසාරණයට අමතර ව බලවත් ජාතීන් අතලොස්සක් ආධිපත්‍යය හිමි කරගත් ලෝක රටාව බිහිවීමෙන් පසු සාගරයේ වැදගත්කම ආර්ථික ක්ෂේත්‍රයට සීමා නොවී ආරක්ෂාව, ලෝක ආධිපත්‍යය, බලවතුන් අතර තරගය වැනි අංශවලටත් ව්‍යාප්ත වන්නට පටන් ගත්තා. ඒ නිසා ම අද දවස වන විට අතිරේක වැදගත්කමක් සාගරයට හිමි වී තිබෙනවා.

පෘථිවිය මත මනුෂ්‍යයාගේ ප්‍රයෝජනය සඳහා උපයෝගි කරගත හැකි නානාවිධ සම්පත් ප්‍රමාණය කෙමෙන් හීන වන්නට පටන්ගත් පසු මනුෂ්‍යයා තමන්ට අවශ්‍ය සම්පත් සපයා ගැනීමේ මාර්ගයක් ලෙස සාගරය ආක්‍රමණය කරන්නට, එය තමන්ගේ අණසකට යටත් කරගන්නට උත්සාහ ගත්තා. මහා සාගරය නිසැක ව ම සම්පත් ආකරයක්. එම දිය කඳෙන් වැසී අතිදැවැන්ත ස්වාභාවික සම්පත් ප්‍රමාණයක් තිබෙන බව විද්‍යාත්මක ව සනාථ වී අවසන්. මේ නිසා ම ලෝකයේ බලවත් ජාතීන් සාගර කලාප තමන්ගේ අණසක යටතේ පවත්වා ගැනීමේ උත්සාහයක නිරත වුණා. මෑත අවධියේදී 20 වැනි සියවසේ සිට ම මේ තරගයේදී ඉන්දීය සාගරයට ප්‍රමුඛස්ථානයක් ලැබුණා. ඉන්දීය සාගරය ලොව විශාලතම සාගරයක් වන අතර එහි අතිමහත් ස්වාභාවික සම්පත් සම්භාරයක් ගැබ් ව තිබීමයි ඊට හේතුව. විශේෂයෙන් 20 වැනි සියවසේ අගභාග යේදී ලෝකයේ අලුත් බල කේන්ද්‍ර බිහිවීමත් සමග ම මේ සාගරය තමන්ගේ පාලනය යටතේ තබාගැනීමේ තරගය උත්සන්න වුණා.

පසුගිය සියවසේ දෙවැනි භාගයේදී ඉන්දීය සාගරයේ මහා බලවතුන්ගේ තරගය, වඩාත් ප්‍රමුඛ ව ඇමරිකා එක්සත් ජනපදය සහ එදා පැවති සෝවියට් දේශය අතර තරගය උත්සන්න වෙමින් තිබුණා. ඒ නිසයි 1970 දශකයේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ න්‍යාය පත්‍රයට ඉන්දීය සාගරය සාම කලාපයක් බවට පත්කිරීමේ යෝජනාව ඉදිරිපත් වුණේ. මේ යෝජනාව ගෙන ඒමේදීත් ඒ පිළිබඳ සංවාදය ගොඩනැගීමේදීත් ශ්‍රී ලංකාව විශාල දායකත්වයක් දුන්නා. අද දවස වන විට ඉන්දීය සාගරය මහා බලවතුන්ගේ තරග බිමක් බවට පත්වී තිබෙනු දකින්නට පිළිවන්. එහි ප්‍රතිඵලයක් වශයෙනුයි ඇමරිකා එක්සත් ජනපදය 2015 වසරේ පමණ සිට නිදහස් හා විවෘත ඉන්දු පැසිපික් කලාපයක් පිළිබඳ ව්‍යාපෘතියක් ප්‍රචලිත කරන්නට, සමාජගත කරන්නට පටන් ගත්තේ. ඉන්දිය සාගරයට හිමි මේ සුවිසල් වැදගත්කම නිසා ඉන්දීය සාගරය මුල්කරගෙන කලාපීය අන්තර්ජාතික හවුල්, සංවිධාන ගණනාවක් ගොඩනැගී තිබෙනවා. ඉන්දීය සාගර වළල්ලේ පිහිටි රටවල සංගමය (Indian Ocean Rim Association), BIMSTEC යන අකුරුවලින් හැඳින්වෙන බහු ආංශිය තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා ව පිළිබඳ බෙංගාල බොක්ක ප්‍රවේශය ඊට නිදර්ශන. අද BIMSTEC සාර්ක් සංවිධානය අභිභවා ඉදිරියට පැමිණ තිබෙනවා.

එසේ ඉන්දීය සාගරය මුල්කොට ගෙන බිහිවූ සංවිධාන අතර තවත් ප්‍රමුඛ සංවිධානයක් වන්නේ ඉන්දීය සාගර සමුළුව (Indian ocean conference). ඉන්දීය සාගර සමුළුව ආරම්භ වන්නේ වසර 2016දී. එහි ප්‍රථම රැස්වීම පැවැත්වුණේ සිංගප්පූරුවේ. ඉන් පසුව ශ්‍රී ලංකාවේත් එය පැවැත්වුණා. ඉන්දීය සාගර සමුළුවේ හත්වැනි වාර්ෂික සමුළුව 2024 පෙබරවාරි මස 09, 10 දෙදින ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේදී

පවත්වනු ලැබුවා. එය සංවිධානය කළේ Perth US Asia Centre නමැති ආයතනයක් මුල්වීමෙන්. ඒ ආයතනයට ‘Indian foundation’ නැත්නම් ඉන්දීය පදනම නමැති ඉන්දීය විදේශ අමාත්‍යාංශයට අනුබද්ධ සංවිධානයත් සහය වුණා. මෙවර ඕස්ට්‍රේලියාවේ පර්ත් නගරයේ පැවැති ඉන්දීය සාගර සමුළුවේ හත් වැනි සැසිවාරයට රටවල් 30ක පමණ රාජ්‍ය නායකයන්, විදේශ ඇමතිවරුන් සහ නියෝජිත කණ්ඩායම් සහභාගි වී සිටියා. ඒ සහභාගිත්වයේ මුළු සංඛ්‍යාව 400ක් පමණ. ශ්‍රී ලංකාවෙන් සමුළුවට සහභාගි වුණේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ.

සමුළුවට සහභාගි වූ රටවල් අතර ඕස්ට්‍රේලියාව, ශ්‍රී ලංකාව, ඉන්දියාව, බංග්ලාදේශය, මාලදිවයින, වියට්නාමය, මුරුසිය ආදි රාජ්‍ය සිටියා. ‘ස්ථාවර සහ ධරණීය ඉන්දීය සාගරයක් උදෙසා’ (Towards a stable and sustainable Indian ocean) යන්නයි මෙවර ඉන්දීය සාගර සමුළුවේ තේමාව වුණේ. මේ සමුළුව ආරම්භයේ මුඛ්‍ය දේශනය කළේ ඉන්දියාවේ විදේශ අමාත්‍ය ආචාර්ය සුබ්‍රමානියම් ජායිශංකර්. ඔහු ඉන්දීය සාගරයේ වාණිජ, ආර්ථික සහ උපාය මාර්ගික වැදගත්කම ගැන අදහස් පළ කරමින් ඉන්දීය සාගරය ආශ්‍රිත රටවලට මුහුණපෑමට සිදු ව ඇති අභියෝග ගැන කෙටියෙන් පැහැදිලි කළා. ඉන්දියන් සාගරයේ සාමය සහ ආරක්ෂාව, බාධා විරහිත නාවික ගමනාගමනය, මුහුදු කොල්ලකරුවන්ගෙන් එල්ල වන තර්ජනය ආදී වූ අභියෝග සහ විශේෂයෙන් ම පාරිසරික විපර්යාසය නිසා හටගෙන ඇති අභියෝග ගැන සඳහන් කළ ඔහු මේ අභියෝග ජයගැනීම සඳහා කලාපීය රටවල්, ඉන්දීය සාගර ආසන්න රටවල් අතර පෙරට වැඩි අදහස් හුවමාරුවක් හා සහයෝගිතාවක් අවශ්‍ය බව අවධාරණය කළා. පර්ත් ඉන්දීය සාගර සමුළුවේදී දේශනයක් කළ ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා බොහෝ දේශපාලනික සංකීර්ණතා ගැන අවධාරණය කළා. ඔහුත් ඉන්දීය සාගරයේ ආරක්ෂාව සහ ස්ථාවරත්වය පවත්වා ගැනීම, දේශගුණික විපර්යාසය නිසා උද්ගත ව ඇති ගැටලු ජයගැනීම සඳහා වර්ධනය කළ යුතු සහයෝගිතාව විශේෂයෙන් අවධාරණය කළා. මේ සහයෝගිතාව ගොඩනැගීමේදී නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරය, ඊට උපත දුන් 1955 බැන්ඩුන් සමුළුව ආදර්ශයක් කොටගත හැකි බව ජනාධිපතිවරයාගේ දේශනයේ සඳහන් වුණා. මෙවර ඉන්දීය සාගර සමුළුවේදී සාකච්ඡා වූ කරුණු අතර සමුද්‍රීය දේශපාලනික උපාය මාර්ගික අභියෝග මුල්තැනක් ගත්තා. එම සංවාදයේදී ඉන්දීය සාගරයේ සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම, මහා බලවතුන්ගේ තරගය නිසා ඇති විය හැකි විපාක හඳුනාගෙන ඊට පිළියම් යෙදීම, ඉන්දීය සාගර කලාපීය රටවල් ඇතුළත සහ රටවල් අතර හටගෙන ඇති ගැටුම් නිරාකරණය, නාවික ප්‍රවාහනයට එල්ල වී ඇති විවිධාකාර තර්ජන, මුහුදු කොල්ලකරුවන්ගේ අභියෝග, නාවික ගමනාගමනය සඳහා තිබිය යුතු නිදහස ආදිය පිළිබඳ ව සාකච්ඡා කළා. විශේෂ අවධානයක් යොමු වුණා පාරිසරික

> ඉන්දීය සාගර සමුළුව පිටුපස තිබෙන යථාර්ථය මේ සමුළුවේදී එළියට පැමිණියේ නැහැ. එම යථාර්ථය වන්නේ ඉන්දීය සාගරයේ බලය හිමිකර ගැනීමට ලෝකයේ බලවත් රාජ්‍ය, විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, චීනය, ජපානය අතර පවත්නා වූ සීතල තරගය. එය දැන් උණුසුම් වෙමින් තිබෙනවා.

අභියෝගය ජයගැනීම එනම් පාරිසරික විපර්යාසය නිසා උද්ගත ව ඇති ප්‍රශ්න පිළිබඳ ව. විශේෂයෙන් විටින් විට නිරතුරු ව ඇති වන ස්වාභාවික විපත් කළමනාකරණයට ප්‍රමුඛස්ථානයක් දිය යුතු බවත් එහිදී ඊට සහභාගිවූ නියෝජිතයන් පෙන්වා දුන්නා. සමුළුවේ අවධානයට ලක්වූ තවත් මාතෘකාවක් වුණා ‘වත්මන් ගෝලීයකරණයේ පවත්නා වූ ව්‍යුහාත්මක ස්වභාවය ජනිත කර ඇති අභියෝග’. ගෝලීයකරණ ක්‍රියාදාමය ඉදිරියට යන විට එහි පවත්නා වූ අසමානතාව, ධනවත් රටවලට වැඩි වාසි හිමිවන අසමබර වර්ධනය සහ වෙළෙඳාමේ ප්‍රසාරණය දිළිඳු සහ කුඩා රටවලට අවාසියක් බවයි එහිදී සඳහන් කෙරුණේ. මේ අභියෝග ජයගැනීම සඳහා සමුළුවේදී හඳුනාගත් විසඳුම් ලෙස කලාපීය රටවල් අතර අන්‍යෝන්‍ය උපදේශනය, නිතර නිතර ඒ ඒ ප්‍රශ්න පිළිබඳ රටවල් අතර අදහස් හුවමාරුව, සහයෝගිතා වර්ධනය, තාක්ෂණික දැනුම බෙදාහදා ගැනීම, අභියෝග ජයගැනීම සඳහා සාමූහික ක්‍රියාමාර්ග සැලසුම් කිරීම ආදී යෝජනා මුල්තැන ගත්තා.

ඉන්දීය සාගර සමුළුව පිටුපස තිබෙන යථාර්ථය මේ සමුළුවේදී එළියට පැමිණියේ නැහැ. එම යථාර්ථය වන්නේ ඉන්දීය සාගරයේ බලය හිමිකර ගැනීමට ලෝකයේ බලවත් රාජ්‍ය, විශේෂයෙන් ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, චීනය, ජපානය අතර පවත්නා වූ සීතල තරගය. එය දැන් උණුසුම් වෙමින් තිබෙනවා. ඒ තරගයේදී එක්සත් ජනපදය, ඉන්දියාව, ජපානය, ඕස්ට්‍රේලියාව ආදී ප්‍රමුඛ රටවල් චීනයට එරෙහි ව්‍යාපෘතියකට සන්ධානගත වී තිබෙනු දකින්නට පිළිවන්. සමුළුවට සහභාගිවුණු ඉන්දීය විදේශ ඇමතිවරයා ඍජු ව සඳහන් නොකළත් ඔහුගේ කතාවේ ගැබ් ව තිබුණා ඉන්දීය සාගරයේ ආරක්ෂාවට එල්ල වී ඇති සැඟවුණු අභියෝග පිළිබඳ ව. මේ රටවල් අතර තිබෙනවා ඉන්දීය සාගර සමුළුවේ සාමාජිකයන් කිහිපදෙනකු එකතු වී ගොඩනගාගත් යුදමය ස්වරූපයක් ගත් සන්ධානයක් ‘ක්වාඩ්’ යනුවෙන්. ‘ක්වාඩ්’ යනු ‘චතුර්ථක ආරක්ෂක සංසදය’. මේ සංසදයට අයිති වනවා ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, ජපානය සහ ඉන්දියාව. ක්වාඩ් සංසදයේ අප්‍රකාශිත අරමුණ, චීනයේ අභියෝගය ජයගැනීම මර්දනය කිරීම. මේ කටුක යථාර්ථය පර්ත් නුවර පැවැති හත්වැනි ඉන්දීය සාගර සමුළුවේදී එළියට පැමිණියේ නැහැ. එම යථාර්ථය නිවැරදි ව හඳුනාගෙන, සාමකාමී ලෙස නිරාකරණය කිරීමට කලාපීය රටවල් අසමත් වුවහොත් ඉන්දීය සාගරය ගැටුම් කලාපයක් බවට පත්වීම වළක්වන්නට බැහැ.

සටහන

**කාංචනා සිරිවර්ධන**

# ඇයට ශක්තිය දැයට ප්‍රගතිය



සෑම වසරක ම මාර්තු මස 08 දින ජාත්‍යන්තර කාන්තා දිනය (International Women's Day - IWD) සැමරේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත් කළ Invest in Women; Accelerate Progress යන තේමාව අනුව යමින් 2024 වර්ෂයේ ද කාන්තා දිනය ලොව සැමරෙනු ඇත. ශ්‍රී ලංකාවේ කාන්තා දින සැමරුම් තේමාව වන්නේ 'ඇයට ශක්තිය - දැයට ප්‍රගතිය' යන්නයි. වසරක් පාසා කාන්තාව විෂයෙහි එලෙස සැමරුම් සිදුවුව ද 'කාන්තා භූමිකාව' ජාතියේ ප්‍රගමනයට ලබාදෙන දායකත්වය විමසුමට ලක් ව ඇත්තේ අවම වශයෙනි. සමාජ, ආර්ථික, දේශපාලන අභියෝග හමුවේ සැබැවින් ම ඇය ශක්තිමත් ද? ඇය ස්ථානගත විය යුත්තේ කොතැන ද? මෙවර දෙසතිය කවරයේ කතාවෙන් විමසා බැලෙන්නේ ඒ පිළිබඳ ව ය.

නිරෝෂි දොඹගහගේ

## ජාත්‍යන්තර කාන්තා දිනයේ ඇරඹුම හා කාන්තා අයිතීන් සුරක්ෂිත වීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන පරිදි ප්‍රජාව මත දැවැන්ත පීඩනයක් ඇති කරන, බහුවිධ අර්බුදවලට මුහුණදෙන ලෝකයක ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීම අන් කවරදාකටවත් වඩා අත්‍යවශ්‍ය වේ. ඒ අනුව සෞභාග්‍යවත්, සාධාරණ ආර්ථිකයක් සහ අනාගත පරම්පරාව සඳහා සෞඛ්‍ය සම්පන්න ලෝකයක් සුරක්ෂිත කිරීමට ඇති එක ම මාර්ගය වන්නේ කාන්තාවන්ගේ සහ ගැහැනු ළමයින්ගේ අයිතිවාසිකම් සෑම අංශයකින් ම සුරක්ෂිත කිරීමයි.

කාන්තා දිනය සැමරීමට අදාළ මූලාරම්භය සනිටුහන් ව ඇත්තේ කාන්තාවන් 15,000ක් පමණක් එක්වෙමින් තමන් වැඩ කරන පැය ගණනාවක් අඩුකරන ලෙසටත් වඩා හොඳ වැටුප් සහ ඡන්ද අයිතිය ලබාදෙන ලෙසටත් ඉල්ලමින් 1908 වර්ෂයේදී නිව්යෝර්ක් නගරයේ පැවැත්වූ පා ගමනක් හේතුවෙනි. ඉන් වර්ෂයකට පසු පළමු කාන්තා දිනය ඇමරිකානු සමාජවාදී පක්ෂය ප්‍රකාශයට පත් කර තිබේ. මේ දිනය ජාත්‍යන්තර දිනයක් බවට පත් කළ යුතුය යන අදහසක් ඉදිරිපත් කරන ලද්දේ ජර්මනියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සාමාජිකාවක් වන ක්ලාරා සෙට්කින් විසිනි. ඒ, 1910 වසරේ කෝපන්හේගන්හි පැවති වැඩ කරන කාන්තාවන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේදී ය. ඒ අනුව පළමු වරට කාන්තා දිනය 1911 වසරේදී ඔස්ට්‍රියාව, ඩෙන්මාර්ක්, ජර්මනිය සහ ස්විට්සර්ලන්තය යන රටවල සැමරිණි. මේ දිනය සඳහා නිල පිළිගැනීමක් ලැබී ඇත්තේ එක්සත් ජාතීන්ගේ සංගමය 1977 වර්ෂයේ සිට ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම ආරම්භ කිරීමත් සමග ය.

රුසියාව ඇතුළු රටවල් රැසක් කාන්තා දිනය ජාතික නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ. ජාත්‍යන්තර කාන්තා දිනය ජාතික නිවාඩු දිනයක් ලෙස ද නම් කර තිබේ. චීන රාජ්‍ය කවුන්සිලය කාන්තාවන්ට එදින දින භාගයක නිවාඩුවක් ලබාදෙන ලෙස උපදෙස් ලබා දී ඇත. ඇමරිකාව මාර්තු මාසය, කාන්තාවන්ගේ 'ඉතිහාස මාසය' ලෙස සලකන අතර එරට කාන්තාවන් ලැබූ ජයග්‍රහණ සම්බන්ධයෙන් ගෞරව පිණිස ජනාධිපතිවරයා වාර්ෂික නිවේදනයක් ද නිකුත් කරයි.

ශ්‍රී ලංකාවේ කාන්තා දිනය සැමරීමේ ජාතික උත්සවය ජනාධිපතිගේ හා අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල වෝටර්ස්ඒජ්හි පැවැත් වේ. ඊට සමගාමී ව කාන්තා ව්‍යවසායකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සහ නව වෙළෙඳපළ අවස්ථා උදා කිරීම යන

කාන්තාව සම්බන්ධයෙන් කෙතරම් සුහසාධන වැඩසටහන් ක්‍රියාත්මක වුව ද ඇයගේ ජීවන තත්ත්වය සහ සුරක්ෂිතතාව පිළිබඳ ව සෑහීමකට පත්විය හැකිදැයි යන ගැටලුව මෙන් ම ඇය මුහුණදෙන අභියෝග පිළිබඳ නොසලකා හැරිය නොහැකි වෙනස් මානයක් සංඛ්‍යා දත්ත හෙළිදරව් කරයි.



අරමුණු පෙරදැරි කරගෙන 'ලිය ශක්ති - 2024' කාන්තා නිෂ්පාදන ප්‍රදර්ශන හා අලෙවි වෙළෙඳපොළක් බත්තරමුල්ල දියත උයන පරිශ්‍රයේදී මාර්තු 06, 07 දෙදින පෙරවරු 9 සිට පැවැත්වීමට නියමිත ය. අත්කම් නිෂ්පාදන, ඇඳුම් ඇඟලුම්, පාවහන්, ආහාර ද්‍රව්‍ය වැනි විවිධ නිෂ්පාදන මෙහිදී ප්‍රදර්ශනය හා අලෙවි කෙරෙනු ඇත. හිංසනයට ලක් වන කාන්තාවන් වෙනුවෙන් පවත්වාගෙන යන රැකවරණ මධ්‍යස්ථාන 11ක් කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ දීප ව්‍යාප්ත ව ක්‍රියාත්මක වන අතර ඉන් 09ක් රජයත් පෞද්ගලික අංශයත් එක් ව පවත්වාගෙන යයි. එම මධ්‍යස්ථාන සඳහා සකසා ඇති මාර්ගෝපදේශ සංග්‍රහය ද එදින එළිදැක්වීමට නියමිත ය.

## තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය

වර්ෂ 2030 වන විට සපුරා ගැනීමට අපේක්ෂිත එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය සහ තිරසර සංවර්ධන ඉලක්කවල අංක 05 යටතේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව කෙරෙහි අවධානය යොමු කර තිබේ. එහි 5.1 කාන්තාවන්ට හා ගැහැනු ළමයින්ට එරෙහි ව සියලු ම ස්ථානවල සිදුවන්නා වූ සියලු ම ආකාරයේ වෙනස් කොට සැලකීම් තුරන් කිරීම, 5.2 මානව කුට්ටනය, ලිංගික හා වෙනත් ආකාරයේ දූෂණ ඇතුළත් ව කාන්තාවන්ට සහ ගැහැනු ළමයින්ට එරෙහි ව පොදු සහ පෞද්ගලික ස්ථානවල සිදුවන්නා වූ සියලු ම ආකාරයේ ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම, 5.3 ළමා විවාහ, බලහත්කාරයෙන් සිදුවන්නා වූ විවාහ සහ කාන්තාවන්ගේ ලිංගික අවයව තුවාල කිරීම වැනි සියලු ම හානිකර භාවිතාවන් තුරන් කිරීම, 5.4 මහජන සේවා යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සැපයීමෙන් ගෙවීමක් සිදු නොකරන්නා වූ සේවා සහ ගෘහාශ්‍රිත වැඩවල වටිනාකම හඳුනාගැනීම, අගය කිරීම සහ ජාතික වශයෙන් සිදු වන්නා වූ ආකාරයට නිවසේ සහ පවුලේ වගකීම් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම, 5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලු ම අවස්ථාවල තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථා සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගි වීම තහවුරු කිරීම, 5.6 ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ වැඩසැලැස්මට අනුකූල ව එකඟ වූ පරිදි සහ බීජිං ක්‍රියාකාරකම් සැලැස්ම සහ ඔවුන්ගේ සමාලෝචන සම්මන්ත්‍රණයේ ලේඛනවලට අනුකූල ව ලිංගික, සහ ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම් සඳහා සියලු දෙනාට ම ප්‍රවේශ වීමේ අවස්ථාව තහවුරු කිරීම, 5.7 කාන්තාවන්ට ආර්ථික අයිතිවාසිකම් ලබා දීම සඳහා වූ සංශෝධන සිදු කිරීම සහ දේශීය නීතිවලට අනුව ඉඩම් සහ වෙනත් ආකාරවල දෙපළ මූල්‍ය සේවා, උරුමයන් සහ ස්වාභාවික සම්පත්වල හිමිකාරිත්වය ලබා ගැනීම මෙන් ම පාලනය සඳහා අවස්ථාව ලබා දීම, 5.8 කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා විශේෂයෙන් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළත් ව තාක්ෂණය ලබාගැනීම සඳහා සාධනීය අවස්ථා ලබා දීම, 5.9 ස්ත්‍රී පුරුෂ සමාජභාවී සමානත්වය සහ සියලු ම මට්ටම්වල කාන්තාවන් හා ගැහැනු ළමයින් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම සහ ශක්තිමත් කිරීම හා නීතිමය ලෙස බලාත්මක කිරීම යනාදී ක්ෂේත්‍රවල සාධනීය වර්ධනයකින් කාන්තාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම අපේක්ෂාවයි.

මේ න්‍යාය පත්‍රය පාදක කරගෙන වත්මන් ලෝකයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව වෙනුවෙන් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක වුවත් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇස්තමේන්තු කරන පරිදි වර්ෂ 2030 වන විටත් ලොව මිලියන 342.2කට වැඩි කාන්තාවන් සහ ගැහැනු ළමයින් අන්ත දරිද්‍රතාවේ ජීවත් වනු ඇත. 2030 වර්ෂය වන විට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කර ගැනීමේදී ප්‍රධාන අභියෝග යක් වන්නේ මේ වැඩසටහන් සඳහා වියදම් කිරීමේදී වාර්ෂික ව ඩොලර් බිලියන 360ක හිඟයක් දක්නට ලැබීම බව ද එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශ කරයි.

ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙවර කාන්තා දිනය සැමරීමට විශේෂිත ව කාන්තාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ක්‍රියාමාර්ග අවශ්‍ය වන ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන තිබේ. එම ක්ෂේත්‍ර වන්නේ කාන්තාවන් සඳහා ආයෝජනයඃ මානව හිමිකම් ප්‍රශ්නයක් (Investing in women: A human rights issue), දුප්පත්කම අවසන් කිරීම (Ending poverty), ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී මූල්‍යකරණයක් ක්‍රියාත්මක කිරීම (Implementing gender - responsive



financing), හරිත ආර්ථිකයක් සහ සත්කාරක සමාජයක් වෙත ගමන් කිරීම (Shifting to a green economy and care society) සහ වෙනස්කම් සිදු කරන ස්ත්‍රීවාදීන්ට සහාය ලබාදීම (Supporting feminist change-makers) යන්නයි.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කර ගැනීම යනු හුදෙක් ම මූලික මානව අයිතිවාසිකමක් පමණක් ම නොව සාමකාමී, වඩා දියුණු හා තිරසර සංවර්ධිත ලෝකයක් නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය පදනමකි. සමස්තයක් ලෙස ගත් කල ප්‍රාථමික අධ්‍යාපනයට සමාන ප්‍රවේශ අවස්ථා ලබා ගැනීම වැනි ක්ෂේත්‍රවල කාන්තාවන් සවිබල ගැන්වීම සම්බන්ධයෙන් ලෝකය ප්‍රගතියක් අත්පත් කරගත්ත ද ඇතැම් රටවල්වල කාන්තාවන් සහ ගැහැනු ළමයින් වෙනස්කර සැලකීම්වලට සහ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන බව නොරහසකි.

## ඇය හමුවේ පවතින අභියෝග

ලෝකයේ ම කාන්තාව මුහුණදෙන අභියෝග හඳුනා ගැනීම වැදගත් වේ. මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (United Nations Office on Drugs and Crime - UNODC) සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනය (United Nations Entity for Gender Equality and the Empowerment of Women - UNWomen) එක් ව 2022 වර්ෂයේදී සිදු කරන ලද සමීක්ෂණයකින් ලෝකයේ කාන්තාවන් හා සම්බන්ධ අපරාධ පිළිබඳ තොරතුරු රාශියක් හෙළිදරව් වී තිබේ. 2021 වර්ෂයේදී ලොව කාන්තාවන් සහ ගැහැනු ළමයින් 81,100ක් පමණ හිතාමතා ඝාතනය කර තිබේ. මේ අතරින් 45,000ක් පමණ ඝාතනය වී ඇත්තේ ඔවුන්ගේ සමීප සහකරුවන් හා වෙනත් පවුලේ සාමාජිකයන්ගෙන් බව ද සමීක්ෂණ වාර්තාව හෙළිදරව් කරයි. එම වාර්තාව දක්වන ආකාරයට ගතවන සෑම පැයකට ම වරක් කාන්තාවන් පස් දෙනෙකුට වැඩි පිරිසක් තම පවුලේ සාමාජිකයකු අතින් ඝාතනය කෙරේ. ලෝක සෞඛ්‍ය සංවිධානය දක්වන පරිදි ගෝලීය වශයෙන් සෑම කාන්තාවන් තිදෙනකුගෙන් ම එක් අයෙක් එනම් 30%ක් තම ජීවිත කාලයේ තමන්ගේ ම සහකරු වෙතින් හෝ වෙනත් අයකුගෙන් ශාරීරික හෝ ලිංගික වශයෙන් ප්‍රචණ්ඩත්වයට භාජනය වේ.

2019 වසරේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ලංකාවේ කාන්තාවන් සම්බන්ධයෙන් සිදු කළ සමීක්ෂණයකට අනුව ලාංකික කතුන්ගෙන් 24.9%ක් වයස අවුරුදු 15 සිට සහකරුවකු හෝ සහකරුවකු නොවන අයකු විසින් ශාරීරික හෝ ලිංගික හිංසනයට ලක්වී තිබේ. වයස අවුරුදු 15ක තැනැත්තියක් යනු මෙරට නීතියට අනුව දරුවකු බව ද වටහා ගැනීම වැදගත් වේ. ළමා ආරක්ෂණ අධිකාරියේ දත්ත අනුව 2021 වර්ෂයේ පමණක් ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ ළමා අපයෝජන සිදුවීම් සංඛ්‍යාව 11,000කි. 2022 වර්ෂයේදී වාර්තා වී ඇති ළමා අපයෝජන සිදුවීම් (ගැහැනු සහ පිරිමි ළමයින්) අතුරින් 41%ක් ලිංගික අපයෝජන වේ.

කාන්තාව සම්බන්ධයෙන් කෙතරම් සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක වුව ද ඇගේ ජීවන තත්ත්වය සහ සුරක්ෂිතතාව පිළිබඳ ව සෑහීමකට පත්විය හැකිදැයි යන ගැටලුව මෙන් ම ඇය මුහුණදෙන අභියෝග පිළිබඳ නොසලකා හැරිය නොහැකි වෙනස් මානයක් මේ සංඛ්‍යා දත්ත හෙළිදරව් කරයි.

දේශපාලන ක්ෂේත්‍රයට කාන්තාවගේ දායකත්වය සලකා බැලූ කල පෙනී යන කරුණක් වන්නේ පෙරදිග බටහිර භේදයකින් තොර ව එම ක්ෂේත්‍රයට කාන්තාවගේ දායකත්වය අවම බවයි. එක්සත් ජාතීන්ගේ ආයතනය (United Nations Entity for Gender Equality and the Empowerment of Women - UNWomen) දක්වන පරිදි පාර්ලිමේන්තුවේ 50%ට වැඩි කාන්තා නියෝජනයක් දක්නට ලැබෙන්නේ රුවන්ඩාව (61%), කියුබාව (53%), නිකරගුවාව (52%), මෙක්සිකෝව (50%), නවසීලන්තය (50%) සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (50%) යන රටවල් 6ක පමණි. තවත් රටවල් 23ක දේශපාලනය සඳහා 40%ක පමණ කාන්තා දායකත්වයක් දක්නට ඇත. වත්මන් ප්‍රගතිය අනුව වර්ෂ 2063ට පෙර ව්‍යවස්ථාදායකයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය පුරෝකථනය කරයි.

ලෝකයේ ප්‍රථම අගමැතිනිය ලෙස සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පත් වන විට දේශපාලන ක්ෂේත්‍රය

ලෝකයේ ප්‍රථම අගමැතිනිය ලෙස සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පත් වන විට දේශපාලන ක්ෂේත්‍රය හා සම්බන්ධ ව මෙරට කාන්තාවට සුබවාදී බලාපොරොත්තුවක් තබාගත හැකි ප්‍රවණතාවක් නිර්මාණය වුවත් එය දීර්ඝකාලීන ව පැවැති බවක් නිරීක්ෂණය නොවේ. වත්මන් පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය මන්ත්‍රීවරියන් 12 දෙනකුට සීමා වී තිබේ.

හා සම්බන්ධ ව මෙරට කාන්තාවට සුබවාදී බලාපොරොත්තුවක් තබාගත හැකි ප්‍රවණතාවක් නිර්මාණය වුවත් එය දීර්ඝකාලීන ව පැවැති බවක් නිරීක්ෂණය නොවේ. වත්මන් පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය මන්ත්‍රීවරියන් 12 දෙනකුට සීමා වී තිබේ. කාන්තාවන්ට නාම යෝජනා ලබාදීමේදී ලිංගික අල්ලස් ලබා ගැනීම, හිතමිතුරන් වෙත නාම යෝජනා ලබාදීම වැනි අක්‍රමිකතා සිදුවන බව පර්යේෂණවලින් තහවුරු වී තිබේ. මෙරට ජනගහනයෙන් 52%ක් පමණ කාන්තාවන් වුවත් තීරණ ගැනීමේ ක්‍රියාන්විතවලදී කාන්තාවගේ නියෝජනය අඩුවීම මෙරට සමස්ත කාන්තා පරපුරට ම බලපෑමක් ඇති කරයි.

එහෙත් බාධාකාරී වාතාවරණයක් යටතේ වුව ද ලෝකයේ මෙන් ම ශ්‍රී ලංකාවේ කාන්තාවන් ඇතැම් ක්ෂේත්‍රවල අත්පත් කරගෙන තිබෙන්නේ සුවිශේෂ දියුණුවකි. විශේෂයෙන් මෙරට කාන්තාවන් උසස් අධ්‍යාපනයට යොමු වීමේදී එය කැපී පෙනේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග පවසන්නේ පසුගිය දශකයක කාලයේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යාපනය ලබන කාන්තා විද්‍යාර්ථීන් ප්‍රතිශතය සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති බව ය. ඒ අනුව 2013 වර්ෂයේදී 60.8%ක් ලෙස පැවති විශ්වවිද්‍යාලවලට ප්‍රවේශ වන කාන්තා විද්‍යාර්ථීන් ප්‍රතිශතය 2023 වර්ෂය වන විට 65.6%ක් දක්වා වර්ධනය වී ඇත. අධ්‍යයන පීඨ වශයෙන් සලකා බැලූ කල නිරීක්ෂණය වන්නේ මෙරට උසස් අධ්‍යාපනයට යොමු වන කාන්තාවන්ගේ සංඛ්‍යාව සීඝ්‍ර වශයෙන් වර්ධනය වී ඇති බවයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මල්ලිකා පින්නවල පවසන්නේ පවතින සමාජ, ආර්ථික වාතාවරණය මත පිරිමින් මුදල් ඉපයීම සඳහා ඉක්මන් සහ කෙටි ක්‍රම සොයා යාම හේතුවෙන් ගැහැනු දරුවන්ට වැඩි වශයෙන් උසස් අධ්‍යාපනයට යොමුවීමට හැකියාවක් ලැබී ඇති බව ය. සමාජයේ මූලික තැනුම් ඒකකය වන පවුල සමබර හා සුරක්ෂිත ලෙස පවත්වාගෙන යාමෙහි ලා මවගේ භූමිකාව කැපී පෙනෙන බවත් නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභයක් ලෙස පවුලක මව අධ්‍යාපනය ලත් උගත් අයකු වීම නිසාත් සමාජයේ ඇතිවන වෙනස වඩාත් සුබවාදී වන බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති

කාන්තාවන් රැකියාවල නියැළීමට අදාළ දත්ත විමසා බැලීමේදී මෙරට විධිමත් අංශයෙහි ස්ත්‍රී පුරුෂ ලෙස වැටුප් විෂමතා දක්නට නොලැබුණ ද අවිධිමත් පෞද්ගලික අංශයේ සාමාන්‍ය දෛනික වැටුප් ගෙවීමේදී රැකියාවලට අදාළ ව කාන්තාවන්ට පිරිමින්ට වඩා අඩු වැටුප් හිමිවන බව නිරීක්ෂණය වේ. 2022 වර්ෂයේ මහ බැංකු වාර්තාව අනුව තේ දළු නෙළීම සඳහා 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී පුරුෂයකුට රුපියල් 1,370ක දෛනික වැටුපක් හිමි වුව ද කාන්තාවකගේ දෛනික වැටුප රුපියල් 1217කි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග ප්‍රකාශ කරයි.

2022 මහ බැංකු වාර්තාව දක්වන පරිදි මෙරට පුරුෂයන්ගේ සාක්ෂරතාව 94.3%ක් වන අතර කාන්තාවන්ගේ සාක්ෂරතාව 92.3%කි. මෙරට ශ්‍රම බලකාය සඳහා කාන්තා නියෝජනය ලෙස 2021 වර්ෂයේදී තිබූ 31.8% 2022 වර්ෂය වන විට 32.1%ක් දක්වා වර්ධනය වී ඇත. 2017 වර්ෂයේදී මෙය 36.6% ලෙස සටහන් වේ. ඒ අනුව ගෙවුණු වර්ෂ පහේ මෙරට ශ්‍රම බලකාය සඳහා කාන්තා නියෝජනයේ ප්‍රතිශතය 32%-36%ත් අතර විචලනය වෙමින් පවතී. 2022 වර්ෂයේ මෙරට කාන්තාවන්ගේ සේවා වියුක්තිය ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සැලකූ කල 6.5%කි. මහ බැංකු වාර්තාවේ දත්ත අනුව 2021 හා 2022 වර්ෂවලදී විදේශ රැකියා සඳහා සංක්‍රමණය වූ කාන්තාවන් සංඛ්‍යාව පිළිවෙළින් 41,154ක් සහ 124,091ක් වන අතර ඒ අතරින් 29315 සහ 74007ක් ගෘහසේවිකාවන් ය. 2022 වර්ෂයේ වාර්තා වී ඇති 124,091 අගය 2014 වසරේ සිට කාන්තාවන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීමට අදාළ ව වාර්තා වූ ඉහළම අගය වේ. මේ දත්ත



පළාත් අනුව සලකා බැලූ කල පෙනී යන්නේ 2022 වර්ෂයේ පිළිවෙළින් බස්නාහිර, මධ්‍යම හා වයඹ පළාත්වල කාන්තාවන් වැඩි වශයෙන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වී ඇති බව ය.

කාන්තාවන් රැකියාවල නියැළීමට අදාළ දත්ත විමසා බැලීමේදී මෙරට විධිමත් අංශයෙහි ස්ත්‍රී පුරුෂ ලෙස වැටුප් විෂමතා දක්නට නොලැබුණ ද අවිධිමත් පෞද්ගලික අංශයේ සාමාන්‍ය දෛනික වැටුප් ගෙවීමේදී රැකියාවලට අදාළ ව කාන්තාවන්ට පිරිමින්ට වඩා අඩු වැටුප් හිමිවන බව නිරීක්ෂණය වේ. 2022 වර්ෂයේ මහ බැංකු වාර්තාව අනුව තේ දළු නෙළීම සඳහා 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී පුරුෂයකුට රුපියල්

1,370ක දෛනික වැටුපක් හිමි වුව ද කාන්තාවකගේ දෛනික වැටුප රුපියල් 1217කි. රබර් කිරි කැපීම සඳහා පුරුෂයකුට රුපියල් 1,413ක දෛනික වැටුපක් ගෙවා ඇති අතර කාන්තාවට ගෙවා ඇත්තේ රුපියල් 1200ක මුදලකි. වී අස්වනු නෙළීමේදී ද කාන්තාවට පුරුෂයාට වඩා අඩු වැටුපක් හිමි වී ඇත. ඒ අනුව කාන්තාවන්ට අවිධිමත් පෞද්ගලික අංශයේ ඇතැම් රැකියාවල අසමාන වැටුපක් හිමිවන බව නිරීක්ෂණය වේ.



ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල කාන්තා විද්‍යාර්ථීන් ප්‍රතිශතය

| විෂය ධාරාව | 2013 වර්ෂය | 2023 වර්ෂය |
|---|---|---|
| | % | % |
| කලා | 77.3 | 83.0 |
| අධ්‍යාපන | 95.1 | 92.2 |
| කළමනාකරණ හා වාණිජ | 56.1 | 68.6 |
| නීති | 80.9 | 86.0 |
| වෛද්‍ය | 55.9 | 63.3 |
| දන්ත වෛද්‍ය | 63.5 | 71.2 |
| පශු වෛද්‍ය | 64.4 | 72.0 |
| කෘෂිකර්ම | 61.8 | 75.3 |
| ඉංජිනේරු | 20.5 | 27.9 |
| වාස්තු විද්‍යා හා ප්‍රමාණ සමීක්ෂණ | 51.7 | 56.6 |
| පරිගණක විද්‍යාව | 48.1 | 46.1 |
| සම සෞඛ්‍ය (AHS) | 68.6 | 74.4 |
| විද්‍යා | 52.9 | 59.0 |
| දේශීය වෛද්‍ය | 76.6 | 82.1 |
| තාක්ෂණ | ක්‍රියාත්මක නොවිණි. | 43.0 |
| | **60.8** | **65.6** |

මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

එහෙත් පවුලේ සුරක්ෂිතතාව තහවුරු කරමින් මෙරට ජාතික ආර්ථිකය කෙරෙහි කාන්තාවගෙන් ලැබෙන දායකත්වය සංඛ්‍යා දත්ත සඳහා ගණනය නොවේ. පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම වෙනුවෙන් කාන්තාව සිදු කරන ස්වයං රැකියා, ගෙවතු වගා, දරුවන් හා වැඩිහිටියන්, රෝගීන් රැකබලා ගැනීම යනාදී කාර්ය ඔස්සේ නිර්මාණය වන සමාජ සුරක්ෂිතතාව සංවර්ධන ක්‍රියාවලියේදී ඇගයීමට ලක් නොවීම කනගාටුවට කරුණකි.

## ඉදිරි ක්‍රියාමාර්ග

මෙරට කාන්තාවගේ සුරක්ෂිතතාව හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන ගණනාවකි. කාන්තා කටයුතු පිළිබඳ (නීතිමය, මනෝ සමාජයීය, ආරක්ෂණ, වෛද්‍ය උපදෙස්, සහ උපකාර) දැනුම් දීමට ක්ෂණික ඇමතුම් අංකය-1939, කාන්තා පිහිට (Women in Need) ආයතනය, ළඟ ම පිහිටි රෝහලේ බාහිර රෝගී අංශය සහ මිතුරු පියස, පොලිස් ස්ථානවල පිහිටි ළමා හා කාන්තා කාර්යාංශය, ශ්‍රී ලංකා පවුල් සැලසුම් සංගමය, ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ඒ අතර ප්‍රමුඛ වේ.

කාන්තාවන්ට හෝ ළමයින්ට හෝ එරෙහි ක්‍රියාකාරකම් පිළිබඳ ව පැමිණිලි කිරීමට මහජන ආරක්ෂක අමාත්‍යාංශය ද පැය 24 ම ක්‍රියාත්මක වන ක්ෂණික දුරකතන අංකයක් (109) හා විද්‍යුත් තැපැල් ලිපිනයක් (cwb.online@police.gov) නොබෝද හඳුන්වා දුන්නේ ය. මේ කවුළුවෙන් ළමා හා කාන්තා අපයෝජන වැළැක්වීමේ කාර්යාංශය ළමයින්ට සහ කාන්තාවන්ට එරෙහි අපරාධ සහ ඔවුන්ට එරෙහි ලිංගික ප්‍රචණ්ඩත්වය, ගෘහස්ථ හිංසනය, ළමා අනාරක්ෂිතභාවය, ළමා ශ්‍රමිකත්වය යනාදිය විමර්ශනය කෙරේ.

කාන්තාවන් සුරැකීම වෙනුවෙන් වන වත්මන් හා ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳ පැහැදිලි කරන කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) නිල්මිණී හේරත්;"2023 වසරේ කාන්තා දිනය නිමිත්තෙන් එළි දක්වන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා සවිබල ගැන්වීම් ප්‍රතිපත්තිය (National Policy on Gender Equality and Women Empowerment) යටතේ වන ක්‍රියාකාරී සැලැස්ම අනුවයි අප ක්‍රියා කරන්නේ. මේ ප්‍රතිපත්තියේ ම සඳහන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගිකත්වය පදනම් කරගත් හිංසනය වැළැක්වීම පිළිබඳවත් අමාත්‍යංශය 13ක සහභාගිත්වයෙන් වසර 05ක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළා. එය ක්‍රියාත්මක කිරීමේදී මෙරට කාන්තාව හිංසනයෙන් මුදවා ගැනීම සම්බන්ධයෙන් සාධනීය පියවර රාශියක් ඉදිරියේදී ගත හැකි වේවි. එහිදී අප මුහුණදෙන ප්‍රධාන ගැටලුව වන්නේ වර්ෂික ව වෙන් වන මුදල් ප්‍රතිපාදන අඩුවීම. එහෙත් මේ සම්බන්ධයෙන් ආධාර ලබා දෙන ආයතන සමග එක් ව මේ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරනවා."

කාන්තාවගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා නෛතිකමය පදනම ශක්තිමත් කිරීම සඳහා නීතිමය සංශෝධන හඳුන්වා දීමට අදාළ පියවර රැසක් ද ගනිමින් තිබේ. මෙරට කාන්තාවගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහාත් වඩා නිවහල් මනසකින් ඇයගේ දායකත්වය ජාතික සංවර්ධනය වෙත ලබා ගැනීම සඳහාත් මේ තත්ත්වය ඉවහල් වනු ඇත.

වත්මන් කාන්තාව බොහෝ අභියෝග මධ්‍යයේ අතීතයේ පැවැති සමාජ තත්ත්වයට වඩා වැඩි වටිනාකමක් අත්පත් කරගෙන ඇති බව පෙනී යන කරුණකි. අතීතයේදී නිෂ්පාදන කාර්යයට සීමා වූ ඇගේ කාර්යය වර්තමානය වන විට ප්‍රතිනිෂ්පාදන කාර්යයට ද විහිදී ඇත. ඒ අනුව සාම්ප්‍රදායික ව පැවරෙන වගකීමෙන් ඔබ්බට ගොස් ජාතික සංවර්ධනය වෙනුවෙන් වැඩි දායකත්වයක් ලබාදීමට වත්මන් කාන්තාව සමත් වී තිබේ. කෙසේ වෙතත් පීතෘමූලික සමාජ ආකල්ප දරන සමාජයක නිෂ්පාදන හා ප්‍රතිනිෂ්පාදන කාර්යවලදී තමාට පැවරෙන වගකීම් නිසි අයුරින් ඉටු කිරීම සඳහා සුවිශාල මානසික හැකියාවක් කාන්තාවක් සතු විය යුතු ය. මෙතෙක් ළඟා කරගත් ජයග්‍රහණ මෙන් ම ඉදිරියේදී ළඟා කර ගැනෙන ජයග්‍රහණ පසුපස තිබෙනු ඇත්තේ ඇය සතු අප්‍රතිහත ධෛර්යය ම පමණි. එහිදී කාන්තාව සතු ශක්‍යතා හඳුනාගෙන රටේ සංවර්ධන ක්‍රියාවලියට ඇය දායක කර ගැනීමට ගැළපෙන සුරක්ෂිත වටපිටාවක් සලසා දීමේ වගකීම ඇගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින සියලු පාර්ශ්ව සතු වේ.

# කාන්තා නියෝජනය වැඩි කිරීම සාධනීය පියවරක්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය Women Parliamentarians’ Caucus (WPC) යනු මෙරට පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සහභාගිත්වයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම, කාන්තාවන්ට එරෙහි සියලු ආකාර ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ආරක්ෂා කිරීම වෙනුවෙන් අදාළ කාරණාවලදී ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක්.

2015 පළාත් පාලන නීති සංශෝධනයෙන් 25%ක කාන්තා නියෝජනයක් ලබා දීම ශ්‍රී ලාංකික කාන්තාවට දේශපාලන ක්ෂේත්‍රයට පිවිසෙන්නට අවශ්‍ය පසුබිම සකස් කරමින් ශ්‍රී ලංකා රජය ගත් සාධනීය පියවරක්. වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියන් 12 දෙනාගෙන් 08 දෙනෙක් ජනතා ඡන්දයෙන් පත්වූවන්. ඒ අතරින් 07 දෙනෙක් ම දේශපාලනයට පිවිසෙන්නේ පවුල් පසුබිමත් සමග. අනෙක් 04 දෙනා පත් වුණේ ජාතික ලැයිස්තුවෙන්.

මෙරට අතීතය පිළිබඳ සැලකුවත් කාන්තාව දේශපාලනයට පිවිසියේ පුරුෂයාගේ අභාවයෙන් පසුව පුරප්පාඩු වූ තනතුරකට. එහෙත් ඊට පසු ජනතා විශ්වාසය දිනාගෙන, මැතිවරණයට තරග කර කාන්තාව පාර්ලිමේන්තුවට පැමිණියා. තවමත් ප්‍රමාණවත් පරිදි කාන්තාවට ජාතික දේශපාලනයට පිවිසීමට පරිසරය මෙරට දේශපාලනයේ නිර්මාණය වී නැහැ.

පාර්ලිමේන්තු කාන්තා සංසදය යනු පක්ෂ විපක්ෂ භේදයකින් තොර ව ක්‍රියා කරන ස්ථානයක්. කාන්තාවන්ගේ ප්‍රශ්නවලදී අප එක හඬක් නගනවා. මෙවර පක්ෂ ගණනාවක ප්‍රධාන ලේකම්වරු පුද්ගලික ව හමු වී ඉල්ලීම් කළා, පක්ෂ ව්‍යවස්ථා සංශෝධනය කර වැඩිපුර කාන්තාවන්ට දේශපාලනයට පිවිසීමට ඉඩකඩ දෙන ලෙස. විශේෂයෙන් දිස්ත්‍රික් මට්ටමේ අපේක්ෂකත්වයෙන් 1/3ක් සහ ජාතික ලැයිස්තුවෙන් 50%ක් කාන්තාවන්ට ලබා දෙන ලෙස අප යෝජනා කළා. මැතිවරණ ක්‍රමය සංශෝධනයය පත් කළ ජනාධිපති කොමිසමටත් අප යෝජනා යවා තිබෙනවා පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය වැඩි කිරීම සම්බන්ධයෙන්.

කාන්තා කටයුතු අමාත්‍යාංශයත් සමග එක් ව සැකසූ කාන්තා ප්‍රතිපත්තිය බලාත්මක කරන්නට අවශ්‍ය නීති සම්පාදනය කරමින් සිටිනවා. ඉදිරියේදී කාන්තා කටයුතු අමාත්‍යංශයත් සමග එක් වී ක්‍රියාකාරී සැලැස්මක් සැකසීමත් අපගේ අපේක්ෂාවක්.

තවත් කාන්තා ප්‍රශ්න රාශියක් වෙනුවෙන් අප ක්‍රියා කළා. විශේෂයෙන් ඉඩම්වල උරුමය පියාගේ ඇවෑමෙන් පවුලේ පිරිමි දරුවාට ලැබෙන නීතිය සංශෝධනය කරන්නට අප මැදිහත් වුණා. ආයතනවල ලිංගික හිංසනය වැළැක්වීම සඳහා අදාළ පාර්ශ්ව දැනුවත්



**සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ**
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය



> ශ්‍රී ලංකාව තවමත් පීතෘමූලික සමාජයක්. පක්ෂ ව්‍යුහය තුළ තීන්දු ගන්නේ බොහෝ විට පිරිමි පාර්ශ්වය. ප්‍රධාන පක්ෂ ධාරාවේ තීන්දු ගන්නා මට්ටම්වල කාන්තාවන් නැහැ. අප යෝජනා කළා පක්ෂ ව්‍යුහය තුළ තීන්දු ගන්නා විට 1/3ක් හෝ කාන්තා නියෝජනයකට ලබා දෙන ලෙස.

කිරීමට අත්පොතක් ප්‍රකාශයට පත් කළා. රැකියාවක් නොමැති ව තාවකාලික වීසාවලින් කාන්තාවන් විදේශගත කිරීම නියාමනය සඳහා විදේශ කටයුතු ප්‍රවර්ධන අමාත්‍යාංශයත් සමග එක් ව ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ඊට අවශ්‍ය පියවර ගත්තා.

කාන්තාවන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා තේරීම් කාරක සභාවක් පත් කරගෙන තිබෙනවා. තමා කාන්තාවක් වීම නිසා තමන්ට උසස්වීම් නොලැබෙන බවට පොලිස් නිලධාරිනියක් මේ කමිටුවට පැමිණිලි කළ විට අප ඊට මැදිහත් වුණා. කාන්තා නියෝජ්‍ය පොලිස්පතිවරියක් පළමු වතාවට පත් වන විට ඊට ඇතිවූ විරෝධතාව සම්බන්ධයෙන් අප පෙනී සිටි නිසා පසුකාලීන ව නියෝජ්‍ය පොලිස්පතිවරියන් 04 දෙනෙක් පත් වුණා. පක්ෂ ව්‍යුහයෙන් ඔබ්බට ගොස් සියලු දෙනා එකමුතු වීමේ ප්‍රතිඵලයි මේ.

ශ්‍රී ලංකාව තවමත් පීතෘමූලික සමාජයක්. පක්ෂ ව්‍යුහය තුළ තීන්දු ගන්නේ බොහෝ විට පිරිමි පාර්ශ්වය. ප්‍රධාන පක්ෂ ධාරාවේ තීන්දු ගන්නා මට්ටම්වල කාන්තාවන් නැහැ. අප යෝජනා කළා පක්ෂ ව්‍යුහය තුළ තීන්දු ගන්නා විට 1/3ක් හෝ කාන්තා නියෝජනයකට ලබා දෙන ලෙස. නාමයෝජනා දීමේ ක්‍රියාවලියේදී වුවත් අපේක්ෂකත්වය ලබා ගැනීමේදී කාන්තාවන්ට අභියෝග රාශියකට මුහුණ දෙන්නට සිදු වනවා. ජාතික ලැයිස්තුවෙන් වුවත් කාන්තාවට ලැබෙන්නේ සීමිත ඉඩකඩක්. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා නායකයන්ගේ අවධානය යොමු විය යුතුයි.

අප දන්නවා වර්තමානයේ කාන්තාවන් වැඩි පිරිසක් උසස් අධ්‍යාපනයට යොමු වන බව. වැඩි වියදමක් දරමින් දියුණු මට්ටමකට ඇය ව නිර්මාණය කළත් ඇගෙන් ලබාගත හැකි දායකත්වය රටක් ලෙස අප ලබා ගන්නවා ද? යන්න පිළිබඳ මීට වඩා අවධානය යොමු විය යුතුයි. විවාහයෙන් පසු දරුවන් රැකබලා ගැනීම වැනි පවුලේ වගකීම් ඇයට රට වෙනුවෙන් ලබා දිය හැකි දායකත්වය සීමා කරනවා. පවුල් පසුබිමෙන් ඇගේ වෘත්තීයභාවය සම්බන්ධයෙන් විරෝධතාවක් මතු වුවහොත් කාන්තාවගේ කාර්ය සීමා සහිත වනවා. දරුවන් රැක බලා ගැනීම වැනි කාර්ය වෙනුවෙන් ගුණාත්මක යටිතල පහසුකම් නිර්මාණය කිරීමට රජය මැදිහත්වීමෙන් කාන්තාවට නිවහල් මනසකින් රට වෙනුවෙන් දායකත්වය ලබාදීමට අවශ්‍ය පසුබිම සැකසෙනවා. කාන්තාවකට ඉහළ මට්ටමක වෘත්තීයභාවයක් ලබා ගැනීමට නම් පවුලේ සහයෝගය ලැබීම අත්‍යවශ්‍ය කාරණයක්. දරුවන් රැක බලා ගැනීමේ කාර්ය වෙනුවෙන් ගුණාත්මක දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම කෙරෙහි අවධානය යොමුවීම මෙහිදී ඉතා වැදගත්. ඒ පිළිබඳ රජයේ අවධානය මීට වඩා යොමු විය යුතුයි.

පෞද්ගලික අංශය සලකා බැලුවත් තීන්දු ගන්නා මට්ටම්වල කාන්තා දායකත්වය පවතින්නේ අඩු මට්ටමක. අප නිර්දේශ කළා දේශපාලන පමණක් නොව පුද්ගලික අංශය, කොමිෂන් සභා, අධිකාරි වැනි සියලු ම තීන්දු ගන්නා ආයතනවලින් 1/3ක් කාන්තාවන් පත් කළ යුතුයි යන්න.

1931 සර්වජන ඡන්ද බලයත් අපට ලැබුණේ උත්සාහයක ප්‍රතිඵල ලෙස. ඒ නිසා කාන්තාවන් ලෙස අප සියලු දෙනා මතවාදය ගෙන යන්නට ඉදිරිපත් විය යුතුයි. විශේෂයෙන් මෙරට 56%ක් වන කාන්තා ඡන්දදායකයන් තමන්ගේ ඡන්දයෙන් එක් මනාපයක් හෝ කාන්තාවකට ලබාදීම ඉතා වැදගත්. ඒ ඔස්සේ දේශපාලන ක්ෂේත්‍රයේ කාන්තා දායකත්වය ඉහළ නැංවීමට ඉදිරියේදී අපට හැකියාව ලැබේවි. ඒ නිසා ශ්‍රී ලාංකික කාන්තාවන් මේ පිළිබඳ දැනුවත්භාවයෙන් යුතු ව ක්‍රියා කිරීම ඉතා වැදගත්.

# නීතිමය වශයෙන් ඇය සුරක්ෂිතයි



**කුමුදු පෙරේරා**
නීති නිලධාරී
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකාවේ කාන්තාවට නීතියෙන් සලසා ඇති ආරක්ෂාව සම්බන්ධයෙන් කරුණු විමසා බැලීමේදී සෙසු දකුණු ආසියාතික රටවලට සාපේක්ෂ ව ඇයට නීතිමය වශයෙන් ආරක්ෂාවක් තිබෙන බවයි නිරීක්ෂණය වන්නේ. සාමාන්‍ය නීතිය යටතේ මෙරට කාන්තාවට වෙනස්කොට සැලකීමක් නැහැ. එහෙත් නොවිධිමත් ක්ෂේත්‍රයේ ඇතැම් රැකියාවල වැටුප් ගෙවීමේදී කාන්තාවකට පැයකට ගෙවන මුදල පිරිමින්ට සාපේක්ෂ ව අඩුයි. ඊට හේතුව පිරිමින් කාන්තාවට වඩා වැඩි වැඩ ප්‍රමාණයක් ඉටුකරන බවට වන මතය. විධිමත් ක්ෂේත්‍රයේදී නම් කාන්තාවන්ට සහ පිරිමින්ට සම වැටුපක් හිමිවන නිසා මේ වෙනස දක්නට නැහැ.

මෙරට මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ දණ්ඩ නීති සංග්‍රහයෙන් ද කාන්තාවගේ ආරක්ෂාව



සහ අයිතිවාසිකම් වෙනුවෙන් වන සුවිශේෂ නීති ප්‍රතිපාදන සලසා තිබෙනවා. විශේෂයෙන් වයස අවුරුදු 16ට අඩු දැරියන් සම්බන්ධයෙන් සිදුවන ලිංගික අපරාධයක් සැලකෙන්නේ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණයක් ලෙස. මෙවැනි ප්‍රතිපාදනවලින් කාන්තාවන්ට සලසන්නේ විශේෂිත නීතිමය ආරක්ෂාවක්. ශාරීරික හිරිහැර කිරීම, ලිංගික හිරිහැර කිරීම යනාදියෙන් ඇය ආරක්ෂා කිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන තිබෙනවා.

මේ සම්බන්ධ වඩාත් වැදගත් ම නීතිය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව යටතේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් තහවුරු කර තිබෙනවා. එහි 12(4) යටතේ සඳහන් කර තිබෙනවා කාන්තාවන්, දරුවන් සහ ආබාධිත පුද්ගලයන් යන අයගේ අයිතීන් තහවුරු කිරීම සඳහා රජයට නව නීති සැකසීමට ඇති හැකියාව.

කාන්තාවන්ට එරෙහි ව වෙනස් කොට සැලකීමට අදාළ එක්සත් ජාතීන්ගේ සම්මුතිය අනුව කටයුතු කිරීමට අප බැඳී සිටිනවා. එම සම්මුතියට අදාළ ව රටක් ලෙස ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ අප වාර්තා කළ යුතුයි. එලෙස වාර්තා කිරීමේදී ඒවායෙහි අඩුපාඩු පවතී නම් එම කමිටුවෙන් නිර්දේශ කරන ආකාරයට ඒවා නිවැරදි කිරීමේ වගකීමත් අප සතුයි. මේ අයුරින් කාන්තාවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල කාර්යභාරයක් ඉටු කර තිබෙනවා.

ඉදිරියේදීත් කාන්තාව සවිබල ගැන්වීම වෙනුවෙන් බොහෝ ක්‍රියාමාර්ග ගැනීමටත් සැලසුම් තිබෙනවා. කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත් කෙටුම්පත (Women Empowerment Bill) මේ වන විට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර අවසන්. මෙහි කාන්තාව සම්බන්ධයෙන් ප්‍රගතිගාමී බොහෝ කාරණා තිබෙනවා. ඒ යටතේ අපේක්ෂා කරන්නේ ස්වාධීන කාන්තා කොමිෂන් සභාවක් පිහිටුවීමට. කාන්තාවන්ට සම නියෝජනයක් ඉල්ලලා තිබෙනවා. කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවන අවස්ථාවලදී ක්‍රියා කිරීමටත් එහි විශේෂ ප්‍රතිපාදන තිබෙනවා.

කම්කරු අමාත්‍යාංශය විසින් කම්කරුවන් සම්බන්ධ සියලු ම නීති එකතු කර එක ම නීතියක් ගෙන ඒමට පියවර ගනු ලබමින් සිටිනවා. එහිදී සේවා ස්ථානවල සිදුවන හිරිහැර කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ ප්‍රතිපාදන ඇතුළත් කර තිබීම සාධනීය කරුණක්. කාන්තාවකට ඉහළ නිලධාරියකුගෙන් සිදුවන ලිංගික හිරිහැර පිළිබඳ ඔවුන් විසින් පැමිණිලි නොකිරීම වර්තමානයේ පවතින ගැටලුවක්. ඒ අනුව මේ තත්ත්වයට විසඳුම් ලබාදීමට ඉදිරියේදී හැකියාව ලැබේවි.

කම්කරු අමාත්‍යාංශය විසින් කම්කරුවන් සම්බන්ධ සියලු ම නීති එකතු කර එක ම නීතියක් ගෙන ඒමට පියවර ගනු ලබමින් සිටිනවා. එහිදී සේවා ස්ථානවල සිදුවන හිරිහැර කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ ප්‍රතිපාදන ඇතුළත් කර තිබීම සාධනීය කරුණක්. කාන්තාවකට ඉහළ නිලධාරියකුගෙන් සිදුවන ලිංගික හිරිහැර පිළිබඳ ඔවුන් විසින් පැමිණිලි නොකිරීම වර්තමානයේ පවතින ගැටලුවක්. ඒ අනුව මේ තත්ත්වයට විසඳුම් ලබාදීමට ඉදිරියේදී හැකියාව ලැබේවි.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත සංශෝධනයට අදාළ පියවර ගනිමින් සිටිනවා. ඒ, එම පනත ක්‍රියාත්මක කිරීමේදී පැන නැගුණු අඩුපාඩු හඳුනාගෙන, ඒවා මගහරවා ගැනීමට අදාළ ප්‍රතිපාදන සහිත ව ඉදිරියේදී සම්මත කරගැනීමේ අපේක්ෂාවෙන්. මේ අනුව නෛතිකමය සුරක්ෂිතතාවට අදාළ ව ඉදිරියේදී වඩාත් සාධනීය තත්ත්වයක් මෙරට කාන්තාව සම්බන්ධයෙන් නිර්මාණය වනු ඇති.

# සමාජ සහ සංස්කෘතික දුර්මත දුරැලිය යුතුයි



**මල්ලිකා පින්නවල**
සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

වර්තමාන සමාජයේ කාන්තාවන් ප්‍රතිනිෂ්පාදන කාර්යයෙන් ඔබ්බට ගොස් නිෂ්පාදන කාර්යවලත් නිරත වනවා. අතීතයේ පිරිමින් වෙත පැවරුණු නිෂ්පාදන කාර්යය එනම් ආදායම් ඉපයීමේ කාර්යයත් පැවරී තිබෙන්නේ කාන්තාව වෙත. ඇතැම් පවුල්වල ප්‍රධාන ආදායම් උපයන්නන් බවට කාන්තාව පත් වී අවසන්.

කාන්තාවන්ගේ කාර්යභාරය පිළිබඳ අතීතයේ සිට වර්තමානය දක්වා අවධානය යොමු කිරීමේදී ඇයට පැවරුණු කාර්යභාරය ප්‍රධාන නිෂ්පාදන (Production) සහ ප්‍රතිනිෂ්පාදන (Reproduction) කාර්යභාරය ලෙස කොටස් 02කට බෙදන්න පුළුවන්. අතීතයේ බොහෝ කාන්තාවන් ඉටු කළේ ප්‍රතිනිෂ්පාදන කාර්යය පමණයි. නිෂ්පාදන කාර්යභාරය පැවරුණේ පුරුෂයාට.

දරුවන්, වැඩිහිටියන්, රෝගීන් රැකබලා ගැනීමේ සිට දරුවන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලිය ද ඇතුළු ව පවුලේ පුළුල් පරාසයක සිදුවන සියලු ම කාර්යයන් ප්‍රතිනිෂ්පාදන කාර්යයන් යටතට ගැනුණා. මේ කාර්යය කාන්තාවට ලැබුණේ ගතානුගතික සම්ප්‍රදායෙන් උරුම වූ ප්‍රතිමාන ඔස්සේ. එම කාර්යයේදී පවුලක කොඳු නාරටිය වන්නේ කාන්තාව. ජීව විද්‍යාත්මක ව ගත් විටත් කාන්තාවට එකවර කාර්ය කිහිපයක නියැළීමේ සුවිශේෂ හැකියාවක් තිබෙනවා. පිරිමියා නිෂ්පාදන කාර්යයෙහි නියැළී එන තෙක් අනෙකුත් සියල්ල කළමනාකරණය කර ගැනීමේදී කාන්තාව පුරුදු පුහුණු කළ සකසුරුවම්කම ඇයට ජානවලින් උරුම වූවක්.

අතීතයේ පෞද්ගලික අවකාශයකට පමණක් සීමා වුණු කාන්තාවගේ කාර්යභාරය ඒ තත්ත්වයෙන් මිදී අද වන විට පොදු අවකාශයක් වෙත ගමන් කර තිබීම විශේෂත්වයක්. අතීත සමාජයේ පැවැති "කාන්තාවගේ තැන මුළුතැන්ගෙය, පිරිමින්ගේ තැන ඉස්තෝප්පුව", "කාන්තාවන් දරුවන් වැදීමට, පිරිමින් යුද බිමට" වැනි අදහස් අතීත සමාජයෙහි කාන්තාවට තිබූ ස්ථානයයි පිළිබිඹු කරන්නේ.

වර්තමාන සමාජයේ කාන්තාවන් ප්‍රතිනිෂ්පාදන කාර්යයෙන් ඔබ්බට ගොස් නිෂ්පාදන කාර්යවලත් නිරත වනවා. අතීතයේ පිරිමින් වෙත පැවරුණු නිෂ්පාදන කාර්යය එනම් ආදායම් ඉපයීමේ කාර්යයත් පැවරී තිබෙන්නේ කාන්තාව වෙත. ඇතැම් පවුල්වල ප්‍රධාන ආදායම් උපයන්නන් බවට කාන්තාව පත් වී අවසන්. එයින් පැහැදිලි වනවා වත්මන් සමාජයේ කාන්තාව සමාජයීය, ආර්ථික, දේශපාලන වශයෙන් විශාල කාර්යභාරයක් ඉටුකරන බව.

'ප්‍රසිද්ධාවකාශය සෑම විට ම පිරිමින්ටයි' ලෙසින් වන විශ්වාසය අභිභවමින් බොහෝ බාධක විඳගෙන කාන්තාවන් බලගැන්වෙමින් ඉදිරියට පැමිණ ඇති බවයි මගේ මතය. මේ තත්ත්වය මත වත්මන් කාන්තාවට පැවරී තිබෙන්නේ ද්විත්ව කාර්යයක්. නිෂ්පාදන කාර්යය ඉතා ඉහළ මට්ටමක රැකියාවක නියැළුණත් අපේ රටේ කාන්තාවට ප්‍රතිනිෂ්පාදන කාර්යයෙන් මිදෙන්නට බැහැ. විශේෂයෙන් නිවසේ කාර්ය ඉටු කරන්නේ කාන්තාව විසින් ම.

දියුණු රටවල මේ කාර්යභාරය බෙදා වෙන් කෙරුණත් දකුණු ආසියානු රටවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ව පවතින නිර්ණායකවල කාන්තාවට සමාන සමාජ තත්ත්වයක් හිමිවන්නේ නැහැ. එහෙත් දකුණු ආසියාවේ අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජවාදී දර්ශකය ඉහළ මට්ටමකයි පවතින්නේ. තමාට පැවරෙන බැරෑරුම් නිෂ්පාදන කාර්යයකින් අනතුරු ව වුවත් කාන්තාවන් තමා වෙත පැවරෙන ගෘහීය කාර්ය ඉටු කරන්නේ සතුටින්. විශේෂයෙන් දකුණු ආසියානු, දකුණු අප්‍රිකානු හා ලතින් ඇමරිකානු සමාජවල තවදුරටත් පුරුෂයන්ට මූලික ස්ථානයක් හිමි වනවා.

ශ්‍රී ලාංකික කාන්තාව තීරණ ගැනීමේදී අවසානයේ බොහෝ විට පිරිමියකුගෙන් අනුමැතිය බලාපොරොත්තු වනවා. ඒ, බොහෝ විට පියා, ස්වාමිපුරුෂයා හෝ සහෝදරයකු වන්නට පුළුවන්. මෙය හඳුන්වන්නේ දකුණු ආසියානු මානසිකත්වය (South Asian Mentality) යනුවෙන්. එයයි අපට සම්ප්‍රදායයෙන්, සංස්කෘතියෙන් ලැබුණු දෙය. එය වෙනස් කරන්නට බලාපොරොත්තු වන්නෙත් නැහැ.

වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු දකුණු ආසියානු රටවල කාන්තාව බලගැන්වී තිබෙනවා. එයට එක් හේතුවක් අධ්‍යාපනය. අධ්‍යාපනය හා ආර්ථිකය බලගැන්වීමෙනුයි ඒ සමාන

ව අනෙකුත් අංශත් බලගැන්වෙන්නේ. මෙරට ජනගහනය තුළත් කාන්තා ප්‍රතිශතය වැඩියි. බොහෝ උසස් සමාජ ස්ථරවල උගත් කාන්තාවන් සිටිනවා. පවතින සමාජ රටාවේ පිරිමින් සොයන්නේ මුදල් සෙවීම සඳහා කෙටි ක්‍රම. ඔවුන් උත්සාහ දරනවා ඉක්මනින් රැකියාවක නිරත වීමට. මේ තත්ත්වය කාන්තාවන්ට වාසිදායක තත්ත්වයක් නිර්මාණය කරන නිසයි මෙරට ගැහැනු දරුවන්ට වැඩි වශයෙන් උසස් අධ්‍යාපනයට අවස්ථාව ලැබී ඇත්තේ. මේ හේතුවෙන් සමාජයේ ඇතැම් ස්ථරවල කාන්තා නියෝජනය වැඩි වී තිබෙනවා. එහෙත් ඇතැම් ආයතනයක කාන්තාවන් රැකියා සඳහා බඳවා ගැනීමට මැලිකමක් දක්වන බව පෙනී යන්නක්. පවුලේ කාර්ය මෙන් ම මාතෘ නිවාඩු ආදිය නිසා කාන්තාවන් නිවාඩු ගැනීමේ ප්‍රවණතාව වැඩි බවයි ඇතැමුන්ගේ මතය.

මෙරට ආර්ථිකයට පිරිමි දායකත්වය 60%-65%ක් වන අතර කාන්තා දායකත්වය 30%- 35%ක්. කාන්තාවන් අදෘශ්‍යමාන ලෙස ආර්ථිකයට ලබාදෙන දායකත්වය සංඛ්‍යා දත්තවලට ගණනය වන්නේ නැහැ. එහෙත් මෙරට ආර්ථිකය ප්‍රධාන වශයෙන් ම ක්‍රියාත්මක වන්නේ කාන්තාවන්ගෙන්. සංක්‍රමණිකයන්ගෙන් ලැබෙන ප්‍රේෂණ, ඇඟලුම් කර්මාන්තය සහ වැවිලි අංශයෙන් ලැබෙන දායකත්වයේදී එය කැපී පෙනෙනවා. මේ දායකත්වය අවිධිමත් සහ අදෘශ්‍යමාන වීම කනගාටුවට කරුණක්.

නිදසුනක් ලෙස පර්යේෂණයකදී නිවසකට ගොස් රැකියාව පිළිබඳ විමසන අවස්ථාවල කාන්තාවන් බොහෝ විට පවසන්නේ ඇයට රැකියාවක් නොමැති බව. එහෙත් පිරිමින් රැකියාවක් නොකළත් දකුණු ආසියානු මානසිකත්වයේදී තමා රැකියාවක් කරන බව හැඟවීමට හැමවිට ම උත්සාහ කරනවා. කාන්තාව රැකියාවක් නොකරන බව පැවසුවත් බොහෝ විට ඇය කෑම සැකසීම, ගෙවතු වගා වැනි ගෘහස්ථ රැකියා කරමින් ආදායම් උපයනවා. මේ ඔස්සේ ඇය පවුලට මෙන් ම රටේ ආර්ථිකයට අදෘශ්‍යමාන මෙහෙවරක් ඉටු කළත් මේවා දත්තවලට ගණනය වන්නේ නැහැ.

ක්‍රියාකාරී දේශපාලනයේදී කාන්තාවට විශාල භූමිකාවක් ඉටු කළ හැකියි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය වැනි කාන්තා නායකත්ව බිහි වූ රටක් වුවත් මෙරට දේශපාලන ක්ෂේත්‍රය අපරාධීකරණයට ලක්වීම නිසා කාන්තාවන් දේශපාලනයේදී සෘජු දේශපාලනයට සහභාගි වීමට තවදුරටත් මැලිකමක් දක්වනවා.

වර්තමානයේ අපට කාන්තා පැරෂුට් බලකායක් පවා තිබෙනවා. පරම්පරාවෙන් උරුම වූ රැකියාවක් ලෙස අලි බැලීමේ නිරතවන කාන්තාවක් සිටිනවා. එහෙත් ඇයට අලියා පිට යාමේදී පුරුෂයා මෙන් කකුල් දෙපසට දමා අලියා පිට මත වාඩිවීම තහනම්. දළදා මාලිගාව, ශ්‍රී මහා බෝධිය වැනි ආගමික ස්ථාන වන්දනාමාන කිරීමේදී කාන්තාවට පනවා තිබෙන සීමා ආගමෙන් නොව පසුකාලීන අනුගාමිකයන් විසින් කාන්තාවන් පහත් කොට සලකනු ලබන අවස්ථාවලට උදාහරණයක්. දරුවන් ලැබීමෙන් අනතුරු ව මාස 03ක් යන තෙක් ඇතැම් ස්ථානවලට ඇතුළුවීම කාන්තාවන්ට සීමා කෙරෙනවා. දළදා මාලිගාව හා බැඳුණු චාරිත්‍ර නිසා මහනුවරට දිසාපතිනියක් පත් කෙරෙන්නේ නැහැ. දළදා පෙරහැර සාර්ථක ව නිමා කර රටේ ජනාධිපතිවරයාට එය සම්ප්‍රදානුකූල ව දැනුම්දීම සිදු කරන්නේ දිසාපතිවරයා. එම කාර්යයට කාන්තාව නුසුදුසුයි යන මතය හේතුවෙනුයි මෙලෙස ක්‍රියා කරන්නේ. මේ ආකාරයට සංස්කෘතිය, සම්ප්‍රදාය මත කාන්තාවගේ කාර්යභාරය සීමා කිරීමට උත්සාහ දරන අවස්ථා සමාජයේ තිබෙනවා.


මේ සාම්ප්‍රදායික මතවලින් මිදෙන්න කාලයයි එළඹ තිබෙන්නේ. අඩුපාඩු හඳුනාගෙන ඒවා මගහරවා ගනිමින් කාන්තාවන් බලගැන්වීමට ක්‍රියාමාර්ග ගත යුතු වනවා. ආර්ථික වශයෙන් පමණක් නොව සමාජ, සංස්කෘතික වශයෙන් ඇති දුර්මත නිසා කාන්තාව පහත් කොට සැලකීම සමාජයෙන් තුරන් කළ යුතු වනවා. කාන්තා හිංසනය තුරන් කිරීම සඳහා ශක්තිමත් නීති පද්ධතියක් ස්ථාපිත කිරීමත් වැදගත්. මේ සඳහා නීතිය ශක්තිමත් හා ප්‍රමාණවත් නැහැ. ශක්තිමත් කාන්තා ව්‍යාපාර ඇති කිරීමෙන් කාන්තාවන් සවිබල ගැන්වීම කාලීන අවශ්‍යතාවක්.

දියුණු රටවල මේ කාර්යභාරය බෙදා වෙන් කෙරුණත් දකුණු ආසියානු රටවල ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ ව පවතින නිර්ණායකවල කාන්තාවට සමාන සමාජ තත්ත්වයක් හිමිවන්නේ නැහැ. එහෙත් දකුණු ආසියාවේ අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජවාදී දර්ශකය ඉහළ මට්ටමකයි පවතින්නේ.



# GFU රූපමය පෙළහර

සටහන
**චානුද දුල්ශාන් ද මැල්**
(රජයේ චිත්‍රපට අංශය)




ගෙවුණු වසරේ (2023) සමරන්නට යෙදුණු රජයේ චිත්‍රපට අංශයේ 75 වැනි සංවත්සරයට සමගාමී ව ජාතික වැදගත්කමක් දරන චිත්‍රපට නව පරපුර වෙත සමීප කරවීම කාලීන අවශ්‍යතාවක් බව හඳුනා ගත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව දෙසතිය පුවත් සඟරාවේ ඉදිරි කලාපවලින් එම චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් කෙටි විමසුමක් ගෙන ඒමට සූදානම් බවට පසුගිය කලාපයෙන් දැනුවත් කළෙමු. රජයේ චිත්‍රපට අංශයේ යූටියුබ් නාලිකාවට පිවිසීමෙන් එම චිත්‍රපට නරඹා ඔබගේ රසඥතාව වර්ධනය කර ගැනීමටත් ඉතිහාසය යළි කියවා ගැනීමටත් අපි එහිදී ඔබට ආරාධනා කළෙමු.

මේ, චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් පළමු කෙටි විමසුමයි

**මීගමුවේ මසුන් මරන්නෝ**

වාර්තාමය සිනමා කැමරාවට හසුවන රූප ඔස්සේ කියැවෙන මානව කතන්දරය, ඒ ඒ කාල පරිච්ඡේද පිළිබඳ පුළුල් අවබෝධයකට මාවත විවර කර දෙයි. මෙය ද එලෙස තෙප්පම මත ජීවිතය තරකර ගත් මීගමුවේ මස් මරන්නන් ගැන ය.

කළු සුදු මි.මි 35 කාණ්ඩයේ වාර්තා සිනමාපටයක් වූ මෙය 1952 වර්ෂයේදී රූගත කෙරිණි. මිනිත්තු 22ක් ඇතුළත ධීවර සංස්කෘතියේ අල්පමාත්‍රයක සිදුවීම් ආඛ්‍යානයක් රූපමය භාෂාවෙන් පෙළගස්වන්නේ ජෝර්ජ් වික්‍රමසිංහයන් ය. ඊට සිංහල භාෂාවෙන් පසුබිම් කථනය ගළපන්නේ රැල්ෆ් කීන්ගේ අදහසකින් ය. ඒ, චලනය වන රූප ඛණ්ඩවලට ජීවමය ගුණයක් ලබා දෙමිනි. ජන සංගීතය ඔපෙරා ශෛලියෙන් හැඩ කර ඇත්තේ දේවාර් සූරියසේන ය. ජෝර්ජ් ස්ටුවට්ගේ තෙවැනි ඇසට හසුකරගත් රූප එකට ගළපා ඇත්තේ පී කලාබ්‍රියා ය. ශබ්ද පරිපාලනය එෆ් සේරාගෙනි.

මෙම වාර්තා චිත්‍රපටයේ සෑම කොටසක් ම ඊට අදාළ ජන සංස්කෘතිය, පරිසරය හා සම්බන්ධ අතුරු දර්ශන උපයෝගි කොටගෙන, දේශීය සංගීතය හා ස්වාභාවික ශබ්ද සංකලනය කරමින් මනා ජීවගුණයකින් යුතු ව ගොඩනැගුණ හෙයින් මෙය අදටත් ලාංකේය ජන පර්යේෂණ ඉතිහාසයේ වඩා වැදගත් මූලාශ්‍රයක් වී ඇත. එහි පෙළ ගැස්ම මෙසේ ය.

**තෙප්පම්කරුවන් මුහුදු යෑම**

වාර්තා චිත්‍රපටය ආරම්භ වන්නේ මීගමු කලපුවේ රුවල් ඔරුවක් ගමන ආරම්භ කරමිනි. එහි පසුබිමින් ලක්දිව වෙරළට අරුණාලෝකය වැටෙත් ම මීගමුවේ මස්









මරන්නට උදා වන්නේ යළිත් වැඩ බහුල දිනයක් බැව් ප්‍රේක්ෂක අපට කියාපායි. ලංකාවේ පරම්පරාගත ව මුහුදු ගමනාගමනයට හුරුපුරුදු කොල්ලෑව සහිත පුංචි ඔරු ආදිය මේ සඳහා යොදා ගැනේ.

දෛනික ව මුහුදු සැතපුම් 5ක්, 10ක් හා 20ක් පමණ ගමන්කොට මසුන් මරණ තිත්පොළ වෙත ඔවුහු ගමන් කරති. ධීවරයන් මුහුදට ගිය පසු ඔවුන්ගේ භාර්යාවෝ හෝ මව්වරු ගමනට ආගමික ආශිර්වාදය පතති. මේ තත්ත්වය මත මීගමු වෙරළ හරිම කාර්යබහුල ය.

ලුණුමිදෙල්ල කොට හතරක් එක්කර, වැරකොට බැඳගත් අඩි 08ක් දිග ඇති අඩි 04ක් පළල ලෙස තෙප්පම සාද ගනී. මුහුදු ගමනට වුවමනා කරන සියලු දෑ සූදානම් කළ පසු වැලි කන්දෙන් තෙප්පම සීරුවෙන් දියට හෙලයි. අලුයම දියට යන තෙප්පම සුළං බලයෙන් ගමන් කරයි. එක තෙප්පමක දෙදෙනා බැගින් නැඟගත් මිනිස්සු ඔවුන්ගේ කුඩා වේදිකාවල සමබර ව සිටින සේ දක්ෂ ලෙස වාඩිවී ඇත. මුහුදේ කොරල් කඳුවලින් ඔබ්බට ගොස් ගැඹුරු තැන්වල දැල් ගසති.

ගොඩබිම තවත් සිදුවීමක් ආරම්භ වේ. එය නම් උදෑසන අලුත් පාරුවක් මුහුදට ගෙනයාමයි. පල්ලියේ පූජකතුමන් අලුත් පාරුව ඉදිරියේ යාඥා කරයි. භක්තිමත් උත්සව ලීලාවෙන් ඔරුව සිසාරා ගමන් කරන කුඩා පෙරහැර, එය මස් මරන්නන්ගේ සාන්තුවරයා වූ ශුද්ධ අන්තෝනිතුමන්ට කැපකරයි. ක්‍රමයෙන් පිරිස තම පාරුව දියඹට ගෙනයයි.

**දැල් ඇදීම**

වැඩිහිටි පිරිමින් සුරුට්ටු හෝ බීඩි ඉරීම පුරුද්දක් වී ඇතත් මුහුදු යෑමට යම් වත්කමක් තිබිය යුතු ය. වැඩිහිටි හා තරුණ පිරිමි ඈත දියඹට ගොස් එළනු ලැබූ මාදැල් අදිනු ඇත. වටකුරු දැල්, එළනා දැල්, හතරස් දැල්, ගහන දැල් ආදී විවිධ හැඩහුරුකම් ඇති දැල් ආදියත් ඒ සියල්ලට ම වඩා ලොකු දැල් වර්ගය නම් අද දින අලුයම් සමයේ ආශිර්වද කර දියඹට දමන ලද පාරුවට අයත් විශාල මාදැල් ය, උදයවරුවේ ම අව් රශ්මිය විඳිමින් ඔවුන් මේ දැල ගොඩට අදින්නේ හිමිහිට, අධික







වෙහෙස දරමින් අඟලෙන් අඟලට මුහුදේ වඩදිය බාදිය ගැන සැලකිලිමත් වෙමිනි. මැදැල් අදින්නේ රිද්මයකට ය. ඔවුහු සැම පාද එක විට තාලයට තබමින් ද කවි කියමින් ද දැල අදිති.

අන්තිමේදී දැල ගොඩට ම වාගේ ඇවිත් ය. මිනිසුන් කඩිමුඩියේ එහා මෙහා දුවත් ම, නැතහොත් මඩිය ඇදීමට උකුලක් වතුරට බසිත් ම දැල ඇදීමේ තාලය ද කැඩෙන්නේ ය. පසු පිරිස එකතුවී මාළු අසුවී ඇති දැල් කෙළවරේ ඇති මඩිය ඔසවා ගොඩට ගෙන එයි. එහි මත්ස්‍යන් දහසක් සිටිය හැකි ය. නැතහොත් එකෙක්වත් සිටිය නොහැකි ය. මෙතරම් වේලා බොහෝ ඉවසිල්ලෙන් හෙළූ දහඩිය වෙනුවෙන් ඔවුන්ට කුමක් ලැබෙයි ද? දැල ලිහා බලති. අද අසුවී තිබෙන්නේ ඉතා අඩුවෙනි. සමහරවිට හෙට වාසනාව උදාවන්නට පුළුවනි.

ඒ නම් තෙප්පම්කාරයන්ට වාසි වූ හොඳ දවසකි. රිදී පාට කොරපොතුවලින් වැසී ගිය සිය ගණන් මාළුවන්ගෙන් පිරුණු දැල් දිලිසෙන සේ පෙනේ. දැල්වලින් මාළු එළියට ගන්නන් බොහෝ ය. මාළු තොගයෙන් වාසි නොවෙන පවුලක් ගමේ නැති තරම් ය.

**මාළු වෙන්දේසිය**

මාළු වෙන්දේසිය පටන් ගැනේ. සෙනඟ වටේට රැස්වෙති. වෙන්දේසිකරු ඉල්ලන මිල ගණන් කියාගෙන යයි. ලෙජර් ලිපිකරු විකුණූ ගණන් මිම් ලියයි. විවෘත වෙළෙඳපොළෙහි, අසුවුණ මාළු ප්‍රමාණයට අනුව මිල ගණන් වෙනස් වෙයි. බොහෝ විට මහජනයාත් මාළු අල්ලන්නාත් තැරැව්කාරයා විසින් සූරාකනු ලබයි. මාළු විකුණන හැම රුපියල් 10කින් ම ධීවරයන්ට ඇතැම් විට ලැබෙන්නේ රුපියල් 05කි. පැය ගණන් වෙන්දේසිය දිග්ගැසේ. කලපුව දිගේ එන ඔරුවලින් මාළු ගෙන එයි. ඒ අතර ඈත මුහුදේදී බිලී කොකුවලින් අල්ලා ගන්නා ලද ලොකු මාළු ද වෙන්දේසිපොළට රැගෙන එයි. තද නැති, කටට රහ ඇති රාත්තල් 10-20 දක්වා ඇති තෝරු, වටකුරු රතු තබලයෝ, රිදී පැහැති කටුවල්ලෝ, වයිරම් ගල් මාළු, තිත් සහිත හැඳැල්ලු හා අඩි හතේ මෝරු ද මේ අතර සිටී.







වෙන්දේසිපොළට රැස් වූ හැමදෙනාගේ ම ගත සිත මාළුවලට ය. වේලට මාළු කැල්ලක් ගන්න සිටින ගෘහණිය, මාළු පෙතිවලට කපා විකුණන මාළු කත්කරු, මීගමුවෙන් ආ සිල්ලර වෙළෙන්දන්, කොළඹින් ආ තොග වෙළෙන්දන් මාළු ගන්න පැමිණ සිටි. අන්තිම මාළුවත් විකිණේ. සෙනග විසිර යති. ක්‍රමයෙන් වෙළෙඳපොළේ කලබලය නැති වී යයි. දැන් වෙන්දේසි මඩුව හිස් ය.

## ඇඳුම් පැළඳුම්

මීගමු ධීවරයන් බහුතරයකගේ වස්ත්‍රය වූයේ අමුඩය හෝ සරමයි. ඊට උඩින් ලේස් බැනියමක් ද අත් දිග කපු කමිසයක් ද එසේත් නැතහොත් උඩුකය නිරුවත් කොට ද තිබේ. හිස රෙදි කැබැල්ලකින් ජාටාවක් බැඳ ඇත. නැතහොත් පන්වලින් වියන ලද තොප්පියක් පැලඳ ඇත. මුහුදු වෙරළේ සිටින කුඩා ළමයින්ගේ වස්ත්‍රය වූයේ අමුඩයයි. ධීවර කාන්තාවන්ගේ වස්ත්‍ර වී ඇත්තේ චීත්තය හා රේන්ද හැට්ට ය. පිරිමි ළමයින් පාසලට යන විට කොට කලිසමත් අත්දිග කමිසයත් අඳින අතර ගැහැනු දරුවන් ගවුමත් අතට වළලුත් නළලට තිලකයත් තබා ඇත. මෙකල නිශ්චිත ඇඳුමක් පාසලට නොතිබුණි.

## කටුදැල්කාරයන්ගේ දින චර්යාව

මාළු අල්ලනන් නිදි දෙව්දුව තුරුළට වී සැනසුම් ලබයි. ඔරුකාරයන්ගේ හා තෙප්පම්කාරයන්ගේ වැඩ හෙට අරුණෝදය වනතුරු හමාරයි. එහෙත් කටුදැල්කාරයන්ගේ වැඩ යන්තම් පටන් ගත්තා විතරයි. කටුදැල්කාරයෝ කට්ට කරුවලේ කලපුවේ ඉස්සන් හා කොකිරිස්සන් අල්ලති. වටින් පිටින් ඇඳිරි වැටීගෙන එනවිට ඔවුහු කුඩා ඔරු, පාරු කුඩා කලපුවෙන් මහා කලපුවට අද්දවති. ඉක්බිති ඉස්සන් කොකිරිස්සන් දැල් ඇතුළට ඇදී ඒම පිණිස භූමිතෙල් විලක්කු දල්වති. මේ මාළුවන් රළ පහරත් සමග රැන් පිටින් දැල් මඩියට එනතුරු ඔවුහු නොයිවසිලි ව රැක සිටිති. රාත්‍රිය ගෙවී යයි. ලංකා වෙරළ හිරු රැස් දහරින් බබලයි. ඔරු යළිත් දියත් වෙයි. මීගමු මස් මරන්නන්ට තවත් වැඩ බහුල වූ දවසක් උදා වේ.

## සමුපකාර ක්‍රමය

මසුන් මරන්නන් මෙරට හඳුන්වනු ලැබූ කුලය 'කරාව' ය. එම මුහුදුබඩ කුලය සංක්‍රමණික ජන කණ්ඩායම් ආශ්‍රයෙන් ගොඩනැඟී තිබුණු කුලයක් වුව ද එය සිංහල වැඩවසම් ක්‍රමයට හොඳින් අනුගත වී නොතිබුණි. මෙම ප්‍රජාව විදේශ පාලනයකට අයත් ප්‍රදේශවල එක දිගට ජීවත් වූ ජනතාවක් වශයෙන් වාණිජ්‍යකරණයට හුරුපුරුදු ව සිටි. ඔවුන්ගේ දැවෙන ගැටලුවලට විසඳුම් දී ඇත්තේ මෙසේ ය,

යල් පැනපු ඔරු, ලෙඩ දුන් ණය තුරුස් යන මේවා ඔවුන් ඉදිරියේ තිබෙන ගැටලුවලින් සමහරකි. මේවා දවසින් නිරාකරණය කළ නොහැකි ය. එහෙත් දැන් ඒ සම්බන්ධ ව ක්‍රියා ආරම්භ කර තිබේ. වඩා හොඳ දැල් ආදිය සපයනු ලැබේ. වෙරළ අයිනේ ඒ ඒ තැන්වල විපතට පත්වන මස්මරන්නන්ට සහය වීම පිණිස බෝට්ටු පිළියෙල කර ඇත්තේ ය. මස්මරන්නන් සමුපකාර ක්‍රමය අනුව හැඩගැස්වීමට වැයම් කරනු ලැබේ. මේ ක්‍රමයෙන් ඔවුන්ගේ මාළුවලට නියම මිලට අවශ්‍ය ණය තුරුස් ලබා ගතහැකි ය. මස් මරන්නන් ලංකාවේ වැසියන් බැව් මෙනෙහි කළ යුතු ය.



# ලෝක භාෂා අතර සිංහලය



(පෙබරවාරි 21 දිනට යෙදුණු විශ්ව මාතෘ භාෂා දිනය නිමිත්තෙනි)



මහාචාර්ය
**රත්නසිරි අරංගල**
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

භාෂාව මුල් කොට ගනිමින් ස්වාධීන රාජ්‍යයක් පිහිටුවීම මානව ශිෂ්ටාචාරයේ සුවිශේෂ සිද්ධියක් වන බැවින් බෙංගාලි මවු බස් සටන සමරමින් පෙබරවාරි 21 විශ්ව මාතෘ භාෂා දිනය ලෙස නම් කෙරිණි. 7000ක් පමණ වන ලෝක ව්‍යවහාර භාෂා අතුරෙන් බෙංගාලි භාෂාවට යම් වැදගත්කමක් හිමි වේ ද සිංහලයට ද ලෝක භාෂා අතර ඒ සා වැදගත්කමක් හිමි වන බව අපට ඇතැම් විට රහසක් විය හැකි ය.

බෙංගාලි බස ලෝක ව්‍යවහාර භාෂා අතරෙන් 08 වන ස්ථානය හිමි කොට ගනී. සිංහලයට හිමි වන්නේ 60-70 අතර ස්ථානයකි. සිංහලය ලෝක භාෂා අතර මුල් පෙළෙහි සිටිනා බසක් බව ඉන් පෙනී යයි.

සිංහලය දකුණු ආසියා භාෂා-භූ-කලාපයෙහි ව්‍යවහාර වන ප්‍රධාන භාෂාවකි. මේ කලාපයෙහි භාෂා 650-700 අතර සංඛ්‍යාවක් ව්‍යවහාර වන බව පිළිගැනේ. සිංහලයට ඒ අතුරෙන් 13 වන ස්ථානය හිමි වෙයි. භාෂා ඥාති සම්බන්ධතා අනුව මේ කලාපයෙහි ප්‍රධාන භාෂා පවුල් හතරකට සම්බන්ධ කළ හැකි වෙයි. එනම් ඉන්දු-යුරෝපීය පවුලේ ඉන්දු-ආර්ය උපගණය, ද්‍රාවිඩ භාෂා පවුල, ඔස්ට්‍රනීශියන් භාෂා පවුල, ඔස්ට්‍රො-ඒශියාටික් පවුල හා සිනෝ-ටිබෙටියන් පවුලේ ටිබෙටෝ-බර්මන් ශාඛාව යි. භාෂා ඥාති සම්බන්ධතා අනුව සිංහලය ඉන්දු-ආර්ය උපගණය මඟින් ඉන්දු-ඉරාණීය ගණය ඔස්සේ ඉන්දු-යුරෝපීය පවුලට සම්බන්ධ වෙයි.

ඉන්දු-යුරෝපීය පවුල භූ කලාපීය විස්තෘතිය අනුව හඳුන්වනු ලබන, පොදු පූර්වජ භාෂාවකින් සම්භවය වූ භාෂා සමූහයකි. එහි සමාරම්භය ක්‍රිස්තු පූර්ව 7000 පමණ කාලයේදී දකුණු යුරෝපය හෝ තුර්කිය හෝ ආසන්න ප්‍රදේශයක සිදු වූ බවත් අනතුරු ව අයිස්ලන්තය හා බ්‍රිතාන්‍ය දූපත් ඇතුළත් යුරෝපීය භූ කලාපයෙහි රුසියානු දේශ සීමාවේ නැගෙනහිර අන්තය තෙක් ද උතුරු හා දකුණු ආසියා කලාපයෙහි ද ව්‍යාප්ත වූ බවත් පිළිගැනේ. 17 වන සියවස පමණ වන තෙක් ඉන්දු-යුරෝපීය භාෂා පවුලේ භාෂා අතුරෙන් ලෝකයේ ඈත දකුණු කෙළවරෙහි වූ භාෂාව වූයේ සිංහලය යි. අද වන විට යුරෝපීය යටත්විජිත ප්‍රතිපත්තිය හේතුවෙන් දකුණු අප්‍රිකාව, ඇමරිකා මහාද්වීප හා ඕස්ට්‍රේලියා-නවසීලන්ත කලාපය තෙක් ඉන්දු-යුරෝපීය භාෂා පවුල ව්‍යාප්ත වී තිබේ.

සිංහලය අයත් වන ඉන්දු-ආර්ය උපගණයේ පැරණි ම ව්‍යවහාර සේ හමු වන්නේ ඍග්වේදයෙහි මුල් කොටස්වල භාෂාව යි. වෛදික භාෂාව යනුවෙන් හැඳින්වෙන මෙහි ආදි ම අවස්ථාව ක්‍රිස්තු පූර්ව 18 වන සියවස පමණ කාලයෙහි විය හැකි බව විශ්වාස කෙරේ. දිගු කලක් මුඛ පරම්පරාවෙන් රැගෙන ආ වෛදික ඉගැන්වීම්වල ඒවාහි මුල් භාෂා ස්වරූප ආරක්ෂා වී ඇතැයි සැලකේ. ඒවා ක්‍රිස්තු වර්ෂාරම්භක යුගයේදී ලේඛනගත කෙරිණි. ක්‍රි. පූ. පස් වන සියවස පමණ වන විට වෛදික භාෂාව ව්‍යවහාරයෙන් ඈත් වූ සේ සැලකේ. මේ කාලයෙහි ඉන්දියාවේ සිදු වූ සමාජ-සංස්කෘතික (විශේෂයෙන් ම ආගමික) පෙරළිය ඊට හේතු වූ බව පෙනේ. සංස්කෘත භාෂාව යනුවෙන් අද සම්භාවනාවට පත් ව තිබෙනුයේ වෛදික භාෂාව ඇසුරෙන් සකස් කොට ගැනුණු සාහිතයික ව්‍යවහාරයකි. එය බුද්ධ කාලයට, එනම් ක්‍රි. පූ. 6-5 වන සියවස් කාලයට පසු ව සකසා ගන්නා ලද්දක් යැයි පිළිගැනේ. එහි ද ලේඛනගත වීම ක්‍රිස්තු වර්ෂාරම්භයෙන් පසු ව සිදු වූ බව පෙනී යයි.

බුද්ධ කාලයෙහි ඉන්දියාවේ සිදු වූ සමාජ විපර්යාසයේ ප්‍රකට ලක්ෂණයක් සේ සැලකෙන්නේ වෛදික හා බ්‍රාහ්මණ (‘බ්‍රාහ්මණවාදය’ වෛදික යුගයේ අග භාගයේදී (ක්‍රි.පූ. 1100-500) වෛදික ආගමෙන් වර්ධනය වූ ප්‍රවණතාවකි) ආගම්වලට එරෙහි වූ පොදු ජන ආගමික සම්ප්‍රදායයන්හි වර්ධනය යි. බෞද්ධ හා ජෛන ඉගැන්වීම් මේ සම්ප්‍රදායයන්හි මුල් තැන් ගනී. මේ තත්ත්වය ඉන්දියාවේ භාෂා දෘෂ්ටිමණ්ඩලයේ (linguistic landscape) මුහුණුවර වෙනස් කිරීමෙහි ලා තීරණාත්මක සාධකයක් වූ බව පෙනේ. සිංහල භාෂාවට පදනම වැටුණේ බුද්ධ කාලයට සමාසන්න කාලයෙහි බව පිළිගත හැකි ය.

දැනට ප්‍රචලිත වංස කථා හා ජනප්‍රවාද අනුව ලංකාව ජනාවාස කෙරෙනුයේ සම්බුද්ධ පරිනිර්වාණ දිනයෙහි මේ දිවයිනට සංක්‍රමණය වූ විජය නමැති රාජ කුමාරයකු ප්‍රමුඛ පිරිසකගෙනි. එයින් පසු ව ඔවුන්ට සම්බන්ධ තවත් පිරිස් කිහිපයක් ද දිවයිනට පැමිණ ජනපදකරණයෙහි නිරත වූ බව පැවසේ. මේවා සිංහල ජනයා සිය අතීතය සම්බන්ධයෙන් තිබුණු පරම්පරා කථා ඇසුරෙන් සකසා ගත් පුවත් බවත් ‘විජය’ යනු ඓතිහාසික පුද්ගල චරිතයකට වඩා සංක්‍රමණ ධාරා කිහිපයක් අතර සිදු වූ ගැටුමෙන් පසු ව ජයග්‍රාහී ලෙස ජනපද පිහිටුවූ පුද්ගල කණ්ඩායම පිළිබඳ සංකේතයක් විය හැකි බවත් ඉතිහාසඥයන්ගේ මතය යි. එයින් පැහැදිලි වන්නේ සියවස් කිහිපයක් තිස්සේ වරින් වර ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණි ජනයා මේ දිවයිනෙහි පදිංචිකරුවන් බවට පත් වූ ආකාරය යි. ඔවුන් මෙහි පැමිණෙන විට ඒ ඒ ප්‍රදේශවල ව්‍යවහාර වූ භාෂා රැගෙන පැමිණි බව පැහැදිලි ය. ඉන්දියානු සාංක්‍රමණිකයන් පැමිණෙන විටත් මේ දිවයිනේ මුල් පදිංචිකරුවන් සේ සැලකිය හැකි ජන කොටස් කිහිපයක් විසූ බවට පුරාවිද්‍යා සාධක හමු වෙයි. ඒවායින් පෙනී යන්නේ ඒ ජන කොටස්වල අතීතය ක්‍රි.පූ. 30000ක තරම් ඈතකට විහිදෙන බව යි. කායික ව්‍යුහය අනුව ඔවුන් ද නූතන මානවයන් වන බැවින් ඔවුන්ට භාෂා තිබුණු බව ප්‍රකට ය. එහෙත් ඒවා කෙබුඳු ද යන්න පිළිබඳ කිසිදු ස්ථිර සාධකයක් හමු නො වේ. ඉන්දියාවෙන් සංක්‍රමණය වූ ජනයා ව්‍යවහාර කළ භාෂා අප ඉහත සඳහන් කළ වෛදික භාෂාවට මුල් වූ කථන ව්‍යවහාර -ප්‍රාකෘත භාෂා- බව වාග්විද්‍යාඥයෝ සාධක සහිත ව පෙන්වා දෙති. බුද්ධ කාලය වන විටත් එසේ පැමිණි කණ්ඩායම් දිවයිනේ නැගෙනහිර හා ගිනිකොණ ප්‍රදේශවල ද වයඹ කලාපයේ හා රට අභ්‍යන්තරයේ ස්ථාන කිහිපයක ද ජනපද පිහිටුවන්නට ඇතැයි සැලකිය හැකි ය. ඒ සම්බන්ධයෙන් පිළිගත හැකි සාධක වන්නේ ක්‍රිස්තු පූර්ව තුන් වන හා දෙවන සියවස් කාලයෙහි සිට දිවයිනේ තැනින් තැන සංඝයාට පූජා කළ ලෙන් ආරාමවල පූජා පාඨ යි. දිවයිනේ ලේඛනය ව්‍යාප්ත වීම හා ස්ථාවර මාධ්‍යයක අකුරු ලිවීම සිදු වන්නේ මේ ලෙන් ආරාම ප්‍රදානය සමගිනි. මේ ලිපි ලියවෙන අවධිය වන විට මෙරට ව්‍යවහාර වූ භාෂාව ඉන්දියාවෙන් වරින් වර පැමිණි කණ්ඩායම්වල භාෂා ව්‍යවහාර හා ඔවුන්ගේ සංක්‍රමණවලට පූර්වයෙහි විසූ ආදිවාසී ජනයාගේ භාෂා ඒකාබද්ධ වීමෙන් සකස් වූ නව භාෂාවක් බවට පත් වී තිබෙන ආකාරය හඳුනා ගත හැකි ය. මේ නව භාෂාව ‘සිංහල ප්‍රාකෘත’ යනුවෙන් හැඳින්වේ. එහි අරුත ඉන්දියාවේ ව්‍යවහාර වූ ප්‍රාකෘත භාෂාවලින් සම්භවය වූ හා ‘සිංහලයට’ මුල් වූ ව්‍යවහාරය යනු යි.

සිංහල ප්‍රාකෘතය සම්බන්ධ සාධක හමු වන්නේ ක්‍රි. පූ. තෙවන සියවසේ වුව ද එහි ආරම්භය සිදු වන්නේ ඉන් සියවස් දෙක තුනකට ඉහතදී බව පැහැදිලි ය. එය ක්‍රි. ව. 6-7 සියවස් වන විට සිංහලය ලෙස සැලකිය හැකි ස්වාධීන භාෂාවක් බවට පත් වී අවසන් ය. මේ කාලයට අයත් සෙල් ලිපි හා සීගිරි කුරුටු ගී මේ ස්වාධීන භාෂාවේ ලක්ෂණ පෙන්නුම් කරයි. ඉන්දියාවේ ව්‍යවහාර වන භාෂා ස්වාධීන භාෂා තත්ත්වයට පත් වන්නේ දස වන සියවසින් පසු කාලයේ ය. එබැවින් සිංහලය නූතන ඉන්දු-ආර්ය භාෂා අතුරෙන් පැරණි ම භාෂාව බව නිශ්චිත ය.

පාලි හා සංස්කෘත සිංහලයේ මව් බස් බවට පිළිගැනීමක් පවතී. එහෙත් සංස්කෘත යනුවෙන් දැනට සම්මත භාෂාව ද සිංහලයටත් මුල් වූ ආදි ප්‍රාකෘතවල පරිණාමයෙන් සකස් වූ භාෂාවක් ඇසුරින් ගොඩ නංවා ගත්තකි. පාලිය ද බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ස්ථාවර මාධ්‍යයකට නැංවීම සඳහා බුද්ධ කාලයට පසු ව සකස් කර ගත් ආගමික ව්‍යවහාරයක් මිස ව්‍යවහාර භාෂාවක් බවට සාධක හමු නො වේ. මේ භාෂා දෙකින් ලියවුණු සාහිත්‍යය අනුරාධපුර රාජධානි සමයේ අවසාන කාලයෙහි පටන් දිවයිනේ ප්‍රචලිත වීම හේතුවෙන් ඒවායේ වාක් කෝෂයෙන් සිංහල ව්‍යවහාරය පෝෂණය වීම සිදු වුවත් සිංහලයේ සම්භවයට ඒවාහි දායකත්වයක් ඇති බවට සාධක හමු නො වන බව කිව හැකි ය.

පාලි හා සංස්කෘත සිංහලයේ මව් බස් බවට පිළිගැනීමක් පවතී. එහෙත් සංස්කෘත යනුවෙන් දැනට සම්මත භාෂාව ද සිංහලයටත් මුල් වූ ආදි ප්‍රාකෘතවල පරිණාමයෙන් සකස් වූ භාෂාවක් ඇසුරින් ගොඩ නංවා ගත්තකි. පාලිය ද බුදුන් වහන්සේගේ ඉගැන්වීම් ස්ථාවර මාධ්‍යයකට නැංවීම සඳහා බුද්ධ කාලයට පසු ව සකස් කර ගත් ආගමික ව්‍යවහාරයක් මිස ව්‍යවහාර භාෂාවක් බවට සාධක හමු නො වේ.


# පර්යේෂණවාදී නාට්‍ය කලාවක අපේක්ෂාවක්



**සුභා රත්නායක**

"ශ්‍රී ලාංකේය පර්යේෂණාත්මක ටෙලි නාට්‍ය කලාව වියැකී යමින් පවතින සමයක එය පණ ගසා නැගිටින රසයක් 'ලන්තෑරුම' දුටු විට මට හැඟිණි. කිසිදු වාචික දෙබසකට අවස්ථාව නොදී රංගන ශිල්පීන් ශිල්පිනියන්ගේ අභිනයෙන් සහ රූප රාමුවල චමත්කාරයෙන් මවන ආඛ්‍යානය පැසසිය යුතු කරුණකි. "ඇයි" "රුපියල් 250යි" ඒ හැරුණු කොට කිසිදු වචනයක් නැසෙන මෙම නාට්‍ය ක්‍රමයට Non dialog Teledrama හෝ Non speak Teledrama වැනි වර්ගීකරණයන් සුදුසු යැයි මම යෝජනා කරමි. එය සංවාදයකට බඳුන් විය යුතු කරුණකි. (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දර්ශන මාපා පතිරණගේ-කැලණිය විශ්වවිද්‍යාලය)

උක්ත කථනය සඳහා ප්‍රස්තුතය වන්නේ මොහාන්ජී රංගනාත විසින් අධ්‍යක්ෂණය, තිර රචනය, නිෂ්පාදනය සහ කැමරා අධ්‍යක්ෂණය කරන ලද 'ලන්තෑරුම' ඒකාංගී නත්තල් නාට්‍යයයි. එය නාට්‍ය ආශ්චර්යයක් පිළිබඳ ව අදහසක් බවට පත් වන්නේ එහි ඇති විශිෂ්ටත්වය සහ අපූර්වත්වය කැටිවුණු නිර්මාණකරණය පිළිබඳ අවධාරණය කරමින් ජර්මනියේ ප්‍රික්ස් පියුනීස් අන්තර්ජාතික සම්මාන උළෙලේ අවසාන නිර්මාණ 05ට අන්තර්ගතවීමත් සමග ය. මොහාන්ජී රංගනාත මේ සම්මාන උළෙලට සිය ළමා නිර්මාණය ඉදිරිපත් කරන්නේ වයස අවුරුදු 11-15ත් අතර ප්‍රබන්ධ කාණ්ඩ යටතේ ය. රටවල් 07ක් නියෝජනය කරන විනිශ්චය මණ්ඩල සභිකයන් විසින් 'ලන්තෑරුම' අවසාන නිර්මාණ 05 අතරට තෝරා පත්කරගෙන ඇත්තේ නිර්මාණ 400ක් අතුරිනි. මෙහි අවසන් විනිශ්චය මැයි 24-29 දක්වා ජර්මනියේ පැවැත්වෙන අවසන් සම්මාන උළෙලේදී තීරණය වීමට නියමිතයි. 'ලන්තෑරුම' ජයග්‍රහණය කිරීමේ බලාපොරොත්තුව සමගින් 'දෙසතියේ' මේ අවකාශය වෙන්වන්නේ ලන්තෑරුම ඇතුළු විශිෂ්ට නිර්මාණ රැසක් බිහි කරමින් ලාංකේය ටෙලි නාට්‍ය කලාවට වෙනස් මානයක් අත්කර දුන් සුවිශේෂ නිර්මාණකරුවකු පිළිබඳ හෙළිදරව්වකටයි. ඔහු නමින් මොහාන්ජී රංගනාත ය.


මොහාන්ජී රංගනාත

සංඛ්‍යාවෙන් සීමිත වුව ද උසස් රසඥතාවක් සහිත ලාංකික ප්‍රේක්ෂකාගාරය මොහාන්ජී රංගනාත ව හඳුනාගෙන ඇත්තේ ටෙලිනාට්‍ය විශිෂ්ටතාවක් පිළිබඳ අත්දැකීමක් ලබාදෙන නිර්මාණකරුවකු ලෙස. ලන්තෑරුම, පැන් කරත්තය, ටින් පැටව්, හිරු දරුවෝ, අසනිවැසි, යස ඉසුරු, අවනඩුව මේ සියලු නිර්මාණ එයට උදාහරණ ය.

ජර්මනියේ ප්‍රික්ස් ජුනීසස් සම්මාන උළෙලේ අවසන් වටයේදී ඇගයීමට ලක්වන 'ලන්තෑරුම' ප්‍රශස්ත නිර්මාණයක් බවට පත්කරවන කරුණු අතර මුඛයෙන් පිටවන හඬක් ලෙස 'වචන' භාවිත කිරීමේ අවස්ථාව මගහරිමින් හැඟීම් සහ රූපරාමු ඔස්සේ වචන අස්සවන්නට අධ්‍යක්ෂවරයා දරන උත්සාහය ප්‍රධානයි. එය ම පර්යේෂණවාදී නාට්‍ය කලාවක් පිළිබඳ ආශාවාදී බලාපොරොත්තුවක් එක් කරයි. මේ නාට්‍යයෙන් විහිදෙන හැඟුම්වල ප්‍රබලත්වය දුර්ලභයි. නාට්‍යයෙහි ඇති නාට්‍ය විසින් ම ඉල්ලා සිටින නිශ්ශබ්දතාව ඊට විශාල පිටුවහලකි. ඒ නිසා 'ලන්තෑරුම' ටෙලි නාට්‍ය ආශ්චර්ය ගැන ඉඟියකි. එහෙත් පුදුමය නම් ශ්‍රී ලංකාවේ සුමති සම්මාන උළෙලේ නිර්දේශයක් අතරටවත් ලන්තෑරුම කැඳවා නොගැනීමයි.

මොහන්ජී නිර්මාණකරුවකු ලෙස අමුතු රහක් හඳුනන, සොයන මිනිසෙක් කීම නිවැරදියි. සෝෂාකාරී ධාවන වේගයකින් නිර්මාණය බිහිකිරීමේ කලබගැනියක් ඔහුට නොමැත. විශාල ප්‍රතිරූප සාදා ගනිමින් වාණිජ වටිනාකමක ඉත්තකු වීමේ රෝගයකින් ද ඔහු නොපෙළේ. ඒ නිසා ඔහුගේ නිර්මාණ බිහිවන කාල පරාසය දීර්ඝයි. එහෙත් සුවිශේෂ ප්‍රේක්ෂක පිරිසක් විසින් 'අසිරිමත් අත්දැකීමක්' ලෙස ඒවා තම මතකයේ ගබඩා කරගැනීම මොහන්ජී රංගනාත ලබන ජයකි. ඔහුගේ නිර්මාණ පර්යේෂණ සහ විචාර ක්ෂේත්‍රය නැවත අවදි කරවීමට ද හැකි මෙවලමකි. 'අසනිවැසි' එයට කදිම නිදසුනකි. දශක දෙකක දීර්ඝ කාලයක් 'අසනිවැසි' පිළිබඳ ප්‍රේක්ෂක සිත්වල මතකය ප්‍රබලයි. ප්‍රේක්ෂකයාට 'අසනිවැසි' නිර්මාණකරුවා සමීප නොවිය හැකියි. එහෙත් නිර්මාණය සමීපයි. විය යුත්තේ ද එයයි. ප්‍රතිරූපය පස්සේ හඹා නොයන නිර්මාණවේදියකු ලෙසට මොහාන්ජී ව හඳුනා ගැනීමට එය කදිම උදාහරණයකි. 2003 වසරේ සුමති සම්මාන උළෙලේ හොඳම අධ්‍යක්ෂණය ඇතුළු සම්මාන 13කට නිර්දේශ වන 'අසනිවැසි' සඳහා සම්මාන අහිමිවන්නේ එයට එහායින් තරගය සඳහා සිට ගන්නේ ප්‍රසන්න ජයකොඩි නිර්මාණය කරන 'සඳ අමාවකයි' නාට්‍යය හේතුවෙනි. මොහන්ජී පවසන්නේ එය ම තමන්ට සම්මානයක් බවයි. එම වසරේ ම සිග්නීස් සම්මාන උළෙලේ හොඳම අධ්‍යක්ෂණය ඇතුළු සම්මාන 11ක්

අසනිවැසි දිනා ගැනීමට සමත් ය. ඔහුගේ ඒකාංගී ළමා නාට්‍ය දෙකක් වන 'පැන් කරත්තය' සහ 'ටින් පැටව්' දෙස් විදෙස් සම්මාන කිහිපයකින් පැසසුමට ලක්වන අතර තායිලන්තයේ ඉන්පුට් රූපවාහිනී සමුළුවේ විශේෂ ඇගයීමත් ආසියා පැසිෆික් විකාශන සංගමයේ විශේෂ ජූරි සම්මානයත් 'පැන් කරත්තය' හිමිකර ගත්තේ ය. ප්‍රික්ස් ජියුනීස් අන්තර්ජාතික නාට්‍ය සම්මාන උළෙලේ අවසන් වටය තෝරා ගැනීම සහ තායිලන්තයේ පැවැත්වුණු අන්තර්ජාතික නාට්‍ය සම්මාන උළෙලේ විශේෂ සම්මානයක් 'ටින් පැටව්' දිනා ගැනීම විශේෂ අවස්ථාවකි. එහි ප්‍රධාන නිළි භූමිකාව රඟන එවකට අවුරුදු 07ක අසඳි දෙව්තිලිණි හොඳම නිළි සම්මානය දිනාගන්නේ ඒ සඳහා තරග වැදුණු වැඩිහිටි නිළියන් 06 දෙනකු අතරින් වීමත් සුවිශේෂ සනිටුහනකි. ඇය මොහාන්ජී රංගනාතගේ දියණිය වීම ද දෛවෝපගත සිදුවීමකි. 2014 වර්ෂයේදී හොඳම ඒකාංගී නාට්‍යය ලෙස සුමති සම්මාන උළෙලේදී ද 'ටින් පැටව්' ඇගයීමට පාත්‍ර විය. මොහාන්ජී රංගනාතගේ පළමු ස්වතන්ත්‍ර අධ්‍යක්ෂණය වන 'අවනඩුව' 2002 වර්ෂයේදී හොඳම අධ්‍යක්ෂණයට හිමි රන් සමානය දිනාගන්නා අතර ජපානයේ ආසියානු රූපවාහිනී සම්මාන උළෙලේ ජූරියේ විශේෂ සම්මානයකට පාත්‍රවීම ද සුවිශේෂයි. ඔහු විසින් අධ්‍යක්ෂණය කරන ලද 'විශ්වන්තරා' නාට්‍යය රයිගම් සම්මාන උළෙල 2007 ජූරියේ විශේෂ සම්මානයකින් ඇගයිණි.

සම්මානිත නිර්මාණ රැසක් බිහි කරන මොහාන්ජීගේ නාට්‍ය කලාවේ විශේෂත්වය වන්නේ ජන සමාජයේ එක් එක් කොටත් සියුම් නිරීක්ෂණයට ලක් කිරීමයි. ඒ සියල්ලට ම වඩා ඔහුගේ නිර්මාණ දරාගන්නා රිද්මයට ප්‍රේක්ෂක සිත ඇදී යයි. කලා නිර්මාණයක් යනු කාලය අල්ලා ගැනීමකි. ඔහුගේ නිර්මාණ, කාලය පිළිබඳ මතක සමුදායකට කදිම නිදසුනකි. විෂය ක්ෂේත්‍රය පිළිබඳ මොහාන්ජී සතු සාරවත් ඥානය බරපතළ අත්දැකීම් ඔහුගේ නිර්මාණ සාමාන්‍ය නිර්මාණවලින් වෙන් කර ඉහළ මානයකට පෙළගැස්වීමට ආධාරකයකි. ඔහුගේ ළමා නිර්මාණවල ඇති විශිෂ්ටතම ගුණය ලෙස හුදු සුරංගනා ලෝකය සංසිද්ධියක් නොකිරීම සහ ළමා ලෝකයේ මානයන් අතික්‍රමණය නොකිරීම හඳුනාගත හැකියි. එම නිසා ඔහුගේ නිර්මාණ අගය කිරීමේ සීමාව ඉක්මවා විඳගැනීමේ මායිමක් වෙත ප්‍රවේශ වේ. ප්‍රේක්ෂකයා සමග අඛණ්ඩ සහකම්පනයක් චරිතවලට ඇති කරලීම සඳහා ශිල්පීන්ගේ රංගනය හැසිරවීමට අධ්‍යක්ෂකවරයකු ලෙස මොහාන්ජී දක්වන සමත්කම ප්‍රශංසනීයයි. ඔහුගේ සෑම නිර්මාණයක් ම නාට්‍ය පිළිබඳ ඉතා ගැඹුරින් විනිශ්චය කරන නිර්මාණකරුවකු තම මාධ්‍ය ඒ සඳහා ඉතා සුන්දර ලෙස භාවිත කරන අවස්ථාවක් ලෙස හඳුනාගත හැකි ය. ශ්‍රී ලාංකික නාට්‍ය කෂේත්‍රයේ නැවත නැවත එබී බැලිය යුතු ස්ථානයක් ලෙස ඔහුගේ නිර්මාණ මගහැර යා නොහැක්කේ එම නිසා ය. ප්‍රේක්ෂකයාට අතිශය සමීප තේමා සමාජය සහ මිනිස් ජීවිතය කියවනු පිණිස මොහාන්ජී අත්හදා බලන්නේ අපූරු පිළිවෙතකිනි.

ඔහුගේ ප්‍රතිභාව උපදින්නේ උපන්ගෙයි දායාදයක් ලෙසිනි. ඔහුගේ මාපියන් කලා භූෂණ, කලාශූරී සම්මානවලින් පිදුම්ලත් පාරම්පරික නර්තන ශාස්ත්‍රයේ ප්‍රවීණයන් දෙපළකි. ඔවුන් නමින් කලාශූරී රංගනාත සහ කමලනයනා රංගනාත ය. වරකාපොල තුඹලියද්ද ග්‍රාමයේ තුඹලියද්ද ශිල්පාêපති මොහාන්ජීගේ පිය පාර්ශ්වයේ සීයා ය. ඔහුගෙන් ලැබුණු පරම්පරා දායාදයක් වන නර්තන කලාව ශාස්ත්‍රීය මට්ටම තෙක් වර්ධනය කරන්නේ කලාශූරී රංගනාත ය. එදිරිවීර සරච්චන්ද්‍ර, අමරදේව, පණිභාරත, වජිරා, චිත්‍රසේන වැනි කලා දැවැන්තයන් මොහාන්ජීට සමීප චරිත බවට පත්වන්නේ ඔවුන් හා පියාගේ ඇසුර හේතුවෙනි. මේ සංකේත ලෝකය ම ඔහු තුළ කලා බීජ වැපුරුවත් මොහාන්ජී පවසන ලෙසට ශාස්ත්‍රීය ව මෙන් ම දෘෂ්ටිමය ඥානකින් ඔහු ව පෝෂණය කරන්නේ රූපවාහිනිය සහ සමාජයයි.

මොහාන්ජී රූපවාහිනියට සම්බන්ධ වන්නේ නාට්‍ය අංශයේ නිෂ්පාදන සහකාර පුහුණුව යන තනතුරත් සමගිනි. සුදත් සේනාරත්න, දයාරත්න රට ගෙදර, විමලරත්න අධිකාරී, තිලක් ගුණවර්ධන ප්‍රවීණයන්ගේ ඇසුර ඔහු ව පරිවර්තනය කරන්නේ වෘත්තීමය ශිල්පියෙක් ලෙසට ය. චරිත තුනක්, සිව් මංසල වැනි විශිෂ්ට කලා කෘතිවලට ඔහු දායක වන්නේ සහය අධ්‍යක්ෂවරයෙක් ලෙසයි. ඒ අත්දැකීම ප්‍රශස්ත ස්වාධීන නිර්මාණවේදයකට ඔහුට පාර කියයි.

අද සමාජය ස්ථානගත වී ඇති විපරීත කලබගෑනිය තුළ ප්‍රශස්ත නාට්‍ය කලාවක් ගැන කතා කිරීම පවා නිශ්ඵල දෙයක් වී ඇත. එයට ඉන්දියානු ව්‍යාප්තවාදය ඔස්සේ ප්‍රචාරණය වන අඳබාල කෘති, තිර රචකයන්ගේ විෂය හා සමාජය පිළිබඳ අල්ප පරිචය, ලාභය පදනම් කරගත් නාට්‍ය නිෂ්පාදන සහ විකාශනය කිරීමේ අරමුණ සෘජු ව ම බලපෑ ඇති බව මොහාන්ජීගේ අදහසයි. එය සමාජ ප්‍රකාශනයේ ම කොටසකි. මෙය විවෘත ආර්ථිකය ඉදිරියේ රටට අත්පත් වන අනිවාර්යක් බව ඔහුගේ පිළිගැනීමයි. මේ දැවැන්ත පරිහානිය වළක්වා ගැනීමට මේ ක්ෂේත්‍රය ඥාන පෞරුෂයකින් හෙබි කලාකරුවන් අතට පත්විය යුතුයි. මෙරට සකස් වී ඇති නාට්‍ය පාඨමාලාවල අන්තර්ගතය හුදු සෞන්දර්ය හා විචාරයෙන් ඔබ්බට ගොස් ශාස්ත්‍රීය ධර්ම න්‍යායන්ගෙන් පූර්ණ විය යුතු ය. අප කතා නායකයාගේ සංදේශ එයයි.

තමාට හැකි උපරිමයෙන් තම ශාස්ත්‍ර ඥානය, සමාජ සහ ජීවන අත්දැකීම්, වෘත්තීය ඥානය මතු පරම්පරාවට තිළිණ කිරීමේ ක්‍රමවේදයක නියැළීම මොහාන්ජීගේ ලාලසාවකි. රංගනාත් පර්යේෂණාගාරයක්, නාට්‍ය පාසලක්, මාධ්‍ය ඒකකයක් ගොඩනගමින් එම කර්තව්‍යයට මුල පුරන්නට ඔහු සූදානමින් සිටියි. මෙලෙස සමකාලීන නාට්‍ය ක්ෂේත්‍රයට දාර්ශනික වටිනාකමක් ලබාදෙන මේ අපූරු නිර්මාණවේදියා දැවැන්ත ප්‍රතිරූප හඹා යනවා වෙනුවට තම කර්තව්‍යය ඉටුකිරීම සම්බන්ධයෙන් විශ්වාසය තබන, කලාවේ රස නිදහසේ විඳින අමුතු මිනිසකු බව දෙසතියට කළ මේ සංවාදය අතරේ මට හැඟී ගියේ ය.



'ලන්තෑරුම' රූප රාමුවක්




සුමති සම්මානය
'ටින් පැටව්'




'අසනි වැසි' පටිගත කිරීම් අතරතුර

# මාක්ස්වාදයේ දාර්ශනික පදනම ඔස්සේ අනාගතයට මංපෙත්


චමිල් ජයනෙත්ති

**තිඹිරියාගම බණ්ඩාර**

"ඇරිස්ටෝටල් පැරණි භෞතිකවාදීන්ට නින්දා කළේ ස්වර්ගයට ඇට්ලස්ගේ (Atlas) සහය අවශ්‍ය බවට ඔහුගේ විශ්වාසය තහවුරු කිරීම සඳහා ය. ඇට්ලස් නමැති යෝධයා අවකාශයේ සිටගෙන, පොළොව තම උරහිසෙන් ඔසවාගෙන ස්වර්ගයට ආධාර කරන නිසා ය.' (A caracter in Greek mythology). අනෙක් අතට මිනිසාට ස්වර්ගය අවශ්‍ය යැයි විශ්වාස කරන අයට එපිකියුරස් දොස් පවරයි. මිනිස් මෝඩකම සහ මිථ්‍යා විශ්වාස තුළ ස්වර්ගයට අනුබල දෙන ඇට්ලස්ගේ මෝඩකම සහ මිථ්‍යා විශ්වාස තුළ ස්වර්ගයට අනුබල දෙන ඇට්ලස්ගේ මෝඩකම සහ මිථ්‍යා විශ්වාස ද ටයිටන්වරුන්ට (Titans) සමාන ය.




(කාල් මාක්ස් ආචාර්ය උපාධි නිබන්ධනය, 76 පිටුව, පරිවර්තක, චමිල් ජයනෙත්ති)

ඉහත උපුටනය ඇතුළත් කාල්මාක්ස්ගේ ආචාර්ය උපාධි නිබන්ධනය ජර්මනියේ යෝනා සරසවියට ඉදිරිපත් කර ඇත්තේ 1841දී ය. එවිට ඔහුගේ වයස අවු.23කි. දාර්ශනික මතවාද දෙකක් සංසන්දනය කරමින් නව දැනුමක් උත්පාදනය කරන මේ පර්යේෂණ කෘතිය චමිල් ජයනෙත්ති විසින් සිංහලට පරිවර්තන කිරීම විශේෂ සිදුවීමකි. ලංකාවේ වාමාංශික පක්ෂවලට දිගු ඉතිහාසයක් ඇතත් මෙවැනි අතිශය වැදගත් වගකීමක් ඔවුන්ගෙන් ඉටු නොවීම විමතියට කරුණකි.

මාක්ස්වාදය බිහිවූයේ දාර්ශනික පදනමකිනි. මාක්ස් තම නිබන්ධනයෙහිදී ඩිමොක්‍රිටස්ගේ සහ එපිකියුරස්ගේ දාර්ශනික මතවාද සංසන්දනය කරන්නේ විඥානවාදය වෙනුවට භෞතිකවාදය ඔසවා තැබීමේ මගක් හැටියට ය.

මේ නිබන්ධනය පිළිබඳ ව කතුවරයා මෙසේ සඳහන් කරයි.

"මාක්ස් එක අතකින් ලෝකය විනිවිද යන පරමාත්මයෙහි ඓතිහාසිකත්වය පිළිබඳ ව හේගල්ගේ මූලධර්මයත් අනෙක් අතින් ශුන්‍යත්වයේ පරමාණුවල සංචලනය පිළිබඳ එපිකියුරස්ගේ මූලධර්මයත් සංශ්ලේෂණය කරමින්, මාක්ස් ලෝකය එහි සියලු ම ව්‍යුහාත්මක මට්ටම විනිවිද යා හැකි සාකල්‍ය ඓතිහාසිකත්වය පිළිබඳ සංකල්පය නිර්මාණය කරයි. මෙම ප්‍රතිභාන කරුණ මාක්ස්ගේ සිතට කොතරම් තදින් කාවැදුණේ ද යත් ඔහු එපිකියුරස් ව උපරිම උද්‍යෝගයකින් ඇගයීමට ලක් කර තිබේ."

යම් බුද්ධිමය සම්ප්‍රදායනයක් විශ්ලේෂණයට ලක් කරන තැනැත්තා සතු ව තිබිය යුතු විශේෂ ගුණයක් විය යුත්තේ එම බුද්ධිමය සම්ප්‍රදායනයෙහි සාරය උකහා ගැනීමේ හෙවත් සංශ්ලේෂණය කිරීමේ හැකියාවයි. විශ්ලේෂණය කළ හැකි වන්නේ සංශ්ලේෂණය කළ දෑ ය. එසේ නොවූ විට එය අර්ථශුන්‍ය ව්‍යායාමයක් බවට පත් වෙයි. එබඳු සංශ්ලේෂණ ගුණයකින් තොර, දාර්ශනික පදනම නොතකන වාමාංශිකයන් පොතේ පණ්ඩිතයන් වීම හා මාක්ස්වාදය අවභාවිතයට ගැනීම මේ අනුව වටහාගත හැකි ය.

> ලෝකයේ ප්‍රතිවිරෝධතා සුලබ ය. විවිධාකාර ය. දෛනික ජීවිතයෙහිදී පීඩිතයෝ අරගලයෙන් විරෝධය ප්‍රකාශ කරති. මාක්ස්වාදයේ පොදු නියමය වන්නේ අභ්‍යන්තර හා බාහිර ප්‍රතිවිරෝධතා විද්‍යාත්මක ව පැහැදිලි කරදීමයි. අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා ඕනෑ ම භෞතික සමාජ ප්‍රපංචයක වර්ධනයට තීරණාත්මක වැදගත්කමක් දරයි. මක්නිසාද යත් සමාජයක අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා වූ කලී සූරා කන්නන් හා සූරාකනු ලබන්නන් අතර ප්‍රතිවිරෝධතා ය.

වාම ක්‍රියාධරයකු හැටියට චමිල් ජයනෙත්ති මාක්ස්ගේ ආචාර්ය උපාධි නිබන්ධය පරිවර්තනය කරන අතරතුර තවත් සුවිශේෂ වගකීමක් ඉටු කරයි.

'කාලය, අවකාශය තුළ මාක්ස්වාදය' එම වගකීම අනුව බිහිවූ ස්වතන්ත්‍ර කෘතියකි. කොරෝනා සමයෙහි චමිල් දාර්ශනික හැදෑරීමක් සඳහා සෑහෙන කාලයක් ගත කර ඇත. එමෙන් ම ගෝලීය මට්ටමින් මනුෂ්‍ය වර්ගයා මුහුණ දෙන අර්බුද පැතිමාන කිහිපයකින් සාකච්ඡාවට ගැනීම ඔහුගේ ස්වභාවයයි.


ඔහු මේ කෘතියෙහිදී ප්‍රාග් ඓතිහාසික චින්තනය, වහල් සමාජයේ දර්ශනවාදය, වැඩවසම් සමාජයේ දර්ශනවාදය, ධනවාදී සමාජයේ දර්ශනවාදය, ආපෝහකවාදය හා ඓතිහාසික භෞතිකවාදය, ජාත්‍යන්තර මාක්ස්වාදී ව්‍යාපාරය, මාක්ස්, එංගල්ස්ගෙන් පසු භෞතිකවාදය යනාදී මාතෘකා ඔස්සේ කාලීන වශයෙන් වැදගත් වන කරුණු රැසක් සාකච්ඡාවට ගනී.

සමාජ ප්‍රගමන මාතෘකාව යටතේ කතුවරයා ගෙන හැර දක්වන අදහසක් උපුටා දක්වමි.

"ලෝකයේ ප්‍රතිවිරෝධතා සුලබ ය. විවිධාකාර ය. දෛනික ජීවිතයෙහිදී පීඩිතයෝ අරගලයෙන් විරෝධය ප්‍රකාශ කරති. මාක්ස්වාදයේ පොදු නියමය වන්නේ අභ්‍යන්තර හා බාහිර ප්‍රතිවිරෝධතා විද්‍යාත්මක ව පැහැදිලි කරදීමයි. අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා ඕනෑ ම භෞතික සමාජ ප්‍රපංචයක වර්ධනයට තීරණාත්මක වැදගත්කමක් දරයි. මක්නිසාද යත් සමාජයක අභ්‍යන්තර ප්‍රතිවිරෝධතා වූ කලී සූරා කන්නන් හා සූරාකනු ලබන්නන් අතර ප්‍රතිවිරෝධතා ය. මේ අනුව ධනවාදයට මූලික ප්‍රතිවිරෝධය වූ කලී නිෂ්පාදනය පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමයි. එවිට නිෂ්පාදන බලවේග හිමි නොවන නිර්ධනීහූ මූලික ප්‍රතිවිරෝධී බලවේගය වෙති. ධනවාදයේ මූලික ප්‍රතිවිරෝධතා නිර්ධනීන් හා ධනේශ්වරය අතර, මුළු මහත් පීඩිතයන් හා ඒකාධිපතියන් අතර මෙන් ම නිෂ්පාදන හා පරිභෝජනය අතර යනාදී ප්‍රතිවිරෝධතා ගොනු වෙයි. (164 පිටුව) මෙය මිනිස්වග මුහුණදෙන පොදු සත්තාවකි. එයට බටහිර, පෙරදිග භූමි සීමාවක් නොමැත.

මේ කෘතියෙහි අවසන් පරිච්ඡේදය වන වත්මන් ගෝලීය අර්බුදය මාතෘකාව යටතේ ඔහු තියුණු නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කරයි. විශේෂයෙන් ම ගෝලීය සොබා දහමේ අර්බුදය ගැන කෙරෙන විග්‍රහය කුණුබක්කියට තල්ලුවෙමින් සිටින ඇතැම් වමේ පාර්ශ්වවලට නොවැටහෙන්නක් ද විය හැකි ය. පන්ති සටන් පිළිබඳ ගිරවුන් මෙන් පාඩම් කරගත් වගන්ති හැර පුළුල් සමාජ දැක්මක් ඔවුන්ට නොතිබූ නිසා ම මෙරට බුද්ධිමය කාන්තාරයක් බිහි විය. වමේ ව්‍යාපාරය ජාතිවාදීන් හා විඥානවාදීන් සමග අවස්ථාවාදී සම්මුතීන් ඇති කරගැනීමෙහි එක් ප්‍රතිපලයක් වූයේ ශාස්ත්‍ර බුද්ධි පරිහානියයි.

එහෙයින් චමිල් ජයනෙත්තිගේ මේ මැදිහත්වීම යුරෝපා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ව සිටි ඔලිවර් ගෝල්ඩ්ස්මිත් ලියූ උගුල (The Trap) කෘතිය මෙන් ම වැදගත් ය. ස්මිත් මීට දශක තුනකට පෙර ගෝලීය අර්බුද ගැන අනතුරු ඇඟවී ය. මේ නිසා චමිල් ජයනෙත්තිගේ මෙම උත්සාහයෙහි ඓතිහාසික වැදගත්කමක් පවතී. එහෙයින් මේ කෘති දෙක ම පාඨක, විචාරක සම්භාෂණයට පාත්‍ර විය යුතු ය.



# යොවුන් ක්‍රිකට් කිරුළ කැන්ගරුවන්ට

අනිල් වීරසිංහ

ශ්‍රී ලංකාවේ පැවැත්වීමට සැලසුම් කර තිබුණත් පසුව දකුණු අප්‍රිකාවේ පැවත් වූ වයස අවුරුදු 19න් පහළ 2023-24 යොවුන් ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ ශුරතාව ජයගැනීමට හග් වෙයිබ්ජන්ගේ නායකත්වයෙන් යුතු ඕස්ට්‍රේලියාව සමත් වුණා. ඒ, පෙබරවාරි 11 දින පැවති අවසන් තරගයෙන් ඉන්දියාව පරදවමිනි. ඕස්ට්‍රේලියාව මෙම තරගය ජයගත් සිව් වැනි අවස්ථාව වන අතර මෙවර ඔවුන් එය ජය ගත්තේ 2009-10 තරගාවලියෙන් පසුව වීමත් විශේෂත්වයකි.

ජගත් ක්‍රිකට් සමුළුව විසින් මුලින් ම යොවුන් ලෝක කුසලාන තරගාවලියක් නැතහොත් වයස 19න් පහළ ලෝක කුසලාන තරගාවලියක් සංවිධානය කරනු ලබන්නේ 1997-98 ක්‍රිකට් තරග වාරයේ සිට වුවත් මේ සඳහා පදනම වැටෙන්නේ 1987-88 ක්‍රිකට් තරග වාරයේ ය. එවර මෙය ඕස්ට්‍රේලියා ක්‍රිකට් පාලක මණ්ඩලය සංවිධානය කර තිබුණේ 1788 මුලින් ම බ්‍රිතාන්‍ය ජාතික කැප්ටන් ආතර් පිලිප් ඇතුළු නාවික හමුදාව ඕස්ට්‍රේලියාවට ගොඩ බැස ඕස්ට්‍රේලියාව සොයාගෙන වසර 200ක් සම්පූර්ණ වීම හේතුවෙනි. මේ සඳහා සුප්‍රකට මැක්ඩොනල්ඩ්ස් ආයතනය අනුග්‍රහය දැක්වූ අතර ඒ වන විට ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාවේ නිරත ව සිටි ඕස්ට්‍රේලියාව, එංගලන්තය, කොදෙව් දූපත්, නවසීලන්තය, ඉන්දියාව, පාකිස්තානය, ශ්‍රී ලංකාව යන රටවල් 07ට අමතර ව ජගත් ක්‍රිකට් සමුළුවේ පූර්ණ සාමාජිකත්වය නොලද රටවල ක්‍රීඩකයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කණ්ඩායමක් ද එදා මෙම තරගාවලිය නියෝජනය කළේ ය. එම තරගාවලියේ ශූරතාව ජෙෆ් පාකර්ගේ නායකත්වයෙන් සත්කාරක ඕස්ට්‍රේලියාව අත්කර ගත්තේ අවසන් තරගයේදී පාකිස්තානය පරාජය කරමිනි.

එදා මෙම තරගාවලිය නියෝජනය කළ යොවුන් ක්‍රීඩකයන් රැසක් ම පසුකලෙක ජගත් ක්‍රිකට් පිටියේ වීරයන් බවට පත්වීම මෙහිදී අමතක නොකළ යුතුයි.

මේ අතරින් ඕස්ට්‍රේලියාවේ ස්ටුවට් ලෝ, එංගලන්ත කණ්ඩායම මෙහෙයවූ මයිකල් ඇතර්ටන්, නසාර් හුසේන්, මාක් රාම්ප්‍රකාෂ්, ඉන්දියාවේ වෙන්කතිපති රාජු, ප්‍රවීන් අම්රේ, නයින් මොන්ගියා, ශ්‍රී ලංකාවේ සනත් ජයසූරිය, රොමේෂ් කළුවිතාරණ, චන්දික හතුරුසිංහ, සංජීව රණතුංග, කොදෙව් දූපත් පිල එදා මෙහෙය වූ බ්‍රයන් ලාරා, එම කණ්ඩායමේ ම ජිමී ඇඩම්ස්, නවසීලන්තයේ ක්‍රිස් කෙයාන්ස්, පාකිස්තානයේ ඉන්සමාමුල් හක්, අකිබ් ජාවෙඩ්, මුෂ්තාක් අහමඩ් වඩාත් විශේෂ වේ.

ඒ වන විටත් ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කර තිබූ සංජීව වීරසිංහත් මෙම තරගාවලිය



සඳහා එදා ශ්‍රී ලංකා යොවුන් පිල නියෝජනය කිරීම ශ්‍රී ලංකාවට සුවිශේෂ කරුණකි. ඊට පෙර ඔහු 1985 වසරේ ඉන්දියාවට එරෙහි ව වූ ශ්‍රී ලංකාවේ ප්‍රථම ඓතිහාසික ජයග්‍රාහී ටෙස්ට් තරගය වයස අවුරුදු 17දී කොළඹ ඉසිපතන විදුහල් පාසල් ක්‍රීඩකයකු ව වශයෙන් සිට නියෝජනය කළේ ය. 1987-88 තරගාවලියේ වේග පන්දු යවන්නකු ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කළ ජොහාන් සමරසේකර පසු කලෙක එක්සත් අරාබි එමීර් කණ්ඩායම නියෝජනය කිරීමත් විශේෂ කරුණකි. අවසන් වටයට පිවිසෙන්නට අසමත් වුණත් එදා රොහාන් වීරක්කොඩිගේ නායකත්වයෙන් තරග වැදුණු ශ්‍රී ලංකා කණ්ඩායම තරග 07කට සහභාගි වී ඉන් තරග 03ක් ජය ගත්තේ එංගලන්තය, ඉන්දියාව මෙන් ම ජගත් ක්‍රිකට් සමුළුවේ පූර්ණ සාමාජිකත්වය නොලද රටවල කණ්ඩායමත් පරාජය කරමිනි.

මෙම තරගාවලියෙන් පසු නැවත වරක් මෙවැනි තරගාවලියක් වසර 10ක් පමණ ගතවනතුරු දැකගත නොහැකි විය. අවසානයේදී ජගත් ක්‍රිකට් සමුළුව තීරණය කළේ වයස අවුරුදු 19න් පහළ ලෝක කුසලාන තරගාවලියක් තම සංවිධායකත්වය යටතේ වසර 02කට වරක් පැවැත්වීමට ය. මේ අනුව 1997-98 තරගවාරයේ මෙය දකුණු අප්‍රිකාවේ පැවැත්වෙන්නේ රටවල් 16ක සහභාගිත්වයෙනි. එවර සහභාගි වූ රටවල් අතරට ඒ වනවිට ටෙස්ට් තත්ත්වයේ සිටි ඕස්ට්‍රේලියාව, එංගලන්තය, කොදෙව් දූපත්, නවසීලන්තය, සිම්බාබ්වේ, ඉන්දියාව, පාකිස්තානය, ශ්‍රී ලංකාව, දකුණු අප්‍රිකාව යන රටවල් මෙන් ම බංග්ලාදේශය, කෙන්යාව, ස්කොට්ලන්තය, පැපුවා නිව්ගිනි, අයර්ලන්තය, ඩෙන්මාර්කය, නැමීබියාව වැනි ටෙස්ට් තත්ත්වය නොතිබූ රටවල් ද විය. මෙම තරගාවලියේ ශූරතාව එංගලන්තයට අත්වුණේ අවසන් තරගයේදී නවසීලන්තය පරදවමිනි. එතැන් සිට තරගමාලා ඉතිහාසයේ මෙම තරගාවලිය පැවැත්වෙන්නේ කණ්ඩායම් 16ක සහභාගිත්වයෙන් වන අතර 2023-24 තරගාවලිය මෙවර පැවැත්වුණේ 15 වැනි වරට ය. 2000 වසරට පෙර ටෙස්ට් පිටියේ සිටි අනෙකුත් සියලු ම රටවල් මේ දක්වා මෙහි ශූරතාව ජයගැනීමට සමත් ව ඇතත් ශ්‍රී ලංකාව, නවසීලන්තය හා සිම්බාබ්වේ යන රටවලට තවමත් එක ම අවස්ථාවක හෝ මේ තරගාවලිය ජයගැනීමට අවස්ථාව නොලැබීම විශේෂ කරුණකි. මෙහි තවත් වැදගත් සිදුවීමක් වන්නේ 2000 වසරේ ටෙස්ට් වරම් අත්කර ගත් බංග්ලාදේශය පවා මෙහි ශූරතාව අත්කරගෙන තිබීම ය. මේ අතරින් ශ්‍රී ලංකාව හා නවසීලන්තය මෙහි අවසන් තරගවලට පිවිස ඇතත් එම අවස්ථාවල ශූරතාව ජයගැනීමට සමත් නොවී ය.

එදා මෙදාතුර මෙම තරගාවලිය නියෝජනය කළ ක්‍රීඩකයන් අතරින් ඉන්දියාවේ ශිකර් ධවාන්, පාකිස්තානයේ බාබර් අසාම්, සිම්බාබ්වේහි ටටෙන්ඩර් තයිබු, නවසීලන්තයේ ටිම් සවුති, දකුණු අප්‍රිකාවේ එයිඩ්‍රියන් මාක්‍රම්, ග්‍රැහැම් ස්මිත්, ඕස්ට්‍රේලියාවේ කැමරන් වයිට් වැනි ක්‍රීඩකයන් පසු කලෙක තම රටේ කණ්ඩායම් ජාත්‍යන්තර ක්‍රිකට් පිටියේ මෙහෙයවීමට පවා අවස්ථාව ලබාගෙන තිබීමත් කැපී පෙනෙන කරුණකි.

2023-24 තරගාවලියේ ජයග්‍රහණයත් සමගින් ඕස්ට්‍රේලියාව තරගමාලා 04ක ද ඉන්දියාව තරගමාලා 05ක ද පාකිස්තානය තරගමාලා 02ක ද එංගලන්තය, දකුණු අප්‍රිකාව, කොදෙව් දූපත් හා බංග්ලාදේශය එක් අවස්ථාව බැගින් ද මෙහි ශූරතාව දිනා ගැනීමට සමත් ව ඇත.

මෙවර තරගාවලියේ වීරයා මෙන් ම වැඩි ම කඩුලු දවාගත් ක්‍රීඩකයා ලෙස දකුණු අප්‍රිකාවේ ක්වෙනා මපාකා කැපී පෙනුණේ තරගාවලියේ කඩුලු 21ක් දවා ගනිමිනි. ඉන්දීය පිලේ උදය සහරාන් සමස්ත ලකුණු 397ක් ලබා ගනිමින් මෙවර තරගාවලියේ වැඩිම ලකුණු ලබාගත් පිතිකරුවා බවට පත් විය. ඉන්දියාවේ උපත ලබා නවසීලන්තය නියෝජනය කරන එස්.ඩී.ඩේවි රෙඩ්ඩි නේපාලයට එරෙහි ව ලකුණු 147ක් නොදැවී ලබා ගැනීම මෙවර තරගාවලියේ පිතිකරුවකු ලැබූ වැඩි ම ලකුණු සංඛ්‍යාව වන අතර එංගලන්තයේ ටසිම් චවුද්රි අලි සිම්බාබ්වේ පිලට එරෙහි ව 29 / 07 ලෙස සටහන් කළ පන්දු යැවීම මෙවර තරගයක දැක ගැනීමට ලැබුණු හොඳම පන්දු යැවීම ලෙසත් සටහන් විය.

ජයග්‍රාහී ඕස්ට්‍රේලියා කණ්ඩායම මෙවර තරග 07කට සහභාගි වී ඉන් තරග 06ක් ජයගැනීමට සමත් වූ අතර එක තරගයක් අවසන් වුණේ තීරණයක් නොමැති ව ය. ඉන්දියාව ද තමන් සහභාගි වූ තරග 6/7ක් ම ජයගැනීමට සමත් වුණත් අවසන් තරගයේ පරාජය ඔවුන් මෙවර ලැබූ එක ම පරාජය බවට පත් විය.



| වර්ෂය | සත්කාරකත්වය | ශූරතාව |
|---|---|---|
| 1987-88 | ඕස්ට්‍රේලියාව | ඕස්ට්‍රේලියාව |
| 1997-98 | දකුණු අප්‍රිකාව | එංගලන්තය |
| 1999-2000 | ශ්‍රී ලංකාව | ඉන්දියාව |
| 2001-02 | නවසීලන්තය | ඕස්ට්‍රේලියාව |
| 2003-04 | බංග්ලාදේශය | පාකිස්තානය |
| 2005-06 | ශ්‍රී ලංකාව | පාකිස්තානය |
| 2007-08 | මැලේසියාව | ඉන්දියාව |
| 2009-10 | නවසීලන්තය | ඕස්ට්‍රේලියාව |
| 2012 | ඕස්ට්‍රේලියාව | ඉන්දියාව |
| 2013-14 | එක්සත් අරාබි එමීරය | දකුණු අප්‍රිකාව |
| 2015-16 | බංග්ලාදේශය | බටහිර ඉන්දිය කොදෙව් |
| 2017-18 | නවසීලන්තය | ඉන්දියාව |
| 2019-20 | දකුණු අප්‍රිකාව | බංග්ලාදේශය |
| 2021-22 | බටහිර ඉන්දිය කොදෙව් | ඉන්දියාව |
| 2023-24 | දකුණු අප්‍රිකාව | ඕස්ට්‍රේලියාව |

# රැකෙන්නට රකින නව තෙත් බිම්

නිශාන්ත පීරිස්

ශ්‍රී ලංකාවේ ජෛව කලාප වශයෙන් නව තෙත් බිම් 03ක් රැම්සාර් සම්මුතිය යටතේ ප්‍රකාශයට පත් කිරීමට නියමිත ය. 2024 පෙබරවාරි මස 02 දිනට යෙදුණු 'ලෝක තෙත් බිම් දින' සැමරුමේදී මේ බව ප්‍රකාශ විය. මන්නාරම දිස්ත්‍රික්කයට අයත් වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතය, එම දිස්ත්‍රික්කයට ම අයත් ආදම්ගේ පාලම ජාතික උද්‍යානය සහ යාපනය දිස්ත්‍රික්කයට අයත් චුන්ඩිකුලම් ජාතික උද්‍යානය යන පාරිසරික කලාප ඊට අයත් ය.

මධ්‍යම පරිසර අධිකාරිය මෙරට ප්‍රධාන තෙත්බිම් ඇතුළු පාරිසරික වශයෙන් වැදගත් ස්ථාන 12ක් ගැසට් කර තිබෙන්නේ ඒවා ආරක්ෂා කර ගැනීම වෙනුවෙනි. මුතුරාජවෙල, තලංගම, ග්‍රෙගරි වැව, නකල්ස්, මරගල කඳු වැටි, බුලත්සිංහල වලව්වත්ත වතුරාන, බොල්ගොඩ, හන්තාන, මහනුවර වරාතැන්න හක්කිඳ, උකුවෙල පන්සලාතැන්න-මාඋස්සාව යන පාරිසරික ආරක්ෂක ප්‍රදේශ මෙන් ම හාලිඇල ජල මූලාශ්‍ර රක්ෂිතය හා මෑතකදී ප්‍රකාශයට පත් කළ මඩකලපුව ඒතාලෙයිකුලම් වැව පාරිසරික ආරක්ෂක ප්‍රදේශ එසේ ගැසට් කර ඇත. ඉදිරියේදී තෙත්බිම් ලෙස එක්වන නව පාරිසරික උරුමයන් ද මෙරට ජෛවීය සුන්දරත්වය තව තවත් තීව්‍ර කරවනු ඇත.


මන්නාරම වෙඩිතලතිව් ස්වාභාවික රක්ෂිතය


මන්නාරම ආදම්ගේ පාලම ජාතික උද්‍යානය


යාපනය චුන්ඩිකුලම් ජාතික උද්‍යානය


දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-